# මීදුම අතරින්

විවියන් ඒකනායක

අයිතිය කර්තෘ සතුය.

Copyright © Vivien Ekanayake

Literary Freeware: Not for Commercial Use.

This electronic version was prepared in 2001 by Vasantha Saparamadu <vsaparam@hotmail.com>.

Permission is granted to make and distribute verbatim copies of this publication provided the copyright notice and this permission notice are preserved on all copies and distribution is without fee.

# හැඳින්වීම

මගේ පළමු නිර්මාණය වන “මීදුම අතරින්” නම්වූ මෙම කෙටිකථා පොත ජීවිත අත්දැකීම් පසුබිම් කොට ඇති මනඃකල්පිත නිර්මාණයන් කීපයකි. මගේ ගුරු ජීවිතයේ සමහර අත්දැකීම් හා මෙකල සමාජ වටාපිටාවද පසුබිම් කරගෙන ලියා ඇති මේ කෙටිකථා දහය සාමාන්‍ය ගැමි ව්‍යවහාරික සරල බසින්ම ලියා ඇත්තේ කාගේත් රස වින්දනය සඳහාය. මෙය මාගේ පළමු නිර්මාණය බැවින් එහි ගුණදොස් විවේචනය පාඨක ඔබ සතුය.

කතුවරියගෙන්

1993.03.22

# පටුන


| | |
|---|---|
| මා අත වරද නැත | 1 |
| මීදුම අතරින් | 13 |
| කට උත්තරය | 19 |
| නංගියේ උඹ වෙනුවෙන් | 25 |
| මරණයේ සෙවනැලි | 39 |
| හොරෙක් | 47 |
| කොහේ ගියාදෝ | 53 |
| උමතුව | 61 |
| කවුද ඒ | 73 |
| අම්බර සීයා | 81 |

# මා අත වරද නැත

එදා සඳුදා දිනයකි. යම්තම් රතු ඉරට කලින් කාර්යාලයට යා හැකි වූයේ මිතුරකුගේ ලොරියක් හමුවූ නිසයි. වැල නොකැඩී වේගයෙන් එන ලිපිකරු මහතුන් හා මහත්මීන් දඩ බිඩ් ගා පඩිපෙළ නගිනුයේ ඉක්මනට පොත අත්සන් කිරීමටය. මා වාඩිවී සිටින තැනට විශ්‍රාම වැටුප් ශාඛාවට ඇතුළු වන දොරටුව පෙනේ. ඒ දොර ළඟ සිටියේ ජාතික ඇඳුමෙන් සැරසුණු තැන්පත් බවකින් යුතු ගුරු මහතෙකි. වටපිට බලමින් කිසිවක් නොදත් අයෙකු සේ හැසිරෙන මොහු විශ්‍රාම වැටුප් සකසා ගැනීමට පැමිණි අයෙකු විය හැක. එවිටම විශ්‍රාම වැටුප් ශාඛාවට ඇතුළු වූයේ එහි ලිපිකරුවෙකු වන උපුල්ය. ගුරු මහතා උපුල්ගෙන් යමක් ඇසීය. ඔහු මොකද්දෝ කියාගෙන යන්ට ගියේය. ගුරු මහතාද ඔහු පසු පස යනු දුටුවෙමි. මමද නිකමට මෙන් ඒ දෙසට ගියෙමි. “අර එහා මෙසෙ ඉන්න මහත්තය ආවම ඉල්ල ගන්ඩ” උපුල් කියයි.

මම උපුල් ළඟට කිට්ටු වී මෙසේ ඇසුවෙමි.

“මොකද බං”

“අන්න අර ගුරා පැන්ෂන් ගන්ඩ ඉල්ලුම් කළාලු. පෝරම වගයක් ගැන අහනව. මට බෑ ඕව කරන්ඩ. සිරිවිමලය ආවම දේවි”

“ඇයි බං ඉතින් උඹටත් පුළුවන් නොවැ දීපංකෝ”

“මේ කෑ නොගහ පලයං. ගුරා ටිකක් ඔහේ උන්නාවේ”

මම නැවතත් ගුරු මහතා දෙස බැලුවෙමි. මට කවදාක හෝ ඔහු දැක පුරුදු ගතියක් දැනුනි. ඔහු අතරමං වූවකු සේ බලා හිඳියි. මට ඔහුගේ අවශ්‍යතාවය ඉටුකර දී යැවීමට බැරිය. එය මට අයිති රාජකාරියක් නොවේ.

“වාඩිවෙලා ඉන්න. තව ටිකකින් ඒ මහත්තය ඒවි” මම කීවෙමි. ඔහු වාඩිවිය. මම මගේ මේසය වෙත ගියෙමි. මා වාඩිවී සිටින තැනට ඔහුගේ මුහුණ හොඳ හැටි පෙනේ. එහෙත් ඔහු කවුද කියා මට වැටහීමක් නැත. ටික වේලාවකට පසු ඔහුට අවශ්‍ය තැනැත්තා වන සිරිවිමල් පැමිණියේය. ගුරු මහතා ඔහු සමඟ

කථා කරනු පෙනුණි. පෝර්ම වගයක් ඔහුට ලැබුණි. එවිටම උපුල්ද ඒ අසලට පැමිණියේය. ගුරු මහතා පෝර්ම දෙස බලමින් මොනවාදෝ අසනු පෙනේ. උපුල්ගේ සරදම් සිනහ මැද තිදෙනා අතර සාකච්ඡාවකි. ටිකකින් ගුරු මහතා පෝර්ම ටිකත් රැගෙන සංසුන් ගමනින් පඩිපෙල බැස ගියේය.

මම නැවතත් උපුල් හා සිරිවිමල් අසලට ගියෙමි.

“මොකද බං උඹල හිනාවෙන්නේ”

“නෑ බං අර ගුරා පෝර්ම ඉල්ලගෙන විස්තරත් අහනව. මම කිව්ව ඕව කියවල බලල පුරවල ගෙනත් දෙන්ඩ කියල”

“ඇයි බං උපුල් ඒ මනුස්සය උඹලගෙන් අහන්නේ නැතුව වෙන කාගෙන් අහන්ඩද?”

“මේ කෑ නොගහ ඉඳින් බං. අපි ඉගෙන ගන්න කාලෙදි ඕකුන්ගෙන් කොච්චර ටොකු කාල ඇද්ද බං. ඉතින් දැන්වත් ඔවුන්ගෙන් ඒ පලිය ගන්ඩ ඕනෑ”

“ඇයි බං ඒ මහත්තය උඹට ටොකු ඇනල තියෙනවද?”

“නැතුවට මොකද? මොකාගෙන් හරි ඒ පලිය ගන්ඩ ඕනෑ”

“එහෙම කියන්ඩ එපා උපුල්. අද අපි මේ විධියටවත් ඉන්නේ කවුරු හරි ගුරුවරු අපට ටොකු ඇන ඇන හරි උගන්වපු හින්ද නේ”

“බණ කියන්නේ නැතුව පලයන් බං යන්ඩ. ඔය ගුරාල ගැන උඹට වැඩිය හොඳට මං දන්නව”

උපුල් සමඟ කථා කර වැඩක් නැත. මම මගේ මේසයට ගියෙමි. එම ගුරු මහතා ගැන මතකය අළුත් කර ගැනීමට මම වෙහෙස වීමි. මා ඉගෙනගත් විදුහල්වල සිටි අය ගැන සිහි කළෙමි. එහෙත් මට හරි වැටහීමක් නැත. ඇත්තටම ඔහු කවුද? ඒ මුහුණ මේ තරම් මගේ හදවතට සමීප වූයේ ඇයි? එසේ සිතමින් මම පයිල් එක ළඟට ගතිමි. එහෙත් වැඩක් කිරීමට තරම් මගේ සිත එකඟ නැත.

“හලෝ”

අවට මේස අසල වාඩිවී සිටි කමලා, සිතාරා, ජානකී සහ තවත් අය නැගිටගෙන දුවනු පෙනේ. තවත් අය කලබල වෙලාය. හේතුව කුමක්ද? ගිය සතියේ විවාහ වූ සමුදිකා පැමිණ ඇත. ඇය පොත අත්සන් කරන තැනට මිතුරියෝ දුවයති.

“යකෝ මේකිගේ ලස්සන”

“බැන්දට පස්සෙ නේ තරුණ වෙලා තියෙන්නේ”

“කෝ උඹේ ප්‍රේම රාජයා ඇවිල්ල ඇරලල ගියාද?”

මෙ විධියේ නොයෙකුත් ප්‍රශ්න නොයෙක් විධියේ සිනා හඬවල් හා මිතුරු මිතුරියන්ගේ ප්‍රීති ඝෝෂා අසමින් මමත් නැගිට සිටියෙමි. “සඳ පායලා වාගේ, සිරියාව දේ මූණේ” යන ගී පදය කියමින් උපුල්ද එතැනට දුව ආවේය. මිතුරියන් ඇය වටකරගෙනය. ඔවුන්ගේ සාරිවලින් ඇයව වැසී ඇත. ඒ සමගම පයිල් එක කිහිලි ගසාගත් විපුලද එතැනට විත් පුදුමයෙන් බලයි.

“මොනවද ඔතන සාරි ප්‍රදර්ශනයක්ද?”

“වැඩක් නෑ බං ඔය සාරි ඔක්කොම විකුණපු ඒව” සමන් කියයි. එවිට කවදත් කෙල්ලන්ට විහිලු කරන සුජිත් ගීතා සහ ලතා යන දෙදෙනාගේ සාරි පොටවල් අල්ලා එකට ගැට ගසා මෙසේ කියයි. “මේ තියෙන්නේ විකුණපු නැති සාරි දෙකක්” ඒ දෙදෙනා අවිවාහකය.

“අපෝ ඕවද? ඕවනම් නිකංවත් දෙන්ඩ හම්බ වෙන එකක් නැහැ” එසේ කීවේ සුමිත්ය. ඒ ඇසූ ගීතාත් ලතාත් සුමිත්ට ඔරවති. සුමිත් දත් විලිස්සා ඒ දෙදෙනාට සමච්චල් කරයි.

“හැටි විතරක් කටේ. කෙහෙල් ඇවරියක් වගේ” කියමින් ලතා බැන වදී.

“අනේ ඔය කෙලීට සැනසීමේ ඉන්ඩ දීපල්ල. මෙහේ ඉන්න පැය ගණන තමයි ඉතින් විවේකයක් ලැබෙන්නේ”

එසේ කීවේ විශ්‍රාම යාමට ආසන්න වයසේ පසුවන සිරිමාන්න මහතාය. එවිට සමුද්‍රිකා සමනලියක සේ දුවගොස් ඇගේ මේසය ලඟ වාඩිවූවාය. ඒත් ඇයට ගැලවීමක් නැත. අවට සිටින අයගේ සමච්චල් කෙළවරක් නැත. “මගේ අම්මේ සුවඳ” කමල් කියයි.

“සුවදේ බැරුව” ඒ සමන්ය.

“නහයට මූඩියක් ගහ ගනිල්ලකෝ” ඒ ගුණසේනය. සමුද්‍රිකාගේ මුහුණ ප්‍රීතියෙන් පිරිලාය.

“බලාපල්ලකෝ මූනේ සිරියාව. වෙනදට අපි විහිලු කලොත් කන්ඩ පනිනව” ඒ කීවේ අජිත්ය.

“සමුද්‍රිකා එවිට බොරු තරහවක් පෙන්වයි. “මචං තරහා ගියහම ඊටත් වඩා ලස්සනයි නේ” අජිත් නැවතත් කියයි.

මේ ආදි නොයෙකුත් කථා මැද කවුරුත් වැඩවල යෙදුනාහ. මමද මගේ

වැඩය කෙරෙහි සිත යොමු කළෙමි. එහෙත් මට මගේ මනස පාලනය කර ගත නොහැක. අර ගුරු මහතා පිළිබඳ මතකය මනස තුලින් එලියට එන්නට දඟලයි. මගේ සිත ගමේ පාසැලට යොමු විය. මා දැන් විවාහ වී මේ ගමේ ජීවත් වුවත් මගෙ උපන් ගම නිලාගමය. එය හද්ද පිටිසර ගමකි. මා ඉගෙනීම ලැබුවේ නිලාගම කණිටු විදුහලේය. මා පස්වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා කාලයේ රත්නසිරි මහතා නමින් ගුරු මහත්මයෙක් අපට ඉගැන්වීය. හරියටම මේ ගුරු මහතාගේ මුහුණත් ඒ වගේය. කාලය කෙතරම් ගෙවී ගියත් ඒ තරම් ප්‍රියංකර මුහුණක් ඇති ඒ මහතා මෙතරම් වෙනස් විය නොහැක. නැත නැත. එතරම් රූබර පින්බර කෙනෙකු මේ තරම් පිරිහීමකට පත් විය නොහැක. අනේ එහෙම නම් වෙන්ට එපා. අපෝ දෙවියනේ බැරි වෙලාවත් ආවේ ඒ මහතා නම්. දැන් මගේ හදවත හඩා වැටේ. චඃ මං නිකමට වත් විස්තර ඇහුවා නම් මට දැනගන්ඩ තිබුණා ඒ කවුද කියා. කමක් නැහැ ආයෙත් ඒවි නොවැ. එදාට කථා කරල බලනව.

කාර්යාලයෙන් පිටවී යන අතරද මා කල්පනා කළ් ඔහු ගැනය. පාරට එන විටම පැමිණි බසයට ගොඩවූ මා එහි පොල්ලේ එල්ලී ගේ ලඟින් බසින තුරුම මගේ මනසේ රැඳී සිටියේ අර ගුරු මහතාය. ගේට්ටුවෙන් ඇතුළු වන විටම සුපුරුදු පරිදි චූටි දියණිය ඉදිරියට දුව ආවාය. පිපුණු මලක් වැනි ඒ සියුමැලි මුහුණේ සිනහව දුටු විටය මට මතක් වූයේ ඇයට හැමදාම ගෙනෙන ටොපි එක අද අමතක වූ බව. මම ඇ වඩාගෙන මුහුණ සිම්බෙමි.

“දෙන්නකො ඉතින් කෝ ටොපි එක”

“අද හරි වැඩේනෙ උනේ දුව. අද කඩ ඔක්කොම වහල. මගෙ දුවට මම හෙට ටොපි දෙකක්ම ගෙනත් දෙන්නම්කො”

මගේ බොරුවෙන් ඇය සැනසුනත් මගේ සිතට නම් සැනසුමක් නොවීය.

“අම්මි කඩකාරයෝ හරි නරකයි”

“ඇයි දුව?”

“අද කඩ ඔක්කොම වහලලු. තාත්ති ටොපි ගෙනත් නැහැ”

ඒ ඇසූ නාලිකා මා දෙස බලා සිනාසුනේ මා කිව් බොරුව තේරුම් ගෙනය.

“ඒක තමයි දුව ඔය කඩකාරයො හරි නරකයි”

“හෙට කඩ අරියිද අම්මි”

“ඔව් දුව හෙට තාත්ති දුවට ටොපි ගෙනත් දෙයි”

රෑ කෑම කන විට පවා මා තුළ වූ මානසික විපර්යාසය එලෙසම විය.

නාලිකා මා දෙස විමසුම් ඇසින් බලා සිට "මොකද අද කන්තෝරුවේ මුකුත් කරදරයක්වත්ද?" කියා ඇසුවාය. "නෑ මුකුත් නෑ. අද මට ටිකක් මහන්සියි" යනුවෙන් පැවසූ මම ඉක්මණින් නින්දට ගියෙමි. එහෙත් මා ලද නින්දක් නැත. මම ඒ මළගිය අතීතය තුළින් මතකය අලුත් කර ගැනීමට වෙහෙසුනෙමි. වෙහෙස වී සිටි මට නින්ද ගොස් ඇතැයි සිතූ නාලිකාද නිහඬව නිදා ගත්තාය. මම බාල කාලය මෙනෙහි කළෙමි. නිලාගම පාසැලේ පස්වන ශ්‍රේණියේ ඉගැන්වූ රත්නසිරි මහතා, අපේ තාත්තාගේ අකල් මරණය, අම්මා දුක් විඳ අප ඇති දැඩි කළ සැටි, අම්මත් නංගිත් මමත් විඳි දුක් කරදර. මේ හැම දෙයක්ම මැදින් රත්නසිරි මහතාගේ තරුණ මුහුණ මට මවා ගත හැකි විය. ඒ මහතා විටෙක කරුණාවන්තය. තවත් විටෙක තරමක් සරුපරුෂය. එහෙත් උපුල් කිව්වා වාගේ ටොකු ඇන්නේ නැත. කරුණාව පෙන්විය යුතු අයට ඉතාම කරුණාවන්තය. ළමයිද එතුමාට ඉතාම ලැදිය. පිට පළාතකින් පැමිණි අයෙකු නිසා රත්නසිරි මහතා නැවතී සිටියේ ගම්මුළාදෑනි මහතාගේ නිවසේය. නමුත් ගම්මුළාදෑනි තැන මෙන් අහංකාර නොවීය. කාටත් පෙන්වූයේ සිනාමුසු මුහුණකි. සවස් වරුවේ හැමදාම අපට ඉගැන්වූයේ ශිෂ්‍යත්ව විභාගය නිසාය. මුදලට නොවේ. නොමිලේය. හවස පන්තිය හමාර වී යන විට අපි හැම දෙනාම එතුමා පසු පසින් යමු. දිනක් එවැනි දවසක මගදී රාජකාරි වැඩකට ගිය ගම්මුළාදෑනි මහතාද හමුවිය.

"ආ මහත්තය පංතිය ඉවර වෙලා යනව වාගේ. ඉන්ඩ මාත් එනව"

"රාළහාමි රාජකාරි වැඩකට ගිහින් වාගෙ"

"ඔව් මහත්තය මම මේ මහත්තයට කියන්ඩමයි හිටියෙ. මේ මඩ ගොහොරු කොල්ලන්ට හවසත් මොනවට උගන්වනවද?"

"රාළහාමි පහේ ශිෂ්‍යත්ව විභාගෙ තියෙනව නේ"

"මේකලට මොන විභාගද මහත්තය. ඇරත් විභාග පාස් කළයි කියල මේකල මොනව කරන්ඩද? එතකොට අපේ හේන් කුඹුරුවල වැඩ කරන්නේ කවුද" රත්නසිරි මහතා සිනාසෙයි.

"එක්කෙනෙක් දෙන්නෙක්වත් පාස් වුනොත් රාළහාමි ඒක පාසැලටත් නම්බුවක්නේ. ඇරත් මේ දුප්පත් ළමයින්ටත් යහපතක් නේ"

"හොඳයි හොඳයි මහත්තයගේ කැමැත්තක්"

මම අපේ කම්බි වැටෙන් පැන වත්තට ඇතුළු වූයෙමි. ගම්මුළාදෑනියා කෙතරම් නරකදැයි මගේ කුඩා සිතට දැනුනේ එදාය. පසුදා පාසැලට යාමට මම අපේ කම්බි වැටෙන් රිංගුවෙමි. මගේ කළිසම ඉංග්‍රීසි එල් අකුරක හැඩයට ඉරී ගියේය. මගේ සිරුර ඒ අතරින් පෙනෙන්නට විය. මම ආපසු ගෙදර දිව්වෙමි.

“අම්මේ”

“ඇයි පුතේ”

“මගෙ කලිසම කම්බියට පැටලිලා ඉරුණා දැන් මොකද කරන්නේ”

“ඔය සරොම් කැල්ල ඇඳගෙන ඕක ගලවපන්”

අම්මා ඒක මැසුවාය. හැම අතටම එලලා මැසීමට සෑහෙන කාලයක් ගත විය. එය හැඳගත් මම වේගයෙන් පාසැලට දිව්වෙමි. එහෙත් ප්‍රමාද වැඩිය. පාසැල පටන් ගෙනය. ප්‍රමාද වී එන අයට ගුරුවරු දඬුවම් කරති. මම පංතිය ළඟට ගියෙමි. රත්නසිරි මහතා හේතු විමසමින් ළමයින්ට දඬුවම් කරයි.

“ගුණසිරි මොකද පරක්කු උනේ”

“මහත්තය අම්මට උණ ගැනිල මමයි තේ වත් කළේ”

“යනවා ඇතුලට” ඔහුට දඬුවමක් දුන්නේ නැත.

“මෛත්‍රිපාල මොකද පරක්කු උනේ”

“මහත්තය … මට අද … ඇහැරුනේ පරක්කු වෙලා” ඔහුට පහර දෙකක් වැදුනි.

“ප්‍රේමසිරි මොකද … කවදාවත් නැතුව අද පරක්කු උනේ”

මම සියල්ල විස්තර කර කීවෙමි. ඉතා කරුණාවෙන් මා දෙස බැලූ රත්නසිරි මහතා මා දෙසත් මගේ කලිසම දෙසත් නැවතත් බලා මට පංතියට යාමට ඉඩ දුන්නේය. පංතිය පටන් ගැනුණි. අපි කියවීම් පොත් රැගෙන නැගිට සිටියෙමු. පිටුපස පෙලේ ළමයි මගේ කලිසම දැක සිනාසෙන්ට වූහ.

“ආයි අරුගේ කලිසම”

“අණ්ඩ මූට්ටුවා”

“උගෙ පස්ස පැත්ත බල්ල කාල”

“නෑ බං අළුත් මෝස්තරයක්”

මේ ආදි නොයෙකුත් දේ කියමින් පිටුපස පෙලේ ළමයි මට සිනාසෙති. මට හැඬුම් ආවේය. අකුරු නොපෙනෙන තරමට දෑසේ කඳුළු පිරුනේය. ළමයින් සිනාසෙනු දුටු ගුරුතුමා පිටිපස පෙල දෙස බලා සිටියේය. “මොකද ඔය ළමයි හිනාවෙන්නෙ”

“මහත්තය ඒ ළමයි ප්‍රේමසිරිට හිනාවෙනව කලිසමට අණ්ඩ දාලා කියල” එසේ කිවේ පද්මසිරිය. ගුරුතුමා වේවැලද අතැතිව පිටුපස පෙලට යයි. “ළමයෙකුගෙ අසරණකම දැකල කවදාවත් හිනාවෙන්ඩ එපා” එසේ කිවූ රත්නසිරි මහතා මුළු පේලියටම පහර දුන්නේය. එතුමා ළමයින්ට දඬුවම් කළේ මෙවැනි වැරදිවලට පමණි. ඊලඟ සතියේ ගමේ ගිය ඒ මහතා මට තෑග්ගක් ගෙනැවිත් තිබුණි. එදා පාසැල ඇරුණු පසු එතුමා මට කථා කර “මෙන්න ප්‍රේමසිරිට තෑග්ගක්” කියා මේසය මත තිබූ පාර්සලයක් මට දුන්නේය. මම පුදුමයෙන් හා බයෙන් එතුමා දෙස බැලුවෙමි. “ගන්න හෙට එනකොට ඇඳගෙන එන්න” කරුණාබරව පැවසූ එතුමාගේ මුහුණ දෙස බලා මම “ස්තුතියි” පැවසුවෙමි. හැකි තරම් වේගයෙන් ගෙදර දුවගොස් පාර්සලය අම්මාගේ අතට දුන්නෙමි. එය දිගහැර බැලූ අම්මාගේ දැස් ලොකු විය.

“කොහෙන්ද පුතේ”

“අපේ පංතියෙ මහත්තය දුන්න”

‘පිං සිද්ද වෙච්චාවේ”

නිල් කලිසමක් හා සුදු කමිසයක්. අම්මා මට එය අන්දා හැඩ වැඩ බැලුවාය. තාත්තා මැරුණාට පසු මේ තරම් අගේ ඇති ඇඳුමක් අඳින්ඩ නොලැබුණු බව මට මෙන්ම අම්මාටත් සිතෙන්ට ඇති. මම එය ගලවා සිඹිමෙමි. බොහෝ කාලයක් මා පාසැලටත් වෙනත් ගමන් වලටත් ඇන්දේ එම ඇඳුම් කට්ටලයයි.

දිනක් මා පාසැලේදී ක්ලාන්ත වී බිම ඇද වැටී ඇත. ගුරුතුමා මා ඔසවා බංකුව මත නිදි කරවා පවන් සැලුවේලු. පසුව මට පියවි සිහිය ලැබුණි.

“ඔය ළමය මොනවද උදේට කෑවේ”

මට පිළිතුරු නැත. “මුකුත් කෑවේ නැද්ද?”

මම කෙසේ ඇත්ත පවසම්ද. තාත්තා ජීවත්ව සිටි කාලයේ අප මෙසේ බඩගිනි උසුලා නැති බව සිහිවී මට හැඬුම් ආවේය.

“මහත්තය එයාල අද උදේට කැවෙ නෑ” එසේ කීවේ අල්ලපු ගෙදර ජයපාලය. ඒ අය අප ගැන හොඳින් දනිති. සමහර දාට ජයපාලලාගේ අම්මා අපට යම් යම් දේවල් කෑමට දෙයි.

ටික වේලාවකින් ගුරුතුමා කඩයට යැවූ ළමයා මොනවාදෝ රැගෙන ආවේය.

“ප්‍රේමසිරි මෙහෙ එන්ඩ. අර කාමරේට ගිහින් මේව කන්ඩ”

ඒ පාර්සලයේ තිබුණේ බනිස් හා කෙසෙල්ය. ඒ සමගම තේ එකක්ද

ලැබුණි. අම්මා සහ නංගි මතක් වී මට තවත් කඳුළු ආවේය. ඒත් මම ඒ කැම කැවෙමි. නංගිට දෙන්ට කෙසෙල් ගෙඩියක් සාක්කුවේ දමා ගතිමි. තවත් දිනක හිසරදය සෑදුණු ලමයෙකුට රත්නසිරි මහතා කඩයෙන් ඩිස්ප්‍රින් ගෙන්වා දුන්නේය. වමනය කළ තවත් ලමයකු වෛද්‍යවරයකු ළඟට යවා ප්‍රතිකාර ලබා දුන්නේය. මෙලෙස පංතියේ සෑම ලමයකුටම ආදරයෙන් සැලකූ ඒ මහතා ඉතාම මහන්සි වී ශිෂ්‍යත්වය විභාගයට ඉගැන්වීය. මාත් සමග අපේ පන්තියේ ලමයි හය දෙනෙක් ඉන් සමත් වී නගරයේ මධ්‍ය මහා විද්‍යාලයට යාමට සුදුසුකම් ලැබූහ. එහෙත් මට පමණක් එහි යා නොහැක. කුලී වැඩ කර අපව ජීවත් කරවන අම්මාට මාව එහි යැවීමට අවශ්‍ය මූලික වියදම්වත් දරන්නට පුළුවනද? අම්මත් මමත් අසරණ වීමු. අම්මා හැඬුවාය. මම නොහැඬුවෙමි. “කමක් නෑ අම්මෙ මම ගමේ ඉස්කෝලෙටම යන්නම්”

පසුදින පාසැලේදී ගුරු මහතා මා ඇමතීය.

“දැන් ඉතින් ලබන වාරෙ ඉඳල ප්‍රේමසිරිත් ටවුමෙ ඉස්කෝලෙට යනවනේ”

“නෑ මහත්තය”

“ඇයි ඒ”

“අපේ අම්මට සල්ලි නෑ මහත්තය”

ටික දිනකට පසු විදුහල්පති තුමා මා කැඳවා මට ලියුමක් දී එය අම්මාට දෙන ලෙස කීය. අම්මා එය කියවා බලා බයෙන් මෙන් මා දෙස බැලීය. “ඇයි අම්මේ”

“උඹ මුකුත් වරදක් කළාද පුතේ? ලොකු මහත්තය මට එන්ඩ කියල එවල තියෙන්නෙ”

“අනේ නෑ අම්මේ. මං මුකුත් කළේ නැහැ”

අම්මා ගමනක් යාමට අඳින එකම හැට්ටය හා චීත්තය එවේලේම සේදුවාය. පසුදා උදේ එය වේලී තිබුණි. අම්මා ඒ ඇඳුම් වලින් සැරසී අසරණියක ලෙස විදුහලට යන සැටි බලා මම දුක් වූයෙමි. මමත් අම්මා සමග ගොස් මගේ පංතියට ගියෙමි. ටික වේලාවකට පසු අම්මා විදුහල්පති තුමාගේ කාර්යාලයෙන් පිටවී යනවා මම දුටුවෙමි. අම්මාගේ මුහුණ සතුටින් පිරී තිබුණි. පාසැල ඇරෙන තුරු නොඉවසිලිමත්ව සිටි මා ගෙදර දිව්වේ පියාඹාගෙන වගේය. අම්මා මග බලා සිටියාය. “අම්මේ ලොකු මහත්තය මොකද කිව්වේ”

“පුතාව ටවුමෙ ඉස්කෝලෙට යවන්ඩලු. සේරම දේවල් පුතාගෙ පංතියෙ මහත්තය ලෑස්ති කරල දෙනව කිව්වලු”

ඒ අනුව ඇඳුම් පැළඳුම් හා අවශ්‍ය වෙනත් සෑම දේම ඒ මහතාගෙන්ම ලැබුණි. මා කැටුව ගියේද රත්නසිරි මහතාය. මා පාසැලේ දක්ෂම සිසුවා බවත් හොඳම

සිසුවා බවත් එතුමා විසින් එහි විදුහල්පති තුමාටද පවසන ලදී. ඒ අනුව එම විදුහලේ ගුරු මහතුන්ගේද ආදරයට මා ලක්විය. ලැබෙන ශිෂ්‍යත්ව ආධාර වලින් මගේ බෝඩිං ගාස්තු ඇතුළු අනිකුත් දේවල්ද කෙරුණි. තවත් වසරක් පමණ යන තුරු රත්නසිරි මහතාගෙන් මට නොයෙක් උදව් උපකාර ලැබුණි. ඉන්පසු ඒ මහතා මාරුවී ගිය බව මම අම්මාගෙන් දැන ගතිමි. මේ අතර අම්මා තව තවත් ලෙඩ වූවාය. අම්මාගේ එකම සහෝදරයා වූ පින්සිරි මාමාගේ පිහිටෙන් අපේ වැඩ කටයුතු යම්තම් දුරට කරගත හැකි විය. මම පංතියෙන් පංතිය විශිෂ්ඨ ලෙස සමත් වෙමින් උසස් පෙල විභාගයෙන්ද ඉතා උසස් ලෙස සමත් වීමි. එහෙත් මම විශ්ව විද්‍යාලයට නොගියෙමි. මාමා අප වෙනුවෙන් කරන මේ සේවය හොඳටම ඇත. ඔහුට තවත් බර පැටවිය නොහැක. මට මේ රැකියාව ලබා ගැනීමටද උදව් කළේ මාමාය. රත්නසිරි මහතා පිළිබඳ මතකය මේ ගතවූ විසි අවුරුදු කාළය තුල ක්‍රමයෙන් මැකී ගියේය. මේ කාලය තුල අම්මා ලෙඩ වී මිය යාමත් මාමාගේ උදව්වෙන් නංගී විවාහ කර දී ඊට පසු මා විවාහ වී නාලිකාගෙන් මට දායාද ලෙස ලැබුණු මේ නිවසේ පදිංචියට ආ සැටිත් චිත්‍රපටයක් සේ මා ඉදිරියේ මැවී පෙනෙන්ට විය. මට නින්ද ගියේ කොයි වේලේදැයි මම නොදනිමි. “මේ මේ ප්‍රේමසිරි නැගිටින්න. අද කන්තෝරු යන්නේ නැද්ද? නාලිකාගේ හඬින් මම හදිසියේ අවදි වූයෙමි. මා ඉක්මණින් සූදානම් වී කාර්යාලයට ගියේ අර ගුරු මහතා අදවත් ඒවිදැයි සිතමිනි. දින කීපයක් ගතවූ නමුත් ඔහු නොපැමිණියේය. මා නිවාඩු නොදමා දිනපතාම කාර්යාලයට ගියේ ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවෙනි.

ඊළඟ දිනයකද පුරුදු පරිදි කාර්යාලයේ වැඩ ඇරඹුනේ මිතුරන්ගේ සතුටු සාමිච්චියෙනි. කවදත් කටහැකර වචන දොඩන උපුල් සමරේ ළඟ සිටගෙන කියවන දේවල් මටද ඇසේ.

“මොකක්ද උපුල් කිව්වෙ?” රංජිත් අසයි.

“මං ගියා බං අපේ පුතාව ඉස්කෝලෙට බාර දෙන්ඩ කතා කර ගන්ඩ. මහ ගුරා කියනව පුටුවකුත් ඕනැලු. ළමයින්ට පුටු මදිලු”

“ඉතින් උඹ මොනවද කිව්වෙ”

“ඉතිං මං උන්දට කිව්ව හොල්මං වෙන්ඩ”

“ඉතිං උඹ කියාපු දේ කියාපන්කෝ”

“මං කිව්වා ලොකු මහත්තයො මගේ නෝනට ඔය පුතා හම්බ වෙනකොට පුතා විතරමයි හම්බ වුනේ පුටුවක් හම්බ උනේ නෑ කියල” ඒ ඇසූ හැම දෙනාම හඬ නගා සිනාසුනහ.

“ඉතින් ලොක්ක මොකද කිව්වේ” සමරේ අසයි.

“එතකොටම ලොකු කොල්ලෙක් ඔපිස් එක ඇතුලේ ඉඳල අතින් කට වහගෙන එලියට දිව්ව. ලොක්ක ඒ ලමය දිහා බලාගෙන ඉඳල මට කිව්වා මහත්තය මේක කෝලං මඩුවක් නෙමේ. ලමයි ඉන්න තැනක් අපි වැදගත් විධියට කතා කරමු කියල. ඒ වෙලාවෙ තවත් ගුරෙක් එතන උන්න. මිනිහ හරි නිහතමාන පාටයි. මිනිහ බොහොම සුහද විධියට මා එක්ක හිනාවෙලා මෙහෙම කිව්ව. ‘මහත්තය මේක ඔයාට විතරක් කියපු දෙයක් නෙමේ. දැන් අපට රජයෙන් කියල තියෙන්නෙත් දෙමව්පිය සහයෝගයෙන් පාසැලේ අඩුපාඩු සපයා ගන්ඩ කියල. ඉතින් අනිත් අය නම් කැමති උනා.’ ඒ සැරේ ලොක්කත් ටිකක් හිනාවෙලා මගෙ ඔලුවේ ඉඳල කකුල් දෙකටම යනකං බලල ඇහැව්ව ඉතින් මහත්තය මොකද කියන්නේ කියල. මටත් හිනා ගියා. මමත් ඉතින් කැමතියි කිව්වා. එතකොට උන් දෙන්නම මා එක්ක හොඳට හිනා උනා. උන් හිතන්ඩ ඇති මං පිස්සෙක් කියල”

“ඔව් ඉතින් උඹ පිස්ස බව මෙච්චර කල් දැනගෙන හිටියෙ අපි විතරයි දැන් ඒ ගුරුවරුත් දැනගන්ඩ ඇති උඹේ හැටි”

“කොහේ ගියත් ඉතින් බාල්දියක් පෙරලල එන එක මුගෙ සිරිතනේ”

“ඊටත් වඩා ජොලි වැඩේ බං අර ඒ වෙලාවෙ කට වහගෙන දිව්ව කොල්ල ක්‍රීඩා පිට්ටනියේ ඉඳල තවත් කොල්ලන්ට මාව පෙන්නල මොනවාදෝ කිව්ව. උන් ඔක්කොම ‘බක බක’ ගාල හිනාවුනා”

අපි කවුරුත් උපුල්ගේ විකට කථා අසමින් වැඩ පටන් ගතිමු. මට එදා ගුරු මාරු සම්බන්ධ ලියවිලි කීපයක් අධ්‍යක්ෂක ලවා අනුමත කරවා ගැනීමට තිබුණි. මම ඒවා රැගෙන අධ්‍යක්ෂකගේ කාමරයට ගියෙමි. දෙය්යනේ මේ අර ගුරු මහතා නේද? ඔහු අධ්‍යක්ෂක ඉදිරියේ පුටුවේ වාඩිවී සුහද කතාබහක යෙදී සිටී. අධ්‍යක්ෂක වරයා මා අත වූ ලියවිලි රැගෙන පෙරළන අතර මගේ අවධානය යොමු වූයේ ගුරු මහතා දෙසටය. ඔහුට නම් මා ගැන කිසි මතකයක් නැති පාටයි. මටත් ඔහු හඳුනාගත නොහැක. ඔහුගේ දෑත අධ්‍යක්ෂකගේ මේසය මත තබාගෙන සිටී. එවිට එකවරම මගේ ඇස යොමු වූයේ එතුමාගේ පිටි අත්ල දෙසටය. ඒ අතේ අපි පුංචි කාලයේදී දැක පුරුදු ඒ දිගටි උපන් ලපය එලෙසම විය. මගේ පපුව ‘ඩිග් ඩිග්’ ගා ගැහෙන්ට විය. අපොයි දෙවියනේ මේ රත්නසිරි මහතා නේන්නම්. මගේ හදවත තුළ පවතින වෙනස සඟවා ගැනීමට මම දෑස වෙන අතකට යොමු කලෙමි. අධ්‍යක්ෂක විසින් අනුමත කළ ලියවිලි මට දෙන අතරම ඒ දෙදෙනාගේ කථාවෙන් කොටසක් ඇසුණි. “ඉතින් මිස්ට රත්නසිරිට මතකද ඒ කාලේ අපිත් එක්ක ඉගෙන ගත්තු” යනුවෙන් ඒ ටික පමණක් ඇසෙන විටම මම කාමරයෙන් පිටවූයෙමි. අපොයි මං වගේ ගුණමකුවෙක්. එදා ඒ ආවේ රත්නසිරි මහතා බව මට නොදැනුනේ ඇයි. මං එදා ඒ මහතා සමග වචනයක්වත් කථා කළානම් කොච්චර හොඳද? මට කර ඇති උපකාර වලට කළගුණ සැලකීමට තිබුණු එකම අවස්ථාව මා නැති කර ගත්තේ ඇයි. මා එතරම් ගුණමකු වූවා නේද? මගේ හදවත හඬා වැලපෙයි. දැන්නම් මට කළ හැකි දෙයක් නැත. මා එදා ක්‍රියා

කළ හැටියට දැන්නම් හඳුනා නොගත්තාට කමක් නැත. මෙසේ සිතමින් ව්‍යාකූල මනසින් මගේ මේසය වෙත පියමං කරද්දී මිසිස් ජාගොඩගේ ඇහේ නොහැපී බේරුනේ අනූනමයෙනි. ඇගේ ඇහේ හැප්පුනා නම් මට පුප්පන හැටි දැක ගන්ඩ තිබුණි. මේසය ළඟට ගිය මම උඩ තට්ටුවේ සිට පහත බැලුවෙමි. එවිට මා දුටුවේ ගේට්ටුවෙන් පිටවී යන රත්නසිරි මහතාය.

කිසිවක් සිතා ගත නොහැකි මම එලෙසම ටික වේලාවක් සිටියෙමි. එවිට මට පෙනුනේ අධ්‍යක්ෂකගේ කාමරයට යන සිරිවිමල්ය. ඔහු යන්නට ඇත්තේ අධ්‍යක්ෂකගේ ඇරයුමක් නිසා වෙන්ට ඇති. ඔහු එනතුරු මම බලා සිටියෙමි. ටික වේලාවකින් පැමිණි ඔහු රාජකාරි වැඩක උනන්දුවෙන් යෙදී සිටිනු මට පෙනුනි. උපුල්ද ඔහු අසලට යනවා දුටු මම මගේ සිත තුළ පවතින ව්‍යාකූලතාවය නිරවුල් කර ගැනීමේ අටියෙන් ඒ දෙසට ගියෙමි. දෙදෙනාගේ කථාවට සවන් දෙමින් ටික වේලාවක් සිටියෙමි.

“මොකක්ද සිරිවිමල් මිනිහගෙ නම කිව්වේ?” උපුල් අසයි.

“ඩී. ඇම්. රත්නසිරි. ඒ කියන්නේ දිසානායක මුදියන්සේලාගේ රත්නසිරි”

“මිනිහගෙ පෝර්ම ටිකත් බොසා ඉල්ලගෙන මට මේ දැන් දුන්න”

“එහෙනම් බොසාගෙම කෙනෙක් වෙන්ඩ ඇති” උපුල් කියයි.

“ඔව් බං බොසාගෙම කෙනෙක්ලු. ඉගෙන ගත්තෙත් එකටලු. ඉතින් මට බොසා අඬගහල කිව්ව මිස්ට සිරිවිමල් මේ වැඩේ ප්‍රමාද නොකර මගේම වැඩක් කියල හිතාගෙන කරල දෙන්න ඕන කියල. ඒක කිව්වෙ හරියට බොසා මගෙන් උදව්වක් ඉල්ලන විධියට ඉතින් ඉක්මනින් කරල නොදී කොහොමද?”

සියල්ල අසා සිටි මම ඔවුන්ගෙන් මෙසේ ඇසුවෙමි.

“උඹල ඔය කියන්නේ කවුරු ගැනද”

“ආ අර එක දවසක් ආපු ගුරා උඹටත් මතක ඇති. ඇයි උඹත් එදා මට කිව්වේ අපි ටොකු කකා හරි ඉගෙන ගත්තු හින්දයි අද මෙහෙම ඉන්නෙ කියල” උපුල් උත්තර දුන්නේය.

“උඹල දන්නෙ නෑ උපුල් ඒ මහත්තය ගැන. ඒ මහත්තය ළමයින්ට ටොකු ඇනල ඉගැන්නුවෙ නැහැ. මේ කාලෙ ඔය එක එක පත්තරවල ‘ජරාව කන ගුරුවරු’ කියල කොයිතරම් ලිපි පල වුනත් ඔය මහත්තය එහෙම කෙනෙක් නෙවේ. අතින් වියදම් කරලයි ළමයින්ට ඉගැන්නුවෙ. දක්ෂ ළමයෙක් දැක්කොත් ඒ ළමයව කොහොම හරි පුළුවන් තරම් ඉහලම පඩියට නග්ගල තමයි එයා බිමට බහින්නේ” එසේ කිවූ මම මගේ මුළු ජීවිත කථාවම දෙදෙනාට විස්තර කර කීවෙමි. එය කියා අවසන් වන විට මගේ දෑසේ පිරී තිබුණු කඳුළු දුටු උපුල්

මට මෙහෙම කිව්ව. “ඉතිං මචං උඹ එදා අපට කිව්ව නම් ඔය විස්තර අපි එක සුමානෙන් එයාගේ වැඩ ටික කරල දෙනවනේ, නේද සිරිවිමල්?”

“ඒක තමයි උඹ අපට කියන්ඩ එපායැ” සිරිවිමල්ද කීය.

“මට හරියටම ඒ මහත්තයව අඳුනගන්ඩ ලැබුණේ අදයි” කිවූ මම මගේ මළගිය මතකයට සිතින් ශාප කරමින් එතැනින් පිටවූයෙමි.

# මීදුම අතරින්

ඩිපෝවෙන් පිටවූ බස්රථ පෝලිමට එයි. ගෙදරක ගුවන් විදුලි යන්ත්‍රයකින් විකාශනය වන ගීතයක වචන වරින් වර ඇසේ. වාහනවල ශබ්දය නිසා මුළු ගීතයම අසා ගැනීම අපහසුය. 'මුහුදින් අහලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා' පැහැදිලිව ඇසුනේ එපමණය. බස්රථ වල සෝෂාව නිසා ඉතුරු කොටස් නොඇසුණි. අපට කිසි දිනක උදාගී ඇසීමට වේලාවක් නැත. නියමිත වේලාවට පාරේ සිටිය යුතුය. 'හබරණ' බසය වැරදුනොත් පාසැල් යාමට වෙනත් ක්‍රමයක් නැත.

බසය එනතුරු අනුරාධපුර සතොස ගබඩාව ඉදිරිපිට සිටින අපට ඊට පිටුපසින් ක්‍රියාත්මක වන දුම්රිය එන්ජින් වල ශබ්දය මහත් පීඩාවකි. පෙර දින කොළඹින් පැමිණි ලොරි කීපයක් සතොස ගබඩාව ඉදිරියේ නතර කර ඇත. ඒ අවටින් හමා එන සුළඟ සතොසට කරවල ගෙනත් බව හඟවයි. විදුලි සැර වැදුණු වවුලෙකු කම්බි අතර දැවටී ඇත. 'වව්නියාව', 'මැදවච්චිය', 'මිහින්තලේ', 'කහටගස්දිගිලිය' යනුවෙන් එකම අතට ගමන් ගන්නා බස් පෙලක අලවා ඇති බෝඩ් දෙස අපේ නෙත් යොමුවේ.

"ඔක්කොම යනව හබරණ බස් එක තමයි නැත්තේ" මගියෙක් පවසයි. 'මීගමුව සීඝ්‍රගාමි', 'තලාව', 'නෙළුම්කුලම', 'ගුවන් තොටුපල' යන නම් සඳහන් තවත් බස් පෙලක් අනිත් පාරට හරවයි. 'හබරණ' ඒ සමගම අපේ නෙත් වලට යොමුවේ. "ඔන්න එනව යාම්තම්" යනුවෙන් මගියෙක් පවසයි. සැමදෙනාම කලබල වූ බවත් බලාපොරොත්තු ඉටුවූ බවත් මුහුණු වලින් හඟවමින් බසය නවත්වන විටම දොරටුව අබියස සිටීමට පොරකති. කවුරුත් නැග ගනිති. බසය ඉදිරියට ඇදේ.

ගස් අතරින් පෙනෙන මීදුම නිසා ඉන් එහා නැරඹීම අපහසුය. සීත සුළඟ පීඩාවක් ලෙස සලකන මගියෙකු ගේ අතින් බසයේ වීදුරු කවුළුව වැසේ. මිරිස් හේනකට වතුර දමන කතකගේ මුහුණේ අනාගත බලාපොරොත්තු රැඳී ඇත. ගොවියන් ගේ හේන් දකින කාට වුවත් හැඟෙන්නේ ඔවුන් ස්වයංපෝෂිත බවය. එහෙත් ඔවුන් සතු එකම ධනය එය පමණක්ම බැව් කවුරුත් නොදනිති. තරුණ සිසු දැරියන්ට ටිකට් කඩන කොන්දොස්තරගේ මුහුණ අමුතුම දීප්තියකින්

බබලයි. කුඩා ළමයි දෙදෙනෙක් බසයට අත දිගු කරති. බසය නැවතු රියදුරු ඔවුන් දෙස අනුකම්පාවෙන් බලනු පෙනේ. ඒ කුඩා දරුවන් දුටු මගේ සිත අතීතය කරා ඇදී ගියේය. මීට අවුරුදු කීපයකට පෙර මා ඉගැන්වූ වෙනත් විදුහලක බාලාංශ පංතියේ සිටි දරු දැරියන් මගේ මතකයට නැගුණි. “නෝනා මහත්තයා”, “මහත්තයා” යනුවෙන් ඔවුහු අප අමතති. “මිස්”, “සර්” යන වචනවලට වඩා මේ ගැමි දරුවන්ගේ මුවින් පිටවන ඒ ඇමතුම් වල අමුතුම මිහිරක් ඇත. සමහර කුඩා ළමයින් නෝනා මහත්වරුන්ටත් “මහත්තයා” කියා අමතන අවස්ථා ඇත. එය අපට අමුත්තක් නොවේ.

බාලාංශ ළමුන්ගේ කථාවලට සවන්දීම විනෝදයක් ලෙස සලකන මම කල්වේලා ඇතුව ගුරු නිවාසයෙන් පිටවී පංතිය දෙසට යමි. එවිට හොඳ රසවත් වදන් ඇසිය හැක. දිනක් එවැනි අවස්ථාවක “මහත්තය මේං අපි ගෙනාව” කියමින් තණකොළ රොඩු ටිකක් මිට මොලවාගෙන ආ පුංචි සුනිල් හොඳක් ඇසීමේ බලාපොරොත්තුවෙන් මා දෙස බලා සිටියේය. කාරණය වටහා ගත් මම “හොඳ ළමයා” යයි පැවැසුවෙමි. සතුටින් ඉපිලී පංතියට දුවගිය ඔහු වාඩිවී නැවතත් මා දෙස බලා නිර්ව්‍යාජ සිනහවක් පෑවේය. කකුලේ ආබාධයකට බැලතණ ටිකක් සොයා ගෙනෙන ලෙස ඔහුගේ අයියාට මා නියම කරනු අසා සිටි ඒ පුංචි සුනිල් ඔහුගේ අයියාට කලින් මට ඒ ගෙනත් දුන්නේ බැලතණ යයි සිතා වෙනත් තණකොළ රොඩු ටිකකි.

“මහත්තය අපි ගෙදරදි ගල් කැට සියයක් ගණන් කළා”

දඩ දඩ දඩ යන අනුකරණයෙන් ගල් කැට ටික මගේ මේසය ළඟ හලමින් එසේ කීවේ රන් මැණිකාය. ඈ ලොකු ජයක් ලැබූ ලෙසින් මගේ මුහුණ බැලුවාය.

“රන් මැණිකා හරි හොඳයි” මම පැවසීමි.

“මහත්තය අපිත් ගෙනාව” ඒ අනුර සිඟිත්තාගේ හඬය.

“කෝ බලන්ඩ ඔයත් ගල් කැට සීයක් ගැන්නද?”

“ඔව්” යනුවෙන් ඔහු ඔලුවෙනුත් කටිනුත් පවසයි.

“මහත්තයා ... මහත්තයා” ඒ නවරත්නගේ කටහඬය.

“මොකද නවරත්න කෑ ගහන්නේ”

“මහත්තය ටිකිරි බණ්ඩ මගෙ ගල් ටික උදුර ගත්තා”

“බොරු මහත්තය මේ මං ගෙනා ගල්”

“මහත්තය මේව අපේ අයිය එකතු කරල දීපු ගල්”

“නෑ නෑ මහත්තය එයා කියන්නේ බොරු එයාට අයියල නෑ” බොරු කියූ සිසුවා හෙමින් හෙමින් පස්සට යයි.

“මහත්තය” ඒ රත්නසිරිගේ හඬය. “ඇයි?” පිළිතුරු දීම වෙනුවට ඔහු කළේ ලස්සන දසන් පෙන්වා සිනාසීමය. ගල් කැට නොගෙනා නිසා මා අමනාප දැයි බැලීමට ඔහු එසේ කරන්නට ඇත.

ඈත සිට මා දෙස බලමින් එන රුවන් බණ්ඩාර එක් අතකින් කලිසමත් අනිත් අතින් පොත් බෑගයත් අල්ලාගෙන මා ළඟට විත් නැවතුණි.

“මහත්තය මගෙ කලිසමේ පටිය කැඩිල”

මම ඔහුට ලංචි කලිසමට කටුවක් ගැසීමි. ඊට කෙළෙහි ගුණ සැලකීමට මෙන් පස්ස බලමින් මා සමග සිනාසෙමින් යන ඔහු පුටුවක හැපී වැටෙන්ට ගොස් යම්තම් බේරුනේය.

“ටාං ටාං ටාං ටාං ටාං”

පාසැල පටන් ගැනීමට සීනුව නාද වන විටම ළමෝ ඉක්මණින් පෙළ ගැසෙති. ඒ පන්සිල් ගැනීමටය. මුළු පාසැලම නිහඬය. සිසුන්ගේ පා ගැටෙන හඬ පමණක් ඇසේ. ඔවුහු බුදු මැදුර දෙසට යති. “සා ... දු” සිසුන්ගේ සාදුකාර නාදය පරිසරයේ පාලුව මකා දමයි. ඒ සමගම පොඩි සාදුගේ හඬද ඇසේ. එම පිළිවෙත් අවසන්ව පංතියට එන ලමෝ අපට සුබපතා වැඩ අරඹති. පෙරදින ගෙදරදී කළ වැඩ පෙන්වීමට කුඩා දරු දැරියෝ පෝලිමේ එති. “මේ මහත්තය අපි ලියපුව” කියමින් සිසුවෙක් ගල්ලෑල්ල පෙන්වයි. මම පාට හුණු කැබැල්ලකින් ‘හරි’ ලකුණ දමමි. එවිට ඔවුන්ගේ මුහුණ ප්‍රබෝධමත් වේ.

“මෙං මහත්තය අපේ ගල්ලෑල්ල” එහි කිසිවක් ලියා නැත. එය අළුත් එකක් නිසා එය මට පෙන්වීමට ඔහුට උවමනා වී ඇත. “චටස් පටස්” ඒ අල්ලපු පංතියේ මහත්මයාගේ වේවැල් පහර වැදෙන හඬය. කවුරුත් ඒ දෙස බලති. වේවැල් පහර කෑ ධර්මසිරි කවදත් ළමයින්ට රිදවයි. පහර දෙයි. සමහර විට පැන්සලෙන් අනියි. මේ වැරදි වැඩ නිසා අඩු තරමින් දිනකට වරක්වත් ඔහු වේවැල් පහර ලබයි. අනුකම්පාවක් බලාපොරොත්තුවෙන් ඔහු හඬමින් මා දෙස බලයි. මම නුදුටුවා සේ මගේ වැඩවල යෙදෙමි. අනික් පංතියේ ගුණවර්ධන මහත්මයා කථාන්තරයක් උගන්වනු ඇසේ. ඒ අතර පිටුපස පෙළේ සිසුවෙකු කුමක් හෝ වෙන වැඩක යෙදේ. “චන්ද්‍රසේන මොකද කරන්නේ” ගුරු මහතා අසයි. එහෙත් උත්තරයක් නැත. “චන්ද්‍රසේන මෙහාට එනවා” ඔහු සෙලවුනේවත් නැත. කුමක්දැයි ප්‍රශ්න කරන්නාක් වැනි ප්‍රශ්නාංකය මුහුණෙහි රඳවා ගත් ගුරු මහතා ඔහු දෙසට ගමන් කරනු පෙනේ. “පර්වතය තමා දෙසට නොඇදෙනු දුටු එතුමා පර්වතය දෙසට ඇදුනේය” යනුවෙන් පොතක සඳහන් වැකියක් මට සිහිවිය.

චන්ද්‍රසේන ළඟ නැවතුණු ගුරු මහතා ඇස් එළියට පනින්නට තරම් විශාල

කර මා දෙස බැලීය.

“නෝන මහත්තය”

“ඇයි”

“අනේ මට පුළුවන් උදව්වක් කරන්න” එසේ කී ඔහු නැවතුනේ නැත. යන්ට ගියේය. මා උදව් කරන්නේ කාටද? කුමටද? පිළිතුරු සෙවීමට මම චන්ද්‍රසේන සිටි තැනට ගියෙමි. ඔහු බයාදු බැල්මක් මා දෙස හෙලීය. “ඊ ... යි ... ඊ ... යි” කියමින් දෙපස සිටි ළමෝ පුටු දෙපසට ඇදගත්හ. මට කාරණය වැටහුනේ එවිටය. මවැනි අවස්ථා වලටද ගුරුවරයා මුහුණ දිය යුතුය. කුඩා දරුවා වෙන කුමක් කරන්ටද? අවශ්‍යතාවයේ හැටියට ඔහු ක්‍රියාකර ඇත. වැසිකිලිය වෙනුවට ඔහු පාවිච්චි කර ඇත්තේ පුටුවය. ඉහල පංතියක සිටින ඔහුගේ අයියා කෙනෙකු කැඳවූ මම පුටුවත් චන්ද්‍රසේනත් පිරිසිදු කිරීමේ කාර්යය ඔහුට බාර දුනිමි. නිසි පරිදි එම කාර්යය ඉටුකල චන්ද්‍රසේනගේ අයියාගේ මුහුණ කෝපයෙන් දැල්වෙමින් තිබුණි. “අද යම ගෙදර තෝව හමගහනව”

ඒ ඔහු මල්ලිට තරවටු කළ සැටිය. එය ඇසුණු මට හිනහ නොවී සිටිය නොහැකි විය. මම ඔහු ඇමතුවෙමි.

“මොකක්ද ඔය ළමය කිව්වේ”

“මුකුත් නෑ නෝන මහත්තය”

“මට ඇහුණ මොනවද කියනව”

අතේ ඇඟිලි මිරිකමින් සිනාසුණු ඔහු දුවන්ට සැරසුණි. “මල්ලිට එහෙම ගහන්නේ නෑ ඇහුනද” තවත් වරක් මල්ලි දෙස රවා බැලූ ඔහු බිම බලාගෙන යන්ට ගියේය.

හදිසියේ ගැසූ ‘බ්‍රේක්’ පහරින් සිතුවිලි වලින් මිදුණු මට මා සිටින්නේ බසය තුළ බව හැඟුණි. හදිසිය කුමක්දැයි බැලීමට බසයෙන් පිටත බැලුවෙමි. පාර හරහා පැන්න මී හරක් රංචුව බසයේ ගමනට බාධාවක් වී ඇත. ඔවුන් යනතුරු බසය නවතා සිටින නමුත් ඔවුන්ට කිසිම හැඟීමක් නැත. ඔවුහු හෙමින් හෙමින් පාර හරහා යති. “මුං නං මී හරක්ම තමයි” යනුවෙන් බසයේ සිටි කෙනෙකු පවසන විට කාටත් සිනහ පහළ විය. මේ හරියේදී වෙනදාට ලස්සනට පෙනෙන මිහින්තලා ගල අද මීදුමට වැසී ඇත. ඉදිරියෙන් එන බසයක්ද යාම්තම් මීදුම අතරින් මතුවේ. බස් රථ දෙක මාරු වන්නේ ඉතා අපහසුවෙනි.

මට නැවතත් අර චන්ද්‍රසේන සිහි විය. පසුදා ඔහු අළුත් ඇඳුමකින් සැරසී සිටියේය. පෙරදින කිසිවක් සිදු නොවූ පරිදි හැසිරුණු ඒ දරුවා මා දෙස බලා සිනහවූයේ වඩාත් කුළුපග ලෙසිනි. ඔහුගේ පංතිභාර ගුරුමහතාටද සිනහ පහළ

වනු පෙනුනි. "අනේ පුතා උඹ ආවද" යනුවෙන් ගුරු මහතා ඔහුගෙන් ප්‍රශ්න කලේ අදත් එවැන්නක් සිදුවේද කියා අසන්නාක් මෙනි.

"ට්‍රිං" බසයේ බෙල් එක නාදවූයේ කොන්දොස්තරගේ අතිනි. ගල්කුලම හන්දියේදී පාසැලට යන අය බසින බව ඔහු දනී. සිතිවිලි වලින් මිදුණු මම බසයෙන් බැස ගතිමි. පාරේ ඉදිරිපස ඇති මීදුම අතරින් තවත් සුදක් මතුවී පෙනේ. ඒ සුදු ඇඳුමෙන් සැරසුණු පාසැල් සිසුවියන් රැසක් පාසැලට එනවා විය හැකියි. රාත්‍රී කාලයේ වන සතුන්ගෙන් ගොවිතැන් රැක ගැනීම සඳහා පැලෙහි නිදා සිටි ගොවි මහතුන් කීප දෙනෙක් ගෙවල් බලා යනු පෙනේ. මගදී අප ඉදිරියට හමුවන ඔවුන් පාරේ අයිනට වී අප යන තුරු නැවතී සිටිනුයේ පාරේ ඉඩ මදි නිසා නොව අපට දක්වන සැලකිල්ල නිසාය. පාසැල් ලිදෙන් කළය පුරවාගත් යුවතියක් ඉක්මන් ගමනින් පාසැල් වත්තෙන් පිටව යයි. මීදුමෙන් වැසුණු පාසැල් වත්තේ ඇති පාළු ගතිය සිසුන් පැමිණි පසු මැකී යනු ඇත.

# කට උත්තරය

“ටක්, ටක්, ටක්”

හෙදියන්ගේ සපත්තු හඬින් මම අවදි වූයෙමි. හෙදියෝ කීප දෙනෙක් කලබලයෙන් එහා මෙහා යති. ටික වේලාවකින් ට්‍රොලියක තබාගත් අසාධ්‍ය රෝගියෙකු වාට්ටුවට ගෙන එන ලදී. ඔහුගේ සිරුර වසා ඇත. කිසිම ශබ්දයක් නැති මේ රෝගියා ගෙන එනු ලැබුවේ අප සිටින වාට්ටුවට නිසා රෝගියා කාන්තාවක් විය හැකි බව අපට හැඟුනි. ඇය සිහිමද ගතියෙන් පසුවනු පෙනේ. එහෙත් යම්කිසි වේදනාවකින් පෙලෙන බව ඉරියව් වලින් ප්‍රකාශ වේ. වසා ඇති සිරුරේ ඇත්තේ පිලිස්සුම් තුවාල බව හෙදියක් පැවසුවාය. වාට්ටුවේ පැවති කලබලකාරි තත්වයෙන් අවදිවූ රෝගීහු ඒ රෝගියා දෙස බලා සිටිති. ඉක්මන් ගමනින් පැමිණි වෛද්‍යවරයා ඇය සෝදිසි කරයි. හෙදියන්ගේ හා උපස්ථායිකාවන්ගේ කඩිසර විලාශය රෝගියාගේ තත්වය බැරෑරුම් බවට සාක්ෂියකි. ටික වේලාවකින් බෙහෙතක් එන්නත් කෙරුණි. ඉන්පසු බොහෝ වේලා යනතුරු වෛද්‍යවරයා සහ හෙදියෝ ඇය වට කරගෙන සිටියහ. තවත් ටික වේලාවකින් රෝගියා තුළින් සිහින් කෙඳිරිලි හඬක් නිකුත් වූ නමුදු ඇයට හරි හැටි සිහි කල්පනාවක් නොවීය. ඒ සමගම පැමිණි පොලිස් නිලධාරින්ද ඇයගෙන් කට උත්තර ගැනීමට තරම් තත්වයක ඇය පසු නොවන නිසා හොඳ සිහිය ආ විට දන්වන ලෙස නියම කර යන්ට ගියහ. රෑ බෝවූයෙන් රෝගීහු කවුරුත් නින්දට වැටුනහ.

“මගෙ අම්මෝ මට නම් බෑ”

ඒ හඬින් අපි සැම දෙනාම අවදි වූයෙමු. ඒ අර රෝගී කාන්තාවගේ හඬය.

“අන්න අරයට සිහිය ඇවිල්ල” යනුවෙන් පැවසූ හෙදියෝ ඇඳ ලඟට දිවූහ. දැන්නම් එලිවෙන්ටත් ලඟයි. එක් හෙදියක් දුරකථනයෙන් පොලිසියට කථා කරනවා ඇසුනි. රෝගියා ලඟ සිට පැමිණි උපස්ථායිකාවන් දෙදෙනෙකු අතර කෙරෙන කථාවක් මගේ සවනට යොමු විය. “පිච්චිලා කිව්වට කවුරු හරි ගිනි තියලලු. දැන් පොලිසියෙන් කට උත්තර ගන්ඩ ආවම එයා ඇත්ත කියාවි”

වරින්වර රෝගියාගේ කෙඳිරිලි හඬ ඇසේ. ටික වේලාවකින් පොලිස් නිලධාරියෙක් පැමිණ ඇය ළඟට කිට්ටු වී මොනවා හෝ අසා ලියා ගන්නවා පෙණුනි. ඉන්පසු ඇය වරින්වර "අනේ …මිසී …අනේ …මට …බෑ" ආදී වශයෙන් වේදනාව හඟවන ආකාරය අපි දුටුවෙමු. වෛද්‍යවරයා නිතර නිතර පැමිණ ඇයට ප්‍රතිකාර කරයි. හෙදියෝද ඇය ගැන විශේෂ අවධානයක් යොමු කර සිටිති. එදා දවල් වරුවේද ඇය බැලීමට කිසිවෙක් නොපැමිණියෝය. හවස් වරුවේ ආවේ අසල්වැසි කාන්තාවකි. අපට රෝගියා සමග කථා කළ නොහැකි නිසා අපි අර කාන්තාවගෙන් විස්තර ඇසුවෙමු. ඇය අප සමග මෙසේ පැවසුවාය. "එදා රෑ එයාලගේ ගෙදර මහා ගෝරියක්. හැමදාම දෙන්න සන්ඩු කර ගන්නව. ඒක හින්ද කවුරුත් ගණන් ගන්නේ නැහැ. හැබැයි එදා මේ ගෑනු ළමය මහා විලාපයක් නැගූ හින්ද කවුරුත් එහාට දිව්ව. එතකොටත් ගිනි ඇවිලිලා මූණත් පිච්චිලා. ඉතින් අපට පුළුවන් විධියට ගින්දර නිවාගෙන තමයි මෙහාට ගෙනාවෙ"

"හරි පුදුම මිනිහෙක් නේ"

"ඔව් හැමදාම ඔය කෙලීට ගහනව. ඔය පැනල ගිහින් හැංගුනාට පොලිසියෙන් අල්ල ගනී. ලෙඩාගෙනුත් කට උත්තර ගන්ඩ ආවලු නේද. මෙයා කියන්ඩ ඇති වෙච්ච දේ"

මෙසේ කියූ ඇය යන්ට ගියාය. රෑ වන විට රෝගියාගේ කෙඳිරි හඬ මඳක් අඩු විය. එහෙත් මුලු රැයම වාගේ නිතරම වෛද්‍යවරයාත් හෙදියනුත් ඇය ගැන විමසිලිමත්ව සිටියහ. පසුදා උදයේ ඇයට තරමක් හොඳ සිහිය ලැබී තිබුණි. මම මුහුණ සෝදාගෙන එන විට ඇය දෙස බැලුවෙමි. ඇයද මහත් ඕනෑකමින් මා දෙස බලා සිටියාය. බෙහෙත් ගල්වා විකෘති වී ඇති ඇගේ මුහුණ බැලීමට තරම් එඩිතර සිතක් රෝගී තත්වයේ පසු වන මා තුළ නොමැති වූ හෙයින් මම වහාම පිටවී මගේ ඇඳට ගියෙමි. ටික වේලාවකට පසු හෙදියක් මා ළඟට ආවාය.

"ඔයා අර පිච්චුන ලෙඩාව අඳුරනවද"

"අනේ නෑ මිසී. ඇයි එහෙම ඇහැව්වේ?"

"එයා කියනවා ඔයාව අඳුරනවලු. ඔයා එයාට උගන්වලා තියෙනවලු"

"අනේ ඇත්තද මට නම් අඳුරන්න බැහැ. යමු බලන්න"

හෙදියද මා සමග පැමිණියාය. "මිස් …මිස්ට මාව අඳුරන්න බැරිද?" ඇය අමාරුවෙන් ඇසුවාය.

"මට කියන්ඩ ඔයාගෙ නම"

"මොරින් …ඇයි මිස්ට මතක …නැද්ද …මාව …මට හඳගල ඉස්කෝලෙදී

...මිස් ...ඉගැන්නුවේ ...මිස් ගොඩාක් කල් එහෙ ඉගැන්නුවෙ. මිස්ගෙ නම ...මිසිස් කරුණානන්ද ...නේද?"

"ඔව් අනේ ඒ මොරින්ද මේ ...කොහොම අඳුරන්නද ළමයො එතකොට ඔයා කොච්චර පොඩිද? ඇරත් දැන් මේ ඉන්න විධියට අඳුරන්ඩම බැහැනේ. අනේ මොරින් මොකද මේ ඔයාට උනේ"

"මේක ...මේක ...මගෙ කරුමෙ ...අනේ මිස් ඒ ගැන නම් මිස් එක්ක කියන්ඩ ...මට ලැජ්ජයි ...අනේ ...මිස් ...මෙන්න ඉස්සර වගේම ...මිස්ට වැන්ද ...ඒ ගැන මගෙන් අහන්ඩ එපා" කියා ඇ තම දැත් එක් කර වැඳ පපුව මත තබා ගත්තාය. ඉස්සර ආයුබෝවන් කියා වඳින විට නෙළුම් පෙති වගේ රෝස පාටට පෙනුනු ඒ ලස්සන රතැඟිලි අද පිලිස්සී විරූපිව ඇත. මට දුක හිතුණි. ඒ නිසාම මම නිහඬ වීමි. එවිට හෙදිය මා දෙස බලා මෙසේ කීවාය.

"ටීචර් මෙයාට තාම කතා කරන්ඩ අමාරුයි. ඒක හින්ද තව සනීප උනාම කතා කරමු නේද?"

මමද එය අනුමත කළෙමි. "ඔව් මොරින් ඔයාට තවම සනීප මදිනේ. දැන් ඔයා නිදාගන්ඩ. අපි පස්සෙ කතා කරමු" කියා මම ඇයගේ හිස අතගා මගේ ඇඳ වෙත ගියෙමි. ඇගේ දෑසේ කඳුළුද පිරී තිබෙනු මම දුටුවෙමි.

ඇඳේ වැතුරුණු මම ඒ අතීත සිදුවීම් එකිනෙක මෙනෙහි කළෙමි. අනේ ඒ මොරින්ද මේ. හඳගල පාසැලේදී හය වන ශ්‍රේණියේ මගේ පංතියේ ඉගෙනගත් ඒ සුරුබුහුටු කෙල්ල. පංතියේ හිටපු දක්ෂම දැරිය. උදේට මං එනතුරු පෙරමග බලා සිට ඉදිරියට දුවගෙන් විත් මගේ බෑග් එකයි කුඩයයි දෙකම ඉල්ලාගෙන පංතියට දුව යන පුංචි මොරින්. ඒ හුරතල් මුහුණ. කොටට කැපූ කොණ්ඩය දෙකට වෙන් කර අං දෙකක් වගේ උඩට හිටින්ඩ උස්සල රතු රිබන් පටි දෙකකින් බැඳල ලස්සනට හිටපු කෙල්ල. මගෙ මේසේ අස්කරල පිළිවෙලට තියල හිනාවෙවී මගෙ මූණ දිහා බලල "මිස්ට මොනවද ගේන්ඩ ඕනෑ" කියල අහල කැන්ටිමට දුවල මට කෑම ගෙනත් දෙන ඒ චූටි කෙල්ල. අනේ මොරින් ඔයාට මේ වගේ විපතක් උනේ ඇයි? මෙවැනි සිතුවිලි වලින් මම සිත් වේදනා වින්දෙමි.

හඳගල පාසැලේදී ඇය හා බැඳුණු සමහර සිදුවීම් තවමත් අමතක නැත. දිනක් උදේ මම පොත අත්සන් කර පාසැල පටන් ගැනීමට තව වේලාවත් තිබෙන බැවින් ගුරුවරුන් සමග කථා කරමින් සිටියෙමි. මට උදේ කෑම ගෙන්වා ගැනීමට අමතක විය. මට එය මතක් වූයේ පංතියට ගොස් මොරින්ව දුටු විටය. "අනේ මොරින් මට මතක නැති උනානේ" කියමින් මම මුදල් ගැනීමට බෑග් එක අතට ගතිමි. එවිට මේසය ළඟට ආ මොරින් ජයග්‍රාහී ලෙස සිනාසී පැවසූ වදන් මට තාම මතකය.

"අද මිස්ට කතාව මිසක් කෑම මතක් උනේ නෑ නේද? මෙච්චර වෙලා හිටියානං කැන්ටිමේ ලැවරිය ඉවර වෙනව. ඒක හින්ද මං බෑග් එකෙන් සල්ලි

අරං ලැවරිය ගෙනල්ල ලාව්වුවේ දැම්ම. බලන්ඩ මිස් ඉතුරු සල්ලි හරිද කියල"

"හොඳ ළමය" කියා මම කීවෙමි. ඈය ගුරුවරුන්ට එතරම්ම ලැදිය. දිනක් රෑ තද වැස්ස නිසා පංතියේ එක් තැනක වතුර ටිකක් රැඳී තිබුණි. එය නුදුටු ගුරු මහත්මයෙක් එතැනට විත් සිටින විට ඔහු ඇඳ සිටි වේට්ටියේ පහත කෙළවර වතුරෙහි ගැවෙන්ට විය. එවිට එතනට දුවගිය පුංචි මොරින් මහ හයියෙන් කෑ ගහල මෙහෙම කිව්ව. "අනේ සර් අයින් වෙන්ඩ ඔන්න ඔතන වතුර. අනේ වේට්ටියත් තෙමාගෙන"

ඒ ඇසූ ගුරු මහතාටද සිනහ පහල විය. වහාම මොරින්ගේ උඩට ගැට ගසා තිබුණු කොණ්ඩය මිටට අල්වා ගත් ගුරු මහතා "මේකද, මේක බොහොම පැහිල වැඩියි නේද මිස්" කියා මගෙන් අසන විට "අනේ සර් මගෙ පටිය ගැලවෙයි අත අරින්ඩකො" කියා සුරතල් ලෙස බලා සිටි අයුරු මට සිහි විය.

ක්‍රමයෙන් ඉහල පංති වලට ගියත් ඇය මට දැක්වූයේ පුදුම ලැදිකමකි. සරඹ පංති වල නායකත්වය දැරූ ඈ අණදෙන නිලධාරිනියක් වැනි විය. ක්‍රමයෙන් පාසැලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව බවටද පත්වූ ඈ පිරිමි ළමයින්ට පවා තර්ජනය කළ අවස්ථා ඇති විය. දිනක් දඟකාර ගැහැණු ළමයෙක් පිරිමි ළමයකුගේ පිටට පහරක් ගසා දුවයනු දුටු මොරින් ඒ ළමයාට අවවාද කළේ මෙලෙසය. "මොනවද මෙයා ඔයා හරි නරකයි. ඔයාටත් ඔය වාගෙ අයියල ඉන්නව නේද?"

පංතියේ සමහර ළමයින්ට ඇය උදව් කර ඇත. පැන්සලක් පෑනක් නැති ළමයින්ට එවැනි දේවල් ලබා දෙයි. ඇඳුම් නැති සමහර දුප්පත් ළමයින්ට මවගෙන් ඉල්ලාගෙන විත් ඇඳුම් පවා දෙයි. මෙතරම් ගුණවත් ළමයකුට ඔය වගේ දරුණු ඉරණමකට මුහුණ දෙන්ට සිදුවූයේ ඇයි?

පසුදින උදයේත් මා මුහුණ සෝදාගෙන එනවිට මොරින් මා දෙස බැලුවාය. කඳුළු අතරින් සිනාසුනු ඇය "අනේ ...මිස්" කියා අමාරුවෙන් කථා කිරීමට සූදානම් වූවාය. නමුත් ඇගේ රෝගී තත්වයත් කලින් දවසේ හෙදිය දුන් අවවාදයත් නිසා ඇය සමග කථා කිරීමට මම මැලි වූයෙමි. "ඔයාට තවම වැඩිය කතා කරන්ඩ හොඳ නැනේ මොරින් අපි පස්සේ කතා කරමු" කියා මම පිටවී ගියෙමි. දවල් වරුවේ ඇයගේ මව පැමිණ සිටියාය. ඇයටද මොරින් විසින් මා පෙන්වා දෙන ලදින් ඇයද දුටු ගමන්ම මා හැඳින ගත්තාය. ටික වේලාවකට පසු ඇගේ මව මා ළඟට පැමිණ "මේ මිසිස් කරුණානන්ද නේද" කියා අසමින් මොරින්ට සිදුවී ඇති දෙය ගැන හඬන්ට වූවාය.

"මොකද මොරින්ට ඔහොම දෙයක් උනේ"

"ඒක දිග කථාවක් මිස්. මිස්ට මතක ඇතිනේ ඒ කාලෙ ඔය ළමය කොච්චර හොඳද? මිස්ල ඔය කෙල්ලට මොන තරම් ආදරෙන් හිටියද? මිස් මාරුවෙලා ගියාට පස්සෙ ඔය ළමය නිතරම මිස්ව මතක් කරනව. අපොස සාමාන්‍ය පෙල හොඳට පාස් උනා. උසස් පෙල ඉගෙන ගන්න කාලෙදි එයා ටිකක් මුරණ්ඩු

වෙන්ඩ පටන් ගත්ත" යයි පැවසූ ඇය මා ළඟට වඩාත් ළංවී ඉතුරු හරිය හෙමිහිට පවසන්ට වූවාය.

මොරින් තම ගෙදර මෝටර් රථයේ රියැදුරු සමග මිත්‍ර වූ සැටිත් ඉන්පසු නුවර විදුහලක නේවාසිකව නතර කරවා නිවාඩුවට පමණක් ගෙදර කැඳවාගෙන ආ සැටිත් කෙසේ වුවත් ගෙදර අයට හොරෙන් සම්බන්ධකම් පවත්වා මේ විපතට පත්වූ සැටිත් ඇය හඬමින් විස්තර කළාය.

"අනේ ඔච්චර මොලේ තිබුණු ළමය ඇයි ඔය වගේ මෝඩ කමක් කර ගත්තේ"

"අවාසනාව මිස්. අවාසනාව. පවට පිං දෙන්ඩ බෑ කියල කථාවක් තියෙනවනේ. මෝඩ කමට කරගත්තු දෙයක් නෙමෙයි. හොඳට කපටි කමින් මොලේ පාවිච්චි කරල තමයි උඌ එක්ක ගියේ"

"බෝඩිමේ ඉන්නැද්දිමද යන්ඩ ගියේ"

"ඔව් මිස්. දවසක් ගෙදරට කෝල් එකක් දුන්න. එයාට ගෙදර ඇවිත් යන්ඩ ඕනෑ. ඒ හින්ද තාත්ති කාර් එක අරගෙන එන්ඩ කියල. එයත් ඉතින් ගිහින් දුවව එක්ක ආව. ඇයි මේ හදිස්සියේ ආවේ කියල ඇහැව්වම කිව්ව සුමානෙ අන්තිමට නිවාඩු දෙනව. එදාට නාට්‍යයක් තියෙනව. මාව අරගෙන තියෙන්නේ රජ බිසවට ඉතින් ඒකට අම්මගෙ හොඳ සාරියකුයි රත්රන් බඩුයි ඕනෑ කිව්ව. මිස් දන්නවනේ ඔය ළමයා ඉස්කෝලෙදිත් නාට්‍ය වලට දක්ෂ බව. මටත් ආස හිතිල ඕනෑ සාරියක් තෝරගෙන යන්ඩ කියල යතුර දීල මං වෙන වැඩ කර කර හිටිය. එයා ඉතින් එයාට ඕනෑ දේවල් සාරි පෙට්ටිවල දාගෙන රෑට කෑම කන ගමන් මෙහෙම කිව්ව 'ඔන්න තාත්ති මාව පාන්දරම ගිහිං ඇරලන්ඩ ඕනෑ' කියල ඉතින් එයත් ගිහින් මඩමෙ ගේට්ටුව ළඟින් බස්සල ආව. හවස පහට විතර බෝඩිමෙන් ගෙදරට කෝල් එකක් ආව මොකද මොරින්ව අද ගෙනත් ඇරලුවෙ නැත්තේ කියල. අපට රත් උනේ එතකොට. එදා උදේ ඉඳලම ඩ්‍රයිවරුත් ගෙදර නෑ. කලින් දවසෙ මෙයා මගෙ සාරියක් විතරක් නෙමේ, එයාගේ ඇඳුම් මගෙයි එයාගෙයි රත්තරන් බඩු එයාගෙ බැංකු පොත එහෙම සේරම අරන් ගිහින්. පහුවදාම බැඳල. පස්සේ අපි එයාව හිතෙන් අස්කර දැම්ම. පස්සෙ ආරංචි වුනා බොහොම දුක් විඳිනව කියල. ඒත් මෙයාලගෙ තාත්ත බොහොම තදට හිටිය 'අපට කරපු අවනම්බුවට ඔහෙ දුක් විඳපුවාවෙ' කියල."

"ඒ උනත් මිස් මෙහෙම දෙයක් ආරංචි උනාම අම්ම කෙනෙක් හැටියට මම කොහොම ඉන්ඩද? මං අඩනකොට එයා කිව්ව ගිහින් ඕනෑ දෙයක් කරගන්ඩ කියල. මං ඉතින් මොරින්ලගෙ ගෙදරත් ගිහින් තමයි මේ ආවේ. ළමය ඉන්නව අල්ලපු ගෙදර. අරූ තමයි ගිනි තියල තියෙන්නේ. දැන් හැංගිලා. මේ මෝඩ කෙල්ල පොලිසියට කියල තියෙන්නේ එයාම ගිනි තියාගත්ත කියල. ඒ උනත් අපි මේක ලේසියෙන් අරින්නේ නැහැ. ගිනි තියනව දැකපු මිනිස්සු ඉන්නව. අද මං යන ගමන් ළමයවත් අපේ ගෙදර අරන් යනව. මොරින්වත් සනීප උනාම ගෙදර එක්ක යනව" යයි පවසා මොරින් ළඟට ගොස් බොහෝ වේලාවක් හිඳ මටත් සුබ

පතා ගෙදර ගියාය.

රෑ වන විට මොරින්ගේ තත්වය අසාධ්‍ය අතට හැරුණි. නැවතත් සිහි නැතිව ගොස්ය. වෛද්‍යවරයා සහ හෙදියෝ නිතර ඇය ළඟට යති. බෙහෙතක් එන්නත් කිරීමට මා ළඟට පැමිණි හෙදිය බෙහෙත එන්නත් කර මගේ මුහුණ දෙස බලා සිටියාය.

“මොකද මිසී”

“මිසිස් කරුණානන්දට ඉන්ජෙක්ෂන් එක දෙනව තේරුනේවත් නෑ වාගෙ. මොකද ගෝලය ගැනද කල්පනාව”

“අනේ ඔව් මිසී මොකද දැන් එයාට”

“එයාගෙ තත්වය හොඳ මදී”

මට නින්ද ගියේ බොහෝ රෑ වූ පසුය. මැදියම් රැයේ මා හදිසියේ අවදි වූයේ එදා වාගේම හෙදියන්ගේ සපත්තු හඬිනි.

මම ඇඳ උඩ හිඳගෙන ඒ දෙස බැලුවෙමි. හෙදියන් ඇය වට කරගෙනය. වෛද්‍යවරයා බැරෑරුම් ස්වරූපයක් මුහුණට ආරූඪ කරගෙන බලා සිටී. රෝගීව සිටින මගේ ගතට අපහසු ගතියක් දැනෙන නිසා මම නිදා ගතිමි. මගේ දුබල ගතිය නිසාම මම නැවතත් තද නින්දට වැටුනෙමි. පාන්දර යාමයේ මා අවදිවී බලන විට ඇගේ ඇඳ වටේ තිර ඇද වසා තිබුණි. ටික වේලාවකට පසු ට්‍රොලියක් තල්ලු කරගෙන ආ උපස්ථායකයකු විසින් සුදු රෙදි වලින් වසන ලද මිනිස් සිරුරක් ට්‍රොලියේ තබාගෙන මෘත ශරීරාගාරය දෙසට යනු පෙනුණි.

# නංගීයේ උඹ වෙනුවෙන්

එදා හවස මාලිත් මමත් මොන තරම් ආශාවෙන්ද පහුවදා යන ගමන ගැන කථා කළේ.

“සෝමෙ මට නම් ගම දාලා යන්ඩ දුකයි බං” මලී කීවාය.

“ඇයි බං අපි ගම අතහැරල රට යනවයැ අපි යන්නෙ මේ අපේම රටේ තියෙන කොළඹට නේ”

“අපේ අම්මනං ඊයේ ඉඳලම අඬනව සෝමේ”

“අපේ ගෙදරත් එහෙම තමා. අම්මටත් හපන් අයිය. අයියට හුඟක්ම දුකයි මං යනවට”

“ඔව් ඉතින් උඹලගෙ අයිය චූටි කාලෙ ඉඳලම උඹට පන ඇරගෙන නේ. මතකද ඉස්කෝලෙදි කොල්ලෙක් උඹට කඩදහි ගුලියකින් ගැහැව්ව කියල උඹට පාරෙදි නහයෙන් ලේ එනතුරු ගැහැව්ව”

“අනේ ඔව් බං අයිය මට ඊයෙත් කිව්ව සෝමෙ නංගියේ උඹ ගියාට කමක් නෑ ඉන්ඩ බැරිනං ආපහු වරෙන් කියල”

“මොකද සුදු බණ්ඩයිය කියන්නේ?”

“සුදු බණ්ඩයියත් වැඩියම කැමති නෑ ඒත් ඉතින් අම්ම කිව්ව සෝමාවතී ටික කලක් රස්සාව කරල කීයක් හරි හොයාගෙන එයිනේ ඊට පස්සේ බැරියැ මංගල්ලෙ ගන්ඩ කියල”

“ඉතින් සුදු බණ්ඩයිය කැමතියි කිව්වද?”

‘අමනාපයක් පෙන්නුවේ නැහැ. එයාලගේ නංගි බඳිනතුරු අපේ කටයුත්ත කරන්ඩ බැරි හින්ද ටික කලක් රස්සාවකට ගියාට කමක් නෑ කිව්ව”

"උඹලගේ ගෙදරින් කවුද හෙට යන්නේ"

"අම්මයි අයියයි සුදු බණ්ඩයියයි"

"මලීලගේ ගෙදරින් කවුද යන්නේ"

"අපට කොහෙන්ද ඉතින් සුදු බණ්ඩයියල. අපට ඉන්නෙ ඉතින් අම්මයි තාත්තයි තමයි" කිවූ මලී මගේ නහයෙන් අල්ලා සෙලෙව්වාය.

අපට රැකියාව සොයා දුන්නේ පොඩිහාමු මහත්තයාය. ඔහු අපේ අයියා සමග ඉතාම හිතවත්ය. ඔහු ගමේ තරුණ තරුණියන් කීප දෙනෙකුටම පිටරට රැකියා සොයාදී ඇත. අයියාටත් රැකියාවක් සොයා දීමට සූදානම් වූ නමුත් අයියා අකමැති වූයේ තාත්තාට තනිවම අපේ කුඹුරු වැඩ කර ගැනීම අපහසු නිසාය. ගමේ තරුණියන් කීප දෙනෙකුටම ඇඟලුම් කම්හල්වල රැකියා ලබාදී ඇත. ඔහු මෙවැනි දේ කරනුයේ ඡන්දාපේක්ෂකයකු වීමේ අභිලාෂයෙන් බව සමහරුන් කීවත් තවත් අය කීවේ ඊට හාත්පසින්ම වෙනස් කතාය. ඔහු වැරදි ක්‍රම වලින් මුදල් උපයන බවත් හොර ජාවාරම් වලට සම්බන්ධ බවත් ඒ නිසා ඔහු ආශ්‍රය කිරීම එතරම් සුදුසු නැති බවත් සමහරුන් අපේ අයියාටද කියා ඇත. අයියා ඒ කිසිවක් ගණන් නොගත්තේ අයියාට එවැනි වැරදි දේවල් ගැන කිසිම හෝඩුවාවක් පොඩිහාමු කෙරෙන් දැක ගත නොහැකි වූ නිසාය. පසුදා පොඩි හාමුගේ ජීප් රියෙන් අපව කොළඹට කැඳවාගෙන යන ලදී.

අලංකාර තට්ටු නිවාසයක බිම් මහලේ වූ කාර්යාලයක් වෙත අපව කැඳවාගෙන ගියේ පොඩිහාමු මහත්තයාය. එහි සිටියේ නවීන පන්නයට හැඳ පැළඳගත් තොල් සායම් කළ මැදිවියේ කාන්තාවකි. ඇයට සහය වීමට තවත් රූමත් තරුණියක් විය. හාමු මහත්තයා දෙස බැලූ අර මැදිවියේ කාන්තාව සිනහමුසු මුහුණින් යුතුව "ආ එන්න ඇතුළට මේ අර කියාපු ළමයි දෙන්නද?" කියා ඇසුවාය.

"ඔව් මිසිස් වීරසූරිය" යි පැවසුවේ පොඩිහාමුය.

"වාඩිවෙන්න මිස්ට බණ්ඩාර" යයි හාමු මහත්තයාට පැවසූ එම කාන්තාව අපටද වාඩි වන ලෙස ඇරයුම් කළාය.

"කවුද සෝමාවතී මැණිකේ?" මම නැගිට සිටියෙමි.

"අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් කිව්වා නේද?"

"ඔව් මැඩම්"

"ඔයා මාලතී ගුණරත්න නේද" යයි මැඩම් ඇසුවේ මාලි දෙස බලාය. ඇයද පිළිතුරු දෙමින් නැගිට සිටියාය. "හොඳයි ඔය දෙන්නා තරමක් ඉගෙන ගෙන තියෙන නිසා මැහුම් වැඩපළේ හොඳට වැඩ කළොත් උසස්වීම් එහෙම

ලබාගන්න පුලුවනි. මේක තමයි බෝඩිම" යාබද තට්ටු නිවාසය පෙන්නූ ඇය "හෙට ඉඳල වැඩ බාරගන්න පුලුවනි. දැන් ඇඳුම් බෑග් අරගෙන බෝඩිමට යන්න පුලුවනි. මේ ගොල්ලන්ව බෝඩිමට එක්ක යන්න" කියා ලඟ සිටි තරුණියට අපව බාර කළාය. අම්මලා තාත්තලාගෙ මුහුණු වලින්ද තෘප්තිමත් බවක් පෙණුනි. අම්මලා දෙදෙනාටත් අප සමග බෝඩිම තුළට යෑමට අවසර ලැබුණි. ඒ යන අතර අම්මා මගේ කණට කර මෙසේ කීවාය.

"ඒ නෝන හරි පිං පාටයි නේද?"

"ඔව් අම්මේ"

"හොඳට ඉඳිල්ල පුතේ ඒ නෝන කියන දේ අහගෙන. උඹලට හොඳට සළකාවි"

අපව කාමරයට ඇරලූ පසු අම්මලා පඩි පෙළ බැස පහලට ගියහ. අපි උඩුමහලේ සිට පහත බැලුවෙමු. අයියාත්, හාමු මහත්තයාත්, සුදු බණ්ඩයියාත් අපට අත වනා සුභ පැතූහ. අම්මලා "යන්නම්" කියන්නාක් මෙන් හිස වනා ජීප් රියට නැග ගත්හ. අප කැටුව ගිය අර තරුණිය අපට මුහුණ සෝදා ගැනීමට නාන කාමරය පෙන්වීය. ඇඳුම් මාරු කරගෙන මහන්සි නිවා ගන්නා ලෙස කියූ ඇය යන්ට ගියාය. අපි ඇඳුම් මාරු කරගෙන ඇඳ මත වාඩි වී සිටියෙමු. ඊට යාබද කාමර වලද තරුණියෝ කීප දෙනෙක්ම සිටියහ. ටික වේලාවකින් තරුණියෝ දෙදෙනෙක් අපේ කාමරයට පැමිනියහ.

"ඔයාලා කොහේ ඉඳලද ආවෙ"

"අපි මාතලේ පැත්තේ"

"ආ එහෙනම් උඩරට මැණිකෙලා නේද?" අපි සිනාසුනෙමු. ඉන්පසු තවත් ගැහැණු ළමයි දෙදෙනෙක් දොරෙන් එබී බලා අප සමග සිනාසුනහ. ඔවුන් දෙදෙන එකිනෙකගේ මුහුණ බලාගෙන උපහාසාත්මක සිනහවක් පා යන්ට ගියහ. තවත් කීප දෙනෙක් මේ විදියට පැමිණ අප දෙස අනුකම්පාවෙන් බලා එහා මෙහා ගියහ. ටික වේලාවකින් අපව පිලිගත් මැඩම් පැමිනියාය. ඇය කාමරයට එබී බලා "ආ ඔය ළමයින්ට මහන්සි ඇති නේද? නීලා මේ ළමයින්ට කූල් ඩ්‍රින්ක්ස් මොනවා හරි ගෙනත් දෙන්න' ළමයකුට නියම කළාය. "කාමරයෙන් පිට එහා මෙහා යන්න එපා. දවල් කෑමත් කාමරයට එවයි" කියා පිටවූ ඇය ළමයි කීප දෙනෙකුට සැර කරනු අපට ඇසුණි. "කොහේද යන්නේ. ඇයි ගෑනු ළමයින්ව කවදාවත්ම දැකලා නැද්ද? එයාලාගේ පාඩුවේ එයාලාට ඉන්ඩ දීලා ඔයාලා ලෑස්ති වෙලා ඉන්න ඕනේ. කාරෙක දැන් එයි" අපට පුදුම හිතුනි. මොහොතකට කලින් අපට ඉතාම සුහද ලෙස කථා කළ කරුණාවන්ත පෙනුමකින් යුතුව සිටි ඒ මැඩම්ගේම කටහඬදැයි අපට හිතා ගැනීමට අපහසු විය.

"හිතපු තරම් කරුණාවන්ත කෙනෙක් නෙමේ වගේ නේද මලී?"

"ඔව් බං අපි ඉතිං ටිකක් ඉඳල බලමුකෝ"

අපට ලැබුනු සිසිල් බීම පානය කල අපි උඩු මහලේ ජනේලයෙන් පහත බැලුවෙමු. එවිටම විශාල මෝටර් රථයක් පැමිනියේය. ගැහැණු ළමයි හතර දෙනෙක් ලස්සනට හැඳ පැලඳගෙන ගොස් අර මෝටර් රථයේ වාඩි වූහ. අපට අල්ලපු කාමරයේ සිටි තවත් ගැහැණු ළමයි ඒ අයට අත වනා හිකි හිකි ගා සිනාසුනහ. ඉන්පසු මැඩම්ද මෝටර් රථයක නැගී ඒ අය පසු පසම යන්ට ගියාය.

නැවත කෙල්ලන්ගේ හැසිරීම අමුතු විය. එකා දෙන්නා බැගින් අප ළඟට විත් එබී බලා සිනාසී නොයෙකුත් දේවල් කියමින් යති. ඔවුන් කියමින් යන සමහර දේවල් අපට හොඳින් ඇසේ.

"අනේ පව් බං"

"දලු සයිස් කෙල්ලො දෙන්නෙක්"

"දුක හිතෙනවා බං තවම ඇඟේ මැස්සෙක්වත් වහල නැති පාටයි"

"මාතලේ පැත්තෙලු. අහිංසක පාට පේන්නේ නැද්ද?"

මේ විදියේ වචන ඔවුන් එහා මෙහා යමින් පවසන අතර, තවත් දෙදෙනෙක් අප සිටි කාමරයට ඇතුලු වූහ.

"මේ නංගිලා ආවේ මැහුම් වැඩ පලටද නැත්නම් රෙදි සාප්පුවටද?"

"මැහුම් වැඩ පලට කියලයි. මුලදි පුරුදු වෙන්න ඕනැ කිව්වා"

"ඔව් ඔව් අපිත් ඒ විදියට තමයි ආවේ" කියා එක්කෙනෙක් තව කෙනෙක් දෙස බලා ඉඟි කළාය.

"මැහුම් වැඩපලේ වැඩ අමාරුද?" කියා මලී ඇසුවාය.

"කොයි වැඩෙත් මුලදි අමාරු තමයි නංගි ඒත් පුරුදු වෙනකොට කොයි වැඩෙත් අමාරු නෑ" එකියක් උත්තර දුන් විට අනිත් අය කොක් හඩලා සිනාසුනේ ඇයිදැයි අපට ප්‍රහේලිකාවක් විය. ටිකකින් ඔවුහු තමන් සිටි තැනට ගියහ. අපට කෑම පිඟන් දෙකක් ලැබුනි. පිඟානක් තව පිඟානකින් වසා සුදු රෙදි කඩකින් ගැට ගැසූ භාජන දෙකකි. කෑමෙන් පසු අපි ඇඳේ වැතිරී සිටියෙමු. මහන්සි නිසා අපට නින්ද ගොස් තිබුණි. අප අවදිවූයේ වැඩිහිටි කාන්තාවකගේ කටහඬිනි. ඇය පෙනුමෙන් මෙහෙකාරියක් වැනිය. තේ කෝප්ප දෙකක් අපට පිලිගැන්වූ ඇය "මේ අද අලුතින් ආ ළමයි නේද" කියා ඉතා ආදරයෙන් ඇසුවාය. අපි ඔව් යයි කීවමු. ඇය නැවතත් අපේ මුහුණ දෙස බලා පිටතට යන විට දොර ළඟ සිටි අනිකුත් ළමයින් දෙස බලා මෙසේ කියනවා අපට ඇසුණි. "මේ ලෝකේ හසරක් නොතේරෙන දරු පැටව් දෙන්නෙක්" ඒ වචන ඇසූ ළමයින්ද අප දෙස

බලා ආදරයෙන් සිනාසුනහ.

මේ නිවස තුළ පවතින තත්ත්වය අපට ප්‍රහේලිකාවකි. කවුරුත් අප දෙස බලනුයේ ඉතාම අනුකම්පාවෙනි. ඒ ඇයි කියා අපට නොතේරේ. අප ගමේ ගොඩේ හැදුනු කෙල්ලන් නිසාද?

“ඈ බං මලී මේ හැමදෙනාම අපි දිහා බලන්නේ ඇයි?”

“අනේ මන්දා බං. බලමුකෝ හෙට අනිද්දා දිහාට මොකද වෙන්නේ කියලා”

“සමහර විට මැඩම් හුඟක් නපුරු ඇති. ඒ ගැන මේ ළමයින් හොඳට දන්න හින්දා වෙන්න ඇති අපට මෙච්චර කරුණාව පෙන්වන්නේ”

“එහෙම වෙන්ඩත් ඇති මොනවා උනත් බලමුකෝ”

“ඉන්ඩ බැරිනං අපි යං”

“ඔව් අපේ අයියත් කිව්වේ ඉන්ඩ බැරිනං එන්ඩ කියලනේ”

“ඔව් බැරිනම් අපි යං යන්න”

ක්‍රමයෙන් කාලය ගෙවී ගියේය. හවස හයට පමණ උදේ අපව පිලිගත් තරුණිය අපට නැමට පහසුකම් සළසා දුන්නාය. රාත්‍රියේ 7.30 ට පමණ අපට රෑ කෑමද ලැබුණි. කෑම කා අවසන් වූ පසු අර තරුණිය නැවත පැමිණියාය. “ඔයාලා කතා කර කර ඉන්න තව ටිකකින් මැඩම් ඔයාලාව හම්බවෙන්ඩ එනවා කිව්වා. එනතුරු නිදා ගන්න එපා කිව්ව” අපි කතා කරමින් සිටියෙමු. පැයකට පමණ පසු මැඩම් පැමිනියාය. ඇය අත ලස්සන රාත්‍රි ඇඳුම් දෙකක් විය. ඉතා සුහදව අප සමග සිනාසෙමින් පැමිනි ඇය එම ඇඳුම් අපට දෙමින් සිනාසෙමින් මෙසේ කීවාය.

“බලන්ඩ මේ ඇඳුම් ඔයාලට හරිද කියලා. ඇඳලම බලන්න” අපි ඒවා ඇන්දෙමු. අපට ඒවා හොඳින් ගැලපේ. ඉතාම ලස්සනය.

“ඔය දෙක ඔයාලට මගෙන් දෙන තෑග්ගක්”

“බොහොම ස්තුතියි” අපි කීවෙමු.

“අද රෑට ඕවා අඳින්න. පස්සේ ඔයාලට තව ඒවා ගන්න බැරියෑ මාසේ පඩි ගත්තම” කියා සිනාසුන ඇය තමා නැවතත් එන බව පවසා යන්ට හියාය.

“සෝමේ මේ ගවුම නම් අඳින්නත් ලෝබයි බං. ඒ තරම්ම වටිනවා”

“ඔව් මලී මේවා පිටරට ඒවා වෙන්න ඇති”

ඒ සමහම එතැනින් ගිය තරුණියන් දෙදෙනෙක් දොරෙන් එබී බලා "ආ නංගිලාට තැගිත් හම්බ වෙලා තියෙන්නෙ" කියමින් සිනසුනෝය. එයද උපහාසාත්මක සිනාවකි. අප දෙදෙනා කල්පනා කලේ මැඩම් ආයේ එනවා කීවේ කුමක් සඳහාද කියාය. සමහර විට හෙට මැහුම් වැඩපලේ කරන වැඩ ගැන කියන්න වෙන්න ඇති. ටික වේලාවකින් පැමිණි මැඩම් දොර ළඟ නැවතී අප දෙස බලා "සෝමාවතී මැණිකේ මාත් එක්ක එන්න. මාලතී ඔය කාමරේම ඉන්න.. දොර වහ ගන්න" කියා මා කැටුව එමමහලේම ඈත කෙළවරෙක පිහිටි කාමරයට ගියාය. පසුව මට එහි නැවතී දොර වසාගෙන ඉන්නා ලෙසත් කවුරුහරි ලමයෙක් ඇවිත් දොරට තට්ටු කලොත් දොර අරින ලෙසත් පවසා පිටවී ගියාය. මට මෙය ප්‍රහේලිකාවකි. මාලතී ඒ කාමරයේත් මා මේ කාමරයේත් දමා දොර වසාගෙන ඉන්ට කීවේ ඇයි? මේ ගැනිට පිස්සුද මන්ද?

පැය කාලකට පමණ පසු කවුදෝ 'ටක් ටක්' ගා දොරට දෙවරක් තට්ටු කරන හඩ ඇසී මම දොර හැරියෙමි. ඒ විගසම කාමරයට ඇතුලු වූයේ හැඩි දැඩි සිරුරක් ඇති සුදුම සුදු විදේශිකයෙකි. ඔහු ඇතුලු වූ වහාම නැවත දොර අගුලු දැමුවේය. මම හයින් තැති ගතිමි. වහාම දොර ලඟට දිවූ මා අගුල ඇර ගැනීමට අත තබත්ම ඔහු වහාම යතුර අතට ගෙන ඔහුගේ බෑගයට දමා වසා ගත්තේය. ඉන් පසු මම හඩන්නට වූයෙමි. ඔහු උපහාසාත්මක සිනාවක් පා මා නොදන්නා භාෂාවකින් යමක් පැවසීය. මට පිට වී යාමට ඉඩ දෙන ලෙස මට හැකි අන්දමින් හැඟවීම් කලත් ඔහු ඒ කිසිවක් ගනන් ගත්තේ නැත. බෑගයෙන් මුදල් නෝට්ටු අතට ගත් ඔහු ඒවා මේසය මත තබා ඉන් පසු සිත් පිත් නැති නරුමයෙකු සේ මා ග්‍රහණයට හසු කර ගත්තේය. මම හැකි තරම් වැලපුනෙමි. ඒ දුෂ්ටයා තම චේතනාවන් මුදුන් පමුනුවාගෙන කිසිම තැකීමක් නැතිව යතුර ගෙන දොර හැර යතුර කටේම තිබියදී දොර අඩවල් කර යන්නට ගියේය. අපොයි දෙවියනේ මේ සිදු වූයේ කුමක්ද? දැන් මා ජීවත් වීමෙන් ඇති ඵලය කුමක්ද? දැන් මාගේ මේ සිරුර මට එපා යයි සිතුනි. දැන් මෙය මාගේ නොවේ නම් කොතරම් හොඳද? අර පොඩි හාමු කියන දුෂ්ටයා අපේ ජීවිත විනාශ කර දැමීමට කොයි තරම් කපටි අන්දමින් ක්‍රියා කර ඇද්ද? ඒ යක්ෂයාට ශාප වේවා. අනේ මෙලහකටත් මලීටත් මට වූ දෙයම සිදු වී ඇති.

මගේ අම්මා තාත්තා අයියා මේවා දැන ගත් පසු මොනවා කරාවිද? දැන් ඒ අයට මුහුණ දෙන්නේ කොහොමද? සුදූ බණ්ඩියියාට මා වගේ කාලකන්නි කෙල්ලක් බැඳ ගත හැකිද? ඒ වගේ කෙනෙකුට දැන් මා වගේ කුණු කඳක් ගැලපේද? ඇත්තෙන්ම දැන් මා කිසිම කෙනෙකුට සුදුසු නැත. නිධානයට අරක් ගත් යක්ෂයාට පවා පූජා කිරීමට ගන්නේ පිරිසිදු කන්‍යාවක්ලු. ඉතින් දැන් මා එබඳු යකෙකුටවත් අවශ්‍ය නැත. දැන් ඉතින් කල යුතු එකම දෙය මේ කුණු ශරීරයෙන් ප්‍රාණ වායුව පිට කර හැරීම පමණි. ඔව් මේ පිලිකුල් සිරුර මට එපා. මා එසේ සිතන අතරම මැඩම් දොර ඇරගෙන ඇතුලට ආවාය. ඇ යක්ෂාවේශ වී සිටින මා දෙස බැලුවාය. ඇගේ මුහුණ වෙනස් විය.

"මොකද සෝමාවතී මැණිකේ තරහෙන් වගේ?"

"තරහෙන් වගේ?" යනුවෙන් එම ප්‍රශ්නයම ඇගෙන් ඇසූ මම දත් මිටි කෑවෙමි. "මාව මරාගෙන කෑවා නම් මීට වඩා හොඳ නේද" අසමින් ඇය ඉදිරියට පැන්නෙමි. එහෙත් ඇය ඒ කිසිවෙකින් නොසැලී මෙසේ කීවාය.

"ළමයො නිකම් මෝඩ වෙන්න එපා. සල්ලි හොයන්න පෝසත් වෙන්න ඔයා වගේ ගෑණු ළමයෙකුට හොඳම තැන මෙතන. මෙතෙන්ට එන්නේ හොඳ හොඳ ලොක්කෝ. මේ බලන්ඩ මේසය උඩ තියෙන සල්ලි. රුපියල් පන්දාහක්. තරුණ ගෑණු ළමයෙකුට මුලදි ඔච්චර මුදලක්ලැබෙනවා. ඔයාට මම ඒකෙන් තුන්දාහක්ම දෙනවා. දැන් ඉතින් පස්සේ එන අයගෙන් නම් ඔච්චර ලැබෙන්නේ නැහැ. ඒත් මම රෑ ළඟට එන හැම කෙනා වෙනුවෙන්ම ඔයාට රුපියල් දාහක් බැගින් ගෙවනවා. මාසයක් රස්සාව කලත් ඔච්චර මුදල් හොයන්න පුලුවන්ද? මෝඩ වෙන්න එපා. මේකෙ ඉන්න ලමයි කොච්චර හම්බ කරනවාද? ඒ ළමයි කවුරුත් දැන් යන්න කැමති නැහැ. ඔයත් ඒ විදිහට හැඩ හැහෙන්න. අකීකරු උනොත් ඔයාටමයි පාඩු. හැබැයි මේ විස්තර ගෙදරට කියන්ඩත් බැහැ. මෙහෙට ආවාට පස්සේ මෙහෙන් පැනලා යන්නත් බැහැ. එහෙම හිතන එකත් මෝඩ කමක්. අපේ නීති කඩන අයට මේකෙ ඇතුලෙ හොඳ දඬුවම් විඳින්ඩ වෙනවා. පොලිසියට ගියත් වැඩක් නැහැ. දැන් ඉතින් තව කෙනෙක් එන තුරු ලෑස්ති වෙලා ඉන්නවා" යයි නියෝග කරමින් ඈ තදින් දොර වසා ගෙන යන්ට ගියාය.

මගේ හද තුල පමණක් නොව මොළය තුලද ගිනි ඇවිලේ. යක්ෂනී මේකි උදේ කතා කලේ කොහොමද? බෑ බෑ දැන් ඉතින් මේකෙ ඉඳලා වැඩක් නැහැ. ඕකි ආයේ ආවොත් මම ඕකිගෙ බෙල්ල කනව යයි සිතමින් මම පිස්සියක මෙන් කාමරය තුල එහා මෙහා ඇවිද්දෙමි. සිත්ට මෙන්ම ගතටද වේදනාවක් දැනේ. මගේ සිතේ දැන් පවතින හැඟීම් මගේම කෙනෙකුට පෙන්වන්නට හැකි නම්. ඒත් ලැජ්ජා නැතිව මේවා කොහොම කියන්ඩද? මගේ හදවත ගලවල අම්මගෙ අතට දුන්නොත් ඒක දිහා බලලා අම්මට මගෙ දුක තේරුම් ගන්ඩ පුලුවන් නම් මම එහෙම කරල හරි මගෙ දුක පෙන්වනව. ඔව් මගේ අම්මේ, මගේ අයියේ එහෙමවත් කරලා ඔයාලාට මගේ දුක පෙන්වන්න පුලුවන් නම් ඔව් මං මගෙ හදවත ගලවල ඔයාලාගේ අත් වලට දෙනව. ඔව් ඇත්තමයි දෙනව. මෙසේ කියමින් මම පිස්සියක සේ ඇඬුවෙමි. කොන්ඩය කඩා හලාගෙන ඇඬුවෙමි. අයියෝ බෑ බෑ මුං ඔක්කොම යක්කු මුන්ට නම් හොඳක් වෙන්ට එපා දෙයියනේ . . . අයියෝ කියමින් විලාප නැගුවෙමි. නැවතත් දොරට ගසන හඬ ඇසිණි.

"ආයෙත් යකෙක් ආවද. නෑ අරින්නේ නෑ දොර" නැවතත් දොරට හසන හඬ ඇසුණි. ඒ හඬ වේගවත්ය.

"සෝමාවතී මැණිකෙ අරිනව දොර" ඒ මැඩම් ගේ හඬය.

"රාස්සනී උඹ ආයෙත් යකෙක් ගෙනාවද?" මම දත්මිටි කෑවෙමි.

"මේ කට පරිස්සම් කරගෙන අරිනව දොර නිකං ලෙඩ දාගන්නේ නැතුව. මගේ හැටි තවම දන්නෙ නැහැ" ඒ වචනද මැඩම් පැවැසුවේ දත්මිටි කමින්ය.

මම අවසාන තීරණය ගතිමි. ඔව් මේ ජීවිතෙන් මට දැන් වැඩක් නැහැ. මම ජනේලය ළඟටගියෙමි. බිම බැලුවෙමි. බිම් මහල වටේම තාප්පයකි. මට පෙනුනේ එපමණයි. මම ජනේලයෙන් බිමට පැන්නෙමි. උඩ සිට වේගයෙන් වැටුණු මා තාප්පයේ වැදී අනිත් ගොඩනැගිල්ලට අයිති වත්තට වැටුණි. එවිටම ඒ අසල සිටි කවුදෝ මා ළඟට ආ බව මට යාන්තම් මතකය. මට පියවි සිහිය ලැබී බලන විට මා සිටියේ රෝහලකය. මට සිහිය ලැබී ඇත්තේද දින කීපයකට පසුවලු. මා ගැන විස්තර මා දැනගත්තේ රෝහලේ උපස්ථායිකාවකගෙනි. මා රෝහලට ගෙනාවේ පොලිස් ජීප් රියකින්ලු. මා උඩ සිට වැටෙන විට තාප්පයේ වැදී විසි වී ඇත්තේ අල්ලපු වත්තට නිසා ඒ අය වහාම පොලිසියට දැනුම් දී ඇත. එවිටම ක්‍රියාත්මක වූ පොලිසිය මා රෝහලට එවා පසුව මා සිටි ගනිකා නිවාසයද වටලන ලදී. එහි සිටි කාන්තාවන් කීප දෙනෙකුද අත් අඩංගුවට ගෙන ඇත. මට මලී මතක් විය. ඇයද අත් අඩංගුවේ පසු වෙතැයි මම සිතුවෙමි. අනේ අපේ අම්මලා තාත්තලා කිසිවක් දන්නේ නැතුව ඇති. ටික වේලාවකින්පොලිස් නිලධාරියෙක් මා හමුවීමට පැමිණියේය. හෙතෙම මගෙන් ඇසූ ප්‍රශ්න වලට මම අවංකවම පිළිතුරු දුන්නෙමි.

මා ඒ ස්ථානයට පැමිණි සැටිත්, පැමිණීමට හේතුවත්, බලාපොරොත්තු නොවූ අන්දමින් මට මුහුණ දීමට සිදුවූ අතවර නිසා දැරිය නොහැකි සිත් වේදනාවෙන් බිමට පැන්න සැටිත් විස්තර කලෙමි. මා කොතරම් නිර්දෝෂි වුවත් මට විරුද්ධව චෝදනාවක් එල්ල වී ඇත. ඒ සියදිවි නසා ගැනීමට තැත් කිරීමය. ඒ සඳහා ලැබෙන ඕනෑම දඬුවමක් විඳීමට මම සතුටෙන් සිටිමි. මම මගේ වාට්ටුව භාර හෙදියට මගේ ලිපිනය දී මා මේ රෝහලේ සිටින බව මගේ මව්පියන්ට දන්වන ලෙස කාරුණිකව අයැද සිටියෙමි. ඇයද එය ඉටු කර දෙන බව පැවැසුවාය.

අද හෝ හෙට ගෙදරට දැනුම් දෙන නිසා අනිද්දා පමණ ගෙදරින් කවුරුන් හෝ මා බැලීමට එනු ඇත. දැන් ලෙඩුන් බලන වේලාවය. එකා දෙන්නා බැගින් ක්‍රමයෙන් වාට්ටුවට ඇතුළු වන අමුත්තෝ තම තමන්ගේ රෝගීන් ළඟට කිට්ටු වෙති. දැන්නම් සෑම ඇඳක් ළඟම කවුරු හෝ සිටිති. මම පමණක් තනි වී සිටිමි. මොහොතකින් මා ළඟට කවුදෝ ඇවිත් සිටිති. මම හැරී බැලුවෙමි. මෙන්න පණිවුඩය යවන්ටත් කලින් අම්මා තාත්තා සහ මලී මා බැලීමට පැමිණ ඇත. අම්මා මා බදාගෙන් ඇඬුවාය තාත්තාත් කඳුළු වගුරුවයි. මලීගේ ඇස්වලත් කඳුළුය. මම නොහැඬුවෙමි. මට දැන් හඬන්නට කඳුළු නැත. රකින්ඩ නම්බුවක්ද නැත. ඒ නිසා මගේ හදවත ගල් වී ඇත. එහෙත් මගේ දණහිස කැඩිලාය. උරපත්ත හා වැලමිට සන්ධි විසන්ධි වී ඇත. ඒවාට ප්ලාස්ටර් දමා ඇත. අම්මාත් තාත්තාත් ඒවා දෙස බලමින් තවත් හඬති.

“කොහොමද මලී උඹ ගමට ගියේ” මම ඇසුවෙමි.

“එදා උඹගේ සිද්ධියෙන් පස්සේ මැඩම් කලබලයෙන් එහා මෙහා දුව දුව මොනවාදෝ කියවනව ඇහුණා. හරියටම පිස්සු හැදිල වාගේ. මම කාමරේ

ඇතුලේ ඒ වෙලාවේ උන්නේ. මොනවා හරි ලොකු කලබලයක් බව නම් මට තේරුණා. මටත් ඒ වෙලාවේ කිසිම දෙයක් හිතන්ඩ තරම් හිතට සැනසීමක් තිබුනේ නැහැ. ටික වේලාවකින් පොලිසියෙන් පැන්න. කෙල්ලෝ හැම පැත්තටම ශුවන්ඩ ගත්ත. මමත් දුවන උන් එක්ක පිටිපස්සේ පඩි පේලියෙන් පහළට බැස්ස. මාත් එක්ක ආපු මහරගම පැත්තෙ කෙල්ලෙක් මට කිව්ව 'නංගි අපි අර පුංචි දොරෙන් එලියට දුවමු' කියල. එතකොටත් හුඟක් අයව පොලිසියට අහු වෙලා. මේ කෙල්ල කිව්ව 'අර හරස් පාරෙන් දුවමු. එතන මඩමක් තියෙන්නේ. ඒ මදර් හරිම හොඳයි' කියල. ඉතින් අපි දෙන්නම මඩම ඇතුළටම දිව්ව. ඊට පස්සේ මදර්ට වැඳල අපේ විස්තරේ කිව්ව. මදර් වැඩියම කැමති උනෙත් නැහැ. ඒත් අවස්ථාව හැටියට අනුකම්පා කරල 'දවස් දෙක තුනක් ඉන්ඩ දෙන්නම්. හැබැයි ඉක්මනට යන්ඩ ඕනැ' කිව්ව. ඉතින් එහෙ ඉඳල තුන්වෙනි දවසේ පාන්දරම පිටවෙලා ගියා. මදර් තමයි අපට සල්ලියි ඇඳුම් එහෙමත් දුන්නේ. මාව අපේ බස් එකට ඇරලෙව්වෙත් ඒ ලමයයි. මම ගෙදර ගිය ගමන්ම තමයි ඔයාලාගේ අම්මලට කිව්වේ"

"අනේ මලී අපට වෙච්ච දේ. අපි හිතාගෙන ගියේ කොහොමද?"

"දැන් ඉතින් සෝමේ ඕව ගැන හිතල වැඩක් නැහැ. අපි ඕව ගැන අමතක කරමු"

"කෝ අම්මේ අයිය?"

"ඒක තමයි පුතේ අපට තියෙන ලොකුම බය. කොයි වෙලේ හරි පොඩි හාමුව මරණවලු"

'අනේ අම්මේ අයියව පරිස්සම් කර ගන්ඩ. මට දැන් මොනව උනත් කමක් නෑ"

"අයියව ඇරිය කුරුණෑගල මාමලගෙ ගෙදර. මාමට විස්තරේ ඔක්කෝම කිව්ව. මාම කිව්ව අයියව එහේ තියා ගන්නම් කියල"

"අනේ හොඳයි"

අම්මාත් තාත්තාත් වාට්ටුව හාර හෙදිය ළඟට ගොස් කථා කරමින් සිටින අතර මලී මට තවත් ලං වූවාය.

"ඇයි බං උඹ මෙහෙම දෙයක් කර ගත්තේ"

"වෙන මොනව කරන්ඩද බං. ආයෙත් එක එකාට බිලි වෙලා කුණු ලෙඩ හදාගෙන මැරෙනවාට වඩා එහෙම මැරෙන එක හොඳයි කියල මට හිතුනා"

"මැඩම් උඹව එක්කගෙන ගියාට පස්සේ මටත් සිද්ද උනා එකෙකුට බිලි වෙන්ඩ. ඒක මහ මුදලාලි කෙනෙක්. හැබැයි අමනුස්සයෙක්"

“මට මහා පිළිකුලක් ඇති උනා මලී. මැඩම් තව එකෙක් එක්ක ඇවිත්ද කොහෙද. දෙවෙනි වතාවේ දොරට තට්ටු කරද්දී තමයි මම බිමට පැන්නේ”

අම්මාත් තාත්තාත් පැමිණි හෙයින් අපි කථාව නැවැත්වූයෙමු.

“දුවට මාසයක් විතර මෙහේ ඉන්ඩ වෙයිලු. ඔය දාල තියෙන බඳාම කපන තුරු අරින්නේ නැහැල්ලු”

“කමක් නෑ අම්මේ මට දැන් කොහේ උන්නත් එකයි”

ලෙඩුන් බලන වෙලාව හමාර වී සීනුව නාද වනු ඇසේ. කඳුළු පෙරාගත් අම්මා මාව ඉඹිබාය. තාත්තා මගේ හිස අතගෑවේය.

“අපි ගිහිං එන්නම් දුවේ”

ඒ අය ගිය පසු මම තනි වූයෙමි. අයියාව ගමෙන් පිට කර හැරීම ඉතාම හොඳය. ගමේ අය දැන් අප ගැන මොනවා කියනවා ඇද්ද? මොනවා කීවත් මොනවා කරන්ටද? විය යුතු විපත් සිදුවී හමාරය. මට දැන් සුදු බණ්ඩියියාට මුහුණ දීමට බැරිය. සුව වූ පසු මමත් මාමලාගේ ගෙදර යමි. පසුදිනට උදා විය. ඇඳේ වැතිර සිටින මට වේලාව යනවා නොදැනේ. ලෙඩුන් බලන වේලාවත් ලං වී ඇත. අම්මලා ඊයේ මා බැලීමට ආ නිසා අද කිසිවෙක් මා බැලීමට නොඑති. මම මදක් ඇස් පියාගෙන කල්පනා කරමින් සිටියෙමි. ටික වේලාවකින් කිසිවෙකු මගේ ඇඟට අත තබනවා දැනී මම ඇස් ඇර බැලුවෙමි. මාමා. මට සතුටක් ඇති විය. ඒ සමගම තවත් කවුද මේ ඉන්නේ.

“අනේ මේ මගේ රත්තරන් අයිය නේද. අයියේ මේ මොකද අයියගේ හැටි” කියා මට කෑ ගැසුණි. අයියා රැවුල කපා නැත. ඇඟපත වැහැරී ගොස්ය. මුහුණ රෞද්‍ර පාටය. ඇස් රතු වෙලාය. ඒවා තුළින් කඳුළු පිටවේ. පහතට නැමී සරමේ වාටියෙන් කඳුළු පිසදාගත් අයියා වේදනාවෙන් කථා කළේය.

“නංගියේ උඹට වෙච්ච දේවල් වලට මමත් වග කියන්ඩ ඕනැ. කිසි දෙයක් හොයා බලන්නේ නැතුව ඔකගේ කතාවලට රැවටිලා මාත් උඹව ඇරියා. ඔකවද … ඔකව මම …” කියමින් අයියා දත්මිටි කයි.

“අනේ මගේ අයියේ මම අයියට වඳින්නම්. ඔකා එක්ක පැටලෙන්ඩ නම් යන්ඩ එපා” මම ආයාචනාත්මකව කීවෙමි. අයියා නිහඬව ඈත අහස දෙස බලා සිටී. මම අයියාගේ මුහුණ දෙස බලා සිටියෙමි. එවිට මගේ සිත මා සමග මෙසේ කථා කරන්නට විය. ‘අනේ මගේ රත්තරන් අයිය දැන් පිස්සෙක් වගෙයි. චූටි කාලේ ඉස්කෝලේ යද්දි මාව වඩාගෙන ඒදණ්ඩෙන් එගොඩ කරවපු මගේ අයිය, වෙරළු ගහට නැගල ඇඟ පුරාම දිමි කනකොට ඒ ගැන නොතකා මට වෙරළු කඩා දීපු මගේ අයිය, මට ඉස්කෝලෙදි විහිලු කරපු කොල්ලන්ට පාරෙදි අල්ලගෙන ගහපු මගේ අයිය, මාව පත්තෑයෙක් කාල මං අඬද්දි බලා ඉන්ඩ බැරුව

අඬාපු මගේ අයිය, මං නැවුම් කළෙන් වතුර නාල ගෙට ආ දවසේ ටික ටික කැටේක එකතු කරපු සල්ලි වලින් මට කරාබු දෙකක් අරං දීපු මගේ අයිය, කකා ඉන්න බත් පිඟානෙන් මගේ පිඟානට මොනව හරි දාලා මගේ පිඟානෙන් බත් කටක් කාල යන මගේ අයිය. අනේ අයියේ මට වෙච්ච දේවල් ගැන අයියගේ හිතේ තියෙන් දුක මට තේරුම් ගන්ඩ පුළුවනි. අයියේ, මට මේ හිතෙන දේවල්ම ඔය ඇත බලාගෙන ඉන්න අයියටත් හිතෙනව ඇති. දැන් අප අතර පවතින නිහඬතාවය තුළ ගැබ්වී ඇති හැඟීම් පොතක් ලියන්ඩ තරමට ඇති' මෙවැනි දේ මා සිතන විට මාමා අපේ නිහඬතාවය බිඳිමින් කථා කළේය.

"අනේ දුවේ එදා ඉඳල මේ කොලුවට කෑමක් නෑ. රවුල කපන්නේ නෑ. නාන්නෙත් නෑ. මගේ බලේට අද උදේ යාමතම් ආප්ප දෙකක් කැවා. මේ ළමය මෙහෙම පිස්සෙක් උනාම තවත් දුකක් නේද?"

"අනේ අයියේ නොකා නොබී ඉන්ඩ එපා. අයිය හොඳට ඉන්ඩ ඕනැ. අපේ ගෙදරට තියෙන් ලොකුම හයිය අයිය නේද?"

"නංගියේ උඹ වෙනුවෙන් මට කරන්ඩ බැරි දෙයක් නැහැ. ඒව මං බලා ගන්නම්"

"අනේ අයියේ ගමේ නම් යන්ඩ එපා" මම කීවෙමි.

ටික වේලාවකින් දෙදෙනාම පිටවී ගියහ. පසුවදා කිසිවෙක් නොපැමිණියහ. දින තුනක් ගත වූවත් කවුරුත්ම ආවේ නැත. හතරවන දිනයේදී මාලී ඇගේ ලොකු අක්කා සමග මා බැලීමට පැමිණියාය. ඇගේ ලොකු අක්කා විවාහ වී පදිංචිව සිටිනුයේ මොරටුව් ය. මලීටත් දැන් ගමේ සිටි ම අපගසු නිසා අක්කාගේ ගෙදර ගිය බව කීවාය.

"ඉතින් මලී අපේ ගෙදරින් කවුරුත් ආවේ නැත්තේ ඇයි?"

"උඹලගේ අම්මටයි තාත්තටයි දෙන්නටම සනීප නැහැ. උන ගැනිල රෑයේ මම ගිහින් අක්කලගේ ගෙදර යන බව කීවාම උඹලගේ අම්ම කිව්ව මට ගිහින් බලන්ඩ කියලා. අයියත් ගෙදර නැනේ. ඉතින් මං කිව්ව අක්කයි මමයි නිතරම ගිහින් බලන්නම් කියල.එයාලාට ඉන්ඩ එපා කිව්ව"

"ඒක නම් හොඳයි ඒත් ඔයාලාට කරදරයක් නේද?"

"මොන කරදරයක්ද සෝමේ. අම්මල ඔච්චර දුර ඉඳල එන්ඩ ඕන නැහැ. අපිට ලඟයිනේ. අපි එන්නම්"

"ටිකට් කපන දවස් ළං වෙනකොට පණිවුඩයක් අරිමු නේද?"

"ඔව් එහෙම කරමුකෝ"

"සෝමේ මට ගමට ගියාට පස්සේ තමයි හාමුව ගැන හොඳ හොඳ විස්තර ආරංචි උනේ. ඕකගේ රස්සාව තමයිලු ඔය වගේ බලු වැඩ කරන එක. කෙල්ලෙක්ව ඔය වගේ තැනකට ගිහින් දුන්නම උෟට සෑහෙන මුදලක් ලැබෙනවලු. ඒ විතරක් නෙවෙයි. ඔය වගේ කෙල්ලන්ට ලැබෙන ළමයින්ව පිටරට අයට විකුණපුවම ළමයෙකුගෙන් උෟට සෑහෙන් ගාණක් ලැබෙනවාලු. ඔය අපේ ගමේ එහෙම සමහර කෙල්ලන්ව ඕක අමාරුවේ දාලා මඩම් වලට යැව්ව කියලත් ආරංචි උනා උඹට මතකද? ඒ ළමයින්වත් පිටරට වලට විකුණල හොඳ ගාණක් හම්බ කර ගෙන තියෙනවලු"

"මොනව මලී ඕකව ඉතුරු කරන්ඩ වටිනවයෑ"

"එක කැල්ලක්වත් ඉතුරු නොකර ඕකව කන්ඩ ඕනැ බං. උඹලගේ අයියටත් දරන්ඩ බැරුව ගියේ . . ." කියා මලී එක්වරම නිහඬ වූවාය.

"අනේ මගේ අයියව පරිස්සම් කර ගන්ඩ කියල මම අපේ මාමාට කිව්ව" මා එසේ කියන විට මලීත් අක්කාත් මුහුණට මුහුණ බලාගෙන සිටියේ අමුතු බියපත් ගතියකිනි. තවත් සති දෙකක් පමණ මේ විධියට ගෙවී ගියේය. ඒ අතරතුර මලී සහ අක්කා නිතරම මා බැලීමට ආහ. එහෙත් අපේ ගෙදරින් හෝ මාමලාගේ ගෙදරින් හෝ මා බැලීමට නොපැමිණීම ගැන මම පුදුම වූයෙමි. තව සතියකින් ටිකට් කපන බව දැනගත් මම එය මලීට කීවෙමු. ඇය අපේ ගෙදරට දන්වන බව පැවසුවාය. නියමිත දිනට මා කැටුව යාමට ආවේ අපේ මාමාය.

"ඇයි මමේ තාත්තයි අයියයි ආවේ නැත්තේ?"

"තාත්තාට තවම සනීප මදි දුවේ. අයියව ඉතින් මොකටද ගමේ අරින්නේ"

"දැන් මම යන්නෙත් මාමලගේ ගෙදරද?"

"නෑ දුවේ දුවගේ තාත්ත කිව්ව ගෙදර එක්ක එන්ඩ කියල. මොකද සිංහල බෙත් කරන්ඩ ඕනැලු දුවගේ ඔය අත් කකුල් කැඩිච්ච තැන් හොඳටම හොඳ වෙන්ඩ. දුවලගේ අල්ලපු ගමේ වෙද මාම බොහොම දක්ෂලු ඔය වගේ දේවල් වලට. ඒ හින්ද අම්මයි තාත්තයි දෙන්නම කිව්ව දුවව ගෙදර එක්ක එන්ඩ කියලා"

"අනේ මාමේ මං කොහොමද ගමට මූණ දෙන්නේ"

"දැන් ඒව ගැන බය වෙන්ඩ දෙයක් නැහැ. මුළු ගමම දැන් හාමුල එක්ක විරුද්ධයි. කවුරුත් දැන් උන් එක්ක කතා නෑ. මේ වැඩ හින්ද ගමටම එපා වෙලා"

මට යාම්තම් අඩිය තැබිය හැක. ඒත් කොර ගසමින්ය. අත සෙලවිය නොහැක. මාමා මාව වත්තන් කරගෙන කුලී රථයකින් දුම්රිය ස්ථානයට කැඳවාගෙන ආවේය. ඉන්පසු දුම්රියෙන් ගමන් කළ අප එතැන් සිට අපේ ගමට ගියේ කුලී කරත්තයකින්ය.

ගෙවල් කිට්ටු වන විට මට මහා මූසල ගතියක් දැනුණි. හාමු මහත්තයලාගේ ගෙවල් සීමාවට එන විට හැම තැනම ඉරී ගිය සුදු කොඩි හා අඩක් ගැලවී ගිය දැන්වීම් තිබෙනු දුටුවෙමි. එම දැන්වීම් වලින් එකක් ගැලවී තිබුණේ නැත. හාමුගේ රුවට සමාන රූප දෙකක් එම දැන්වීමේ විය. නිවන් සැප ලැබේවා යන අකුරු ටික මට හොඳින් පෙනුනි. මගේ හදවත ගැහෙන්ට විය. කුමක් හෝ සිදුවී දින කීපයක් ගතවී ඇති බව ඉරුණු ගැලවුණු දැන්වීම් වලින් සිතා ගත හැකි විය.

"අනේ මාමේ මොකද වෙලා තියෙන්නේ" මම වටපිට බලමින් ඇසුවෙමි.

"යමුකෝ දුවේ ගෙදර"

"අනේ කියන්ඩකෝ මාමේ කෝ අපේ අයිය" මම මාමාගේ අතේ එල්ලුනෙමි.

මාමා කිසිත් කථා නොකරයි. මගේ උගුර හිර විය. මට අයියා සිහි විය. කුමක් හෝ විපතක් සිදුව ඇත. මට හැඬුම් ආවේය.

"අ ... නේ මා ... මේ"

"දුවේ නාඩා ඉඳින් දැන් ගේත් ළඟයිනේ"

මම අපේ වත්ත දෙස බැලුවෙමි. වැස්සට සේදී පරණ වූ සුදු කොඩි දෙකක් අපේ ඉදිකඩුල්ල දෙපස විය. කරත්තය වත්තට හරවා නතර කෙරුණි. අම්මාත් තාත්තාත් කරත්තය ළඟට පැමිණ මා වත්තන් කරගෙන ගෙට යද්දී වත්තේ ඈත කොණක වේලී ගිය ගොක් රැන් කීපයක් මගේ නෙත ගැටුණි.

"අම්මේ මොකද අම්මේ වෙලා තියෙන්නේ" මම කෑ ගැසුවෙමි. අම්මාද මා බදාගෙන කෑ ගසා ඇඬුවාය. එවිටම අපේ හිතවත් අසල්වැසි අයද අපේ ගෙදරට දුව එන්ට වූහ. තාත්තාත් මල්ලිත් නංගිත් හඬති. මම මහා හඬින් කෑ ගසා මෙසේ කීවෙමි.

"ඇයි දෙයියනේ කවුරු හරි මට කියාපල්ලකෝ මොකද උනේ කියල"

එවිට මාමා මා ළඟට ආවේය. මාව පරිස්සමින් අල්ලාගෙන ඇඳ මත වාඩි කරවීය.

"මේකයි දුවේ වෙලා තියෙන්නේ. එදා මමයි අයියයි උඹව බලල ඉස්පිරිතාලෙන් අපේ ගෙදර ගියා. පහුවදා පාන්දරම මටත් හොරෙන් අයිය මෙහෙ ඇවිල්ලා. මේ ගෙදර අයටත් හොරෙන්ම ගිහින් පොඩි හාමුට පිහියෙන් ඇනල මරල. ඒක ඉවසන්ඩ බැරුව ලොකු හාමු අයියට වෙඩි තියල ලොකු හාමුත් වෙඩි තියාගෙන. එදා එතන මරණ තුනයි"

මේ පුවත ඇසෙනවාත් සමඟම මට කුමක් වූයේ දැයි මම නොදනිමි. මට සිහිය එන විට හොඳටම රෑ වෙලාය. එවිට වෙද මාමා මගේ හිස අතගාමින් ඇඳ

උඩ වාඩිවී සිටියේය. අම්මාත් තාත්තාත් සුදුබණ්ඩයියාත් ඇද ලඟ සිටිනවා මට පෙනුණි. අයියාගේ මරණය වෙනුවෙන් මට අඩන්ට බැරි වූ නිසා එදා රෑ එළිවන තුරු මම කෑගසමින් ඇඬුවෙමි.

# මරණයේ සෙවනැලි

අපි එදා නිවාඩුවට ගෙවල් බලා එමින් සිටියෙමු. මඩකලපුවේ සිට කොළඹ බලා එන බසය මගීන්ගෙන් පිරී තිබුණි. බසය ගමන් කරමින් තිබුණේ කැලෑවෙන් වටවූ පාරේය. හදිසියේම බසය නතර විය. කවදත් බියෙන් සැකෙන් මේ පාරේ ගමන් කරන අපි ඇත්තටම බිය වූයෙමු. නිල ඇඳුම් ඇඳගත් තරුණයෝ පිරිසක් බසය නවතා සිටිති. ඔවුන්ගේ අත්වල ආයුධ විය. තැතිගත් කවුරුත් ප්‍රශ්නාංකය රැඳි මුහුණු වලින් ඔවුන් දෙස බලා සිටිති.

“බැහැපියව් ෂේරම බිම” ඔවුන්ගෙන් එකෙකු තර්ජනය කළේ අව්‍යක්ත සිංහල ස්වරයෙනි.

“දෙමළ අය ආපඃු පලයව්. මුෂ්ලිම් අයත් දුවපියව්” කියමින් ඔවුහු කීප දෙනෙකුට පහර දුන්හ. හැමෝගේම හැඳුනුම්පත් පරීක්ෂා කර එසේ පැවැසූ ඔවුහු අප එකොලොස් දෙනාව නතර කර ගත්හ.

“තොපිල ෂිංහලයෝ නේද. නැගපියව් බෂ් එකට” කියා අපට අණ දුන් අතර රියැදුරු අසුනේ වාඩිවූයේ නිල ඇඳුම් ඇඳගත් අයෙකි. ඔහු සමඟ සිටි අනිත් අයද බසයට ගොඩවූහ. එතැන් සිට ඔවුන් කථා කළේ දෙමළ බසිනි. අපට ඒ කිසිවක් නොවැටහුණි. අප එකොලොස් දෙනාගේම හදවත්වල ගැස්ම එකිනෙකාට ඇසෙන තරම්ය. වහලය කඩා වැටුණු නිවසක සුන්බුන් වලට හිරවී සිටිනවුන් සේ කිසිවක් කරකියා ගත නොහැකි අපි එකිනෙකාගේ මුහුණු දෙස අසරණව බලා සිටියෙමු. ටික දුරක් ගිය බසය අතුරු පාරකට හරවන ලදී. එහි ටික දුරක් ගොස් එය නතර විය.

“බැහැපියව්” අපට අණ ලැබුණි. වෙව්ලන දෙපාවලින් අපි බිමට බැස්සෙමු.

අපව කැලෑ පාරකට යොමු කළ ඔවුහු අපට ඉදිරියෙනුත් පිටුපසිනුත් ගමන් ගත්හ. මෙසේ ටික දුරක් ගොස් කැලෑවෙන් වැසුණු කුඩා නිවසකට අපව දමා දොරගුළු දමා අපට මෙසේ තර්ජනය කළහ.

“පැනල යන්ඩ හැදුවොත් තොපිලව කුඩු කරනව. ෂිංහල බල්ලෝ”

අගුළු දැමූ මේ කුටිය තුළ සිරකරනු ලැබූ අපි දුකෙන් හා බියෙන් අප එකිනෙකාගේ මුහුණ දෙස හද පත්ලෙන් නැගෙන් සෙනෙහසින් බලා සිටියෙමු. අප තුළ ඇති මරණ බිය නිසාම අපි එකිනෙකාට ලංවී සිටියෙමු. සැමගේම මුහුණු වල මරණයේ සෙවනැලි වැටී තුබුණි. හැඬුම්බර දෙනෙත් හා වෙව්ලන අත් පා සහිත අප එකිනෙකාට වඩාත් ලංවී සිටියේ වෙන කාගේවත් හව්හරණයක් නොමැති නිසාය. අපේය කියා කිව හැකි අපට ආදරය කරන හා අපේ ආදරය ලබන කිසිම කෙනෙකුගේ පිහිටක් නැතුව මරණයේ දොරටුවට ලංව සිටින අපට සිටින එකම ආරක්ෂකයෝ අප එකොලොස් දෙනාමය. අපේය කියා සිතා සිටි අයගේ මුහුණු මනසේ ඇඳෙමින් අපේම කඳුළු වලට බොඳවී යද්දී අපේ දුක දකින්නට සිටින්නේ අප එකොලොස් දෙනාම පමණයි නේද? අප අතර සිටි තලතුනා වයසේ නිලධාරි මහතෙක් සුසුම් ලමින් හඬන්නට විය. තවත් කීප දෙනෙක් ඉකිගසති. මටද හැඬුම් ආවේය. එක් වැඩිහිටියෙක් මෙසේ කියමින් අප දෙස බැලීය.

“දරුවනේ අපි මොන වරදක් කළාටද මේ?”

තවත් වැඩිහිටියෙක් තරුණ අය දෙස බලමින් මෙලෙස තම දුක කියන්ට විය.

“අනේ මට දරුවෝ හය දෙනෙක් ඉන්නව. තාම එක් කෙනෙක් වත් රස්සාවක් කරන්ට පුළුවන් අය නෙමේ. මං නැති උනාම උන්ට යන කල දසාව … දෙවියනේ”

එවිට තව තවත් අය මෙලෙස එකිනෙක විලාප නගන්ට වූහ.

“අපේ ගෙදර තත්වය ඊට වඩා අන්තයි. නෝන ලෙඩින්. දුවගේ මහත්තය මැරිල. ඒ පවුල බලන්නෙත් මම … අපෝයි මේ දුක කොහොම ඉවසන්ඩද” කියමින් ඔහු දෑතින් හිස බදාගෙන බිම වාඩි විය.

“දුවගේ කසාදෙට සුමානයයි තියෙන්නේ. ඒ වැඩ ටික ඉවර කරල එන්ඩ හිතාගෙනයි මේ ගමන පිටත් උනේ. කවුද හිතුවේ මෙහෙම මග නවතින්ඩ වෙයි කියල” පැවැසූ තවත් අයෙක් දෑතින්ම තම හිසකෙස් අදිමින් හඬයි.

“මගේ නෝනට පළමු බබා හම්බවෙන්ට ඉස්පිරිතාලෙට ඇඩ්මිට් කළා කියල කෝල් එකක් ආව. ඒ හින්දයි මම යන්ඩ ආවේ” කියමින් මම බිත්තියට ඔලුව හේත්තු කර ගතිමි.

“දැන් ඉතින් පුතේ අපි ඔක්කොටම එකම ඉරණම තමයි … අය්යෝ … මේ දුක ලෝක පාලක දෙව්වරුන්ටවත් පෙනෙන්නේ නැද්ද දෙයියනේ” ඒ තවත් වැඩිහිටියෙකි.

ඒ අතර තවත් අයෙකු නැගූ විලාපයකින් අපි හැම දෙනාම වෙව්ලා ගියෙමු.

“පත්තරයක තියෙනව මං දැක්ක මුං අපේ මිනිස්සුන්ව ප්‍රාණ ඇපකාරයො හැටියට තියා ගන්නවලු කියල”

“උන් ඉල්ලන දෙවල් නොලැබුණොත්”

“නොලැබුණොත් අපිව මරල දමයි. නැත්නම් සදහටම උන්ගෙ අත් අඩංගුවෙ තියාගනියි. අපට එහෙම උනොත් අපේ ගෙවල් වල අය පොලොවේ හැපිල මැරෙයි” ඔහු පසුව උමතුවෙන් මෙන් එහා මෙහා දුවන්ට විය. ඇත්තෙන්ම ඔහුගේ සිහිය විකල් වේගෙන එන බව පෙනුනි.

අප අතර තරුණයෝ දෙදෙනෙක්ද වූහ. ඒ අය තවම කිසිත් කතා නොකළහ. හැම දෙනා දෙසම බලමින් කල්පනාකාරී ලෙස හැසිරෙන මේ තරුණයන් දෙදෙනා දැකීමද දුබල සිත් ඇති අපට තරමක සැනසීමක් විය. අර කලින් සිහි විකල්වූ තැනැත්තාගේ තත්වය දැන් තවත් දරුණුය. හැසිරීම හා බැල්මද අමුතුය. හෙමින් හෙමින් මොනවාදෝ දොඩවයි. දැන්නම් කාට උනත් සිහි විකල් වීම පුදුමයක් නොවේ. අර තරුණයෝ දෙදෙනා අන් අයව සැම විටම සනසමින් නොයෙකුත් දේ කියති. අපව දිරි ගැන්වීමට ඔවුන් ගන්නා උත්සාහය ප්‍රසංශනීයය.

“මේ අංකල්ල අයියල පොඩ්ඩක් කලබල නොවී ඉම්මුකෝ. අපි උත්සාහ කරල බලමු කොහොම හරි මෙතනින් පැන ගන්ඩ. එහෙම නැතුව මෙහෙම හැමෝම හිත දුර්වල කරගෙන බැහැනේ”

“අනේ පුතේ පුතාලාට ඇහුණේ නැද්ද අරුං කිව්ව පැනල යන්ඩ හැදුවොත් අපට කරන දේ”

“හරි අන්කල් ඒ ඉතිං පැනල යන්ඩ හදල උන්ට අහු උනොත්නේ. උන්ට හොරෙන් කොහොම හරි පැන ගත්තොත් උං අපට මොනව කරන්ඩද” එසේ කී තරුණයා වහලයත් බිත්තියත් අතර සිදුරින් එල්ලී ඇත බලා මෙසේ කීවේය. “මිදුලේ ඉන්නව උන් තුන්දෙනෙක්. වත්තෙත් ඉන්නව දෙන්නෙක්”

“ඉතින් කොහොමද පුතේ එවුන්ගෙන් බේරිලා යන්නෙ”

ඒ අතර අර සිහි විකල්ව සිටි මිනිසා බිත්තියට ගසමින් දොඩවයි. “ලොකු දුවේ ලොකු දුවේ අර බලපන් වූටි මල්ලි අඩනව. ඌට කිරි ටිකක් හදල පොවල හිටපන් පුතේ. පස්සේ උයාගන්ඩ පුළුවන්. උඹලගේ අම්මට කොච්චර කිව්වද මම රට යන්ඩ එපා කියලා. ඇහැව්වයැ. සල්ලි! සල්ලි!! ඒ ගැනිට සල්ලි පිස්සුව හැදුන. හහ් හහ්” ගා ඔහු වියරු සිනහවක්ද පායි. කුමක් කරන්ඩද අපි හැමදෙනාම මරණයට පෙලගැසී සිටින්නෝ වෙමු. ක්‍රමයෙන් අඳුර වැටෙන්ට පටන් ගෙන ඇත. බඩ තුළින් උඩට විත් හදවත දවාගෙන මතුවන ගිනි දලුවක් අපව අලු කරන්ට තරම් වේගයෙන් එළියට එන්ට යත්න දරන්නා සේ දැනේ. මානසික වේදනාව හැම දෙනාගේම සිත් අවුල් කර ඇත. කඳුලින් පිරි දෙනෙතින් හා කෝපයෙන්ද ශෝකයෙන්ද දැවෙන අපේ හදවත් හැර අප සතු වෙන කිසිවක්

නැත.

අනේ මගේ බිරිඳ, ඇයට දරුවා ලැබී ඇත්ද? ඒ දරුවාට පියා දැකීමට වරම් නැද්ද? යනුවෙන් මගේ හදවත පෙලූ වේදනාව දරා ගත නොහැකිව මම හඬමින් බිම වැතුරුනෙමි. එවිට අර තරුණයන් දෙදෙනාගෙන් කෙනෙක් මා ළඟ බිම වාඩිවී මගේ හිස අතගාමින් මෙසේ කියන්ට විය.

"නැගිටින්න අයියේ නැගිටින්න. අයියාගේ හිතේ තියෙන වේදනාව මට නොතේරෙනව නෙවෙයි. අයියත් අපි වගේම තරුණයි. ඒ හින්ද අයියත් අපි දෙන්න එක්ක එකතු වෙලා මොනව හරි කරන්ඩ බලමු. අනිත් වැඩිහිටි අය මානසික වශයෙන් අපට වඩා දුර්වලයි. නැගිටින්න අයියේ. වතුරේ ගිලෙන්ඩ යන මිනිහ තුත්තිරි ගහෙත් එල්ලෙනවලුනේ. ඒ හින්ද අපිත් මොනවා හරි කරමු අයියේ"

මම නැගී සිටියෙමි. "ඔව් මල්ලි අපි මොනව හරි කරමු"

ඒ දෙදෙනා නිතරම ක්‍රියාශීලිය. අනිත් තරුණයා වහලයේ පරාලය අල්ලාගෙන හූනෙකු වගේ බඩගාමින් උළු කැටයක් උස්සා ඒ සිදුරෙන් ඈත බැලුවේය. එවිට ඔහුට දකින්ට ලැබී ඇත්තේ අපේ සිර කුටිය දෙසට එන කීප දෙනෙකි.

"අයියේ උන් කීප දෙනෙක් මේ පැත්තට එනවා. බය වෙන්ඩ ඕන නැහැ. බය උනත් නැතත් අපි මේ තත්වයට මුහුණ දෙන්ඩ එපායැ' එසේ කියත්ම හැම දෙනාම එකම අයිනකට ගුලි වූහ. දොර ඇරියේ ඔවුන්ය. වේවල් කූඩයක් හා ප්ලාස්ටික් බූලියක් ඔවුන් අත විය. අපේ දෙදෙනෙකු ක්ලාන්ත වී බිම ඇද වැටුණි.

"මේකේ තියෙන පාන් කාපියව්. වතුර බීපියව්. අපිට තොපිලාගෙන් වැඩ ගන්ඩ තියෙන්නෙ හෙට. එතකං මේ ඇතුලෙ ඉඳපියව්"

නැවත දොර වැසුනි. ටික වේලාවකින් බිත්තිය හා වහලය අතර සිදුරෙන් පිටත බැලූ අර තරුණයා කීවේ ඔවුන් දෙදෙනෙකු ගසක් යට වාඩිවී ආයුධ සහිතව මුර කරන බවය. අප එකිනෙකා කථා නොකළත් හැමගේම සිත්වල පැවතියේ එකම හැඟීම් විය හැක. අපට කවදාවත් ගෙදර යන්ට ලැබෙන්නේ නැහැ. හෙට අපට මොනවා වේවිද? අපේ ගෙවල්වල අය මොනවා හිතාවිද? මේ ආදි හැඟීම් වලින් යුතුව හැමෝම එකිනෙකාගේ මුහුණු දෙස බලා සිටිති. අර තරුණයෝ දෙදෙනා පමණක් එඩිතර ලෙස හැසිරෙති. සිහි නැතුව ඇද වැටී සිටි දෙදෙනාට වතුර ඉස පවන් සැලූ ඒ තරුණයන් සිත් සැනසීමට කියන දෙවල් හැමෝම අසා සිටිති.

"අනේ පුතේ උඹල දෙන්න අපට අපේම දරුවෝ වාගේ. උඹල දෙන්න නොහිටින්ඩ මෙලහකටත් අපි බයේම මැරිල" යි වැඩිහිටියෙක් පැවසීය.

අර දෙදෙනාට සාත්තු සප්පායම් කළ පසු තරුණයන් දෙදෙනා ඊළඟට ගියේ පාන් කුඩය ලඟටය. ඒ දෙස උපහාසයෙන් බැලූ එක තරුණයෙක් එයට පයින් ගහා පෙරලා දැමූ අතර අනිත් තරුණයා වතුර භාජනය ඇර නහයට ලං කර බලා අවශ්‍ය නම් වතුර බොන ලෙස අපට කීවේය. හැම දෙනාම ඇති පදම් වතුර බීවෝය. නැවතත් එකිනෙකා විලාප නගති. ඒ හැර වෙන මොනවා කරන්ටද? සමහරු වරින් වර සිහි නැතිව වැටෙති. අර උමතු වූ තැනැත්තා තවමත් දොඩවයි. "ලොකු දුවේ ලොකු දුවේ කෝ පොඩි එකා" ඔහු කෑගසයි. මධ්‍යම රාත්‍රිය පසුවන තුරුම එකිනෙකා වරින් වර නගන ශෝකාලාප වලින් නම් අඩුවක් නැත. තරුණ දෙදෙනා මා ලඟට විත් මෙසේ කීහ.

"අයියේ අපි කොහොම හරි මුංගෙන් බේරෙන්න ඕනෑ. අපිට හිතෙනව උන් දොර අරිනකොටම පැනල ආයුධ උදුරගන්ඩ. ඒවයින්ම උන්ව මරල කැලයට පැනගන්ඩ. නැතුව නිකම්ම කැනහිල්ලු වගේ මැරෙන්ඩ ඕනෙ නෑ නේද අයියේ"

"ඔව් මල්ලි අපි එහෙමවත් කරමු"

මා එසේ පැවසුවත් එය ලෙහෙසියෙන් කළ නොහැකි දෙයක් බව මගේ සිත කියයි. එවිටම හදිසියේ පාර දෙසින් වෙඩි හඬක් ඇසුණි. ඒ සමගම වෙඩි වරුසාවක් කැළය දෙසින්ද ඇසෙන්ට විය. හැමෝම නැගිටගෙන එක් තැනකට වූහ. තරුණයෝ දෙදෙනා දෑත් දිගු කර සැම දෙනාම වටකර ගත්හ.

"බය වෙන්ඩ එපා. ඔය ඇහෙන්නේ දෙපැත්තකින්ම වෙඩි හඬවල්. හමුදාව හා සතුරන් අතර වෙඩි හුවමාරුවක් වගෙයි. මොනවා උනත් බය වෙන්ඩ එපා" ඒ වචන ඇසෙන විට මට මතක් වූයේ මද්දුම බණ්ඩාර කුමරුය. මේ දෙදෙනාද එවැන්නන් දෙදෙනෙකි.

ඒ අතර ජීප් රථයක හඬ සමග නැවතත් වෙඩි හඬවල් ඇසෙන්නට විය. අපට කිසිවක් නොවැටහුණි. එවිටම අපේ කුටිය අසල බොහෝ දෙනෙක් ගැවසෙන බව වැටහුනේ පා ගැටෙන හඬිනි. අපට කුමක් සිදුවීමට යන්නේදැයි ඇතිවූ බියෙන් අපේ ඇදුම් ඩහදියෙන් තෙත්විය. එවිටම කවුරු හෝ දොර කඩාගෙන ඇතුළට පිවිසියහ. ඒ අය අත විදුලි පන්දම්ද විය. අපේ සමහරු සිහිසුන්ව ඇද වැටුනහ. මමත් අර තරුණයෝ දෙදෙනාත් පැමිණි අය දෙස විමසුම් ඇසින් බැලුවෙමු.

දෙවියනේ මේ අපේ ඉටු දෙවිවරුන් නේද? ඔව් ඔව් අපේ හමුදා සොහොයුරෝ. ඒ සමගම වැටී සිටි අයත් වෙව්ලන අයත් අසලින් වහනය වූයේ වැසිකිලි වලකින් පිටවන දුර්ගන්ධයයි. ඔව් ඇත්තෙන්ම ඔවුන්ට මල පහ වී ඇත.

"හරි හරි ඉක්මන් කරනව. අපි ආවේ තමුසෙලාව බේර ගන්ඩ. ඔය වැටිල ඉන්න අයව ඉක්මනට ගම්මු"

මට ඇතිවූ ධෛර්යය කෙබඳු එකක්දැයි කිව නොහැක. මම දෙදෙනෙකුවම

ඔසවා ගතිමි. මල පහවී අවසිහියෙන් දහලන අපේ අයව අර තරුණයන් විසින් ඔසවාගෙන ගියේ කිසිම පිළිකුලක් නැතිවය. අපේ හමුදා සොහොයුරන්ද ක්‍රියා කළේ ඊටත් වඩා උත්තම අයුරිනි. හැම දෙනාවම ජීප් රථ වලට නංවා ගන්නා අතර කැලෑව දෙසින් තවත් වෙඩි හඬවල් ඇසෙන්ට විය. අපේ හමුදා සොහොයුරන්ද ඊට පිළිතුරු දෙමින් අප රැගත් වාහනය ආරක්ෂා සහිතව තවත් සන්නද්ධ වාහන දෙකක් මැදින් ගෙන යනු ලබන්නේ හමුදා කඳවුරකටය.

මෙතෙක් මරණ බියෙන් වෙව්ලමින් සිටි සැවොම නව පණක් ලද්දවුන් මෙන් ජීප් රථය තුළ ගමන් කරති. ඇඳුම්වල මල පහවී සිටි අයගේ මුහුණුවලින් දිස් වූයේ ලැජ්ජාව මුසුවූ ප්‍රීතියකි. මෙතෙක් මරණීය තර්ජනයක් මැද කල්පනාකාරී ලෙස හැසිරුණු අර තරුණයන් දෙදෙනා තුළ දිස්වූයේ ඔවුන්ගේ සහජ දඟකාර කෙලිලොල් ගතියයි. ඒ අය මල පහවී සිටි සොහොයුරන් දෙස බලා කරුණා සහගත මුහුණින් පොඩි සමච්චලයක්ද කළහ.

"මේ අයියල එහෙම හමුදාවට බැඳිල හිටියනං" යයි එක්කෙනෙකු පැවසූයේ උපහාසය රැඳි දෙනෙතිනි. එවිට අනිත් තරුණයා මෙසේ කීය. "අපෝ එහෙම උනානම් යුනිපෝම් වල තත්වය මොකක්ද"

ඒ ඇසූ කවුරුත් සිනාසුනහ. ජීවිතයේ කිසිම දිනක නැවත සිනාසීමට නොලැබේයයි සිතා සිටි අපට දැන් සිනාසීමටද පුළුවන. එවිට හමුදා සොහොයුරන්ගෙන් කෙනෙක් කරුණාව මුසු බැල්මක් අප වෙත හෙලා මෙසේ පැවසීය.

"ඔහොම තමයි මල්ලි මිනිස්සු කවුරුත් මරණයට බයයි. මරණය කොයි තරම් බිය ජනකද කියන එක මේ අයගේ තත්වය දිහා බලනකොට ඔයාලාට වැටහෙන්ඩ ඇති"

"කඳවුර තව ටික දුරයි. එහෙදි ඔහේලට ඇඳුම් මාරු කරගෙන පිරිසිදු වෙන්ඩ පුලුවනි" කියා පැවසූයේ තවත් හමුදා සොහොයුරෙකි.

"සර්ලට දේවත්වය ලැබෙන්ඩ ඕනැ අපේ ජීවිත බේරල දුන්නට"

"සර්ල දෙවිවරු වගේ අපි ගාවට කඩා පාත් උනේ නැත්නම් අපි ඔක්කොම ඉවරයි"

"සර්ලගේ පවුල්වල අයටත් පිං අත්වෙනව අපේ ජීවිත බේරල දුන්නට"

මේ ආදි වශයෙන් එකිනෙකා පවසන වදන් අසා සිටින හමුදා සොහොයුරෝ කරුණාවෙන් අප දෙස බලති. අර සිහි මද ගතියෙන් සිටි තැනැත්තා දැන් නිහඬය. මේ හදිසි වෙනස් වීමෙන් ඔහුගේ මනසද වෙනස් වී ඇත. කාගේත් මුහුණු වලින් පිළිබිඹු වූයේ අර කුටිය තුළ සිටියාට වඩා හාත්පසින්ම වෙනස් ප්‍රතිරූපයන්ය. බලාපොරොත්තුව හා ප්‍රීතිය මුහුණුවල ලියැවී ඇත. සමහරු කෘතඥ පූර්වක

දෙනෙත් වලින් හමුදා සොහොයුරන් දෙස බලා සිටිති. සමහරු දේව ප්‍රතිමා දෙස බලන්නවුන් සේ භක්ති ආදර බැල්මෙන් ඒ අය දෙස බලා සිටිති.

"සර්ල කොහොමද අපි ගැන දැන ගත්තෙ" යයි මම ඇසුවෙමි.

"ඔයාල එක්කම බස් එකේ ආ දෙමළ මහත්මයෙක් අපට ආරංචිය දීල ගියා"

"මොනව" අපි පුදුම වූයෙමු.

"පුදුම වෙන්ට දෙයක් නැහැ. අද රටේ තියෙන්නෙ සිංහල දෙමළ අරගලයක් නෙමෙයි. ත්‍රස්තවාදි අරගලයක් පමණයි" කියා හමුදා සොහොයුරා පැවසීය.

හමුදා කඳවුරේදී අපට අවශ්‍ය සෑම දෙයක්ම ලැබුණි. අවශ්‍ය අයට ඇඳුම්ද සෑමටම කෑමද නිදා ගැනීමට ඉඩකඩද ලැබුණි. නමුත් අපට නින්දක් අවශ්‍ය නැත. අපේ ජීවිත ගලවා ගැනීමට ලැබීම කෙතරම් භාග්‍යයක්ද. අපේ හමුදා සොහොයුරන් අපට කෑමට දුන්නේ ඒ අයගේ කෑමෙන් කොටසක් වන්නට ඇත. පරිත්‍යාගශීලී ජීවිත ගත කරන ඒ අයට එය සුළු දෙයක් වෙන්නට ඇත. මේ අය තම ජීවිත පවා පුද කරන්නේ අප වෙනුවෙනි.

පසුදින අපව ගුවන් යානයකින් කොළඹට එවීමට සූදානම් වෙද්දී අපගේ ජීවිත බේර දුන් අපේ ඉටු දෙවිවරුන්ට වැඳ අපි සමු ගතිමු. ක්‍රමයෙන් යානය ගුවන් ගත වෙද්දී අප බිම බලාගෙන සිටියේ අපේ හමුදා සොහොයුරන්ගේ රූප ඉතාම කුඩා මිනිසුන් බවට පත් වී නොපෙනී යන සැටියි. යානය සැහෙන දුරක් ගුවන් ගතවූ විට ඒ රූප නොපෙනී ගියත් අපේ හදවත්වල ඇඳී ඇති ඒ අයගේ රූප සදා නොමැකෙනු ඇත.

# හොරෙක්

මම කාමරය තුළ පාඩම් කරමින් සිටියෙමි. නංගි අල්ලපු ගෙදර රමණී සමග මිදුලේ වාඩිවී කථා කරමින් සිටියාය. වරින් වර ඔවුන්ගේ උකුළු මුකුළු සිනා හඬ මගේ සවනට වැටේ. එහෙත් මම අවධානයෙන් මගේ වැඩවල යෙදීමට උත්සාහ කළෙමි.

"ඒයි අර බලපන්කො" ඒ නංගිගේ හඬය.

"ඉදා හරි කෝලමක්නේ" ඒ රමණීගේ හඬය.

"අන්න බං ආයෙත් බලන් ඉන්නව" දෙදෙනාම සිනාසෙති.

"නොදෝකිං විතරක් මූණෙ හැටි. හරියට බකමූණෙක් වගේ"

"මූණ ලස්සන නම් තව බැලුවත් කමක් නෑ"

"ඒයි ඌ බලන්නේ නම් මනමාල සයිස් එකෙන් නෙමේ"

"හොරෙක්ද දන්නෙත් නෑ නේද"

ඒ වචන ඇසෙත්ම මම ජනේලයෙන් පිටත බැලුවෙමි. නංගි කලබලයෙන් ගේ දෙසට එමින් මෙසේ කීවාය.

"පොඩි අයියේ, පොඩි අයියේ, හොරෙක්ද කොහෙද"

"කෝ? කෝ?" මම මිදුලට පැන්නෙමි. අපේ කම්බි වැට අයිනේ අන්දර ගස් පෙළට උඩින් නාඳුනන මුහුණක් පෙනේ. මම ඒ දෙසට ළං වූයෙමි.

"මොකද මිනිහෝ?" මම ප්‍රශ්න කළෙමි. ඔහුගෙන් කිසිම ප්‍රතිඋත්තරයක් නැත.

"තමුසේ කවුද? මොකද ඔතන ඉන්නේ"

කිසිම පිළිතුරක් නොදුන් ඔහු පාරට පැන දුවන්ට විය. මමත් "ඔන්න හොරෙක්! හොරෙක්!!" කියා කෑගසමින් පාරට දිව්වෙමි. ඒ සමගම අවට ගෙවල්වල ගැහැණු පිරිමි කොයි කවුරුත් දුවගෙන ආහ.

"අල්ලපියව් ඔන්න හොරෙක්"

"හොරෙක් හොරෙක් අල්ලපියෝ" දැන් හැම දෙනාම කෑගසමින් ඔහු ලුහු බඳිති. ඔහු සරමේ වාටිය දැතින් ඔසවාගෙන වේගයෙන් දුවයි. අපේ කෑ ගැසීම් හඬට එක් වන සෑම ගෙදරකම අය අප සමඟ ඔහු පසුපස දුවති. අප කෙතරම් වේගයෙන් දිව්වත් ඔහුගේ ධාවන වේගය ඊට වැඩිය. කවුරු කවුරුත් කෑගසමින් හති අරිමින් දුවති.

"යන්ඩ දෙන්ඩ එපා ඕකා හොරෙක්"

"ඔන්න හොරෙක්"

පාරේ එකම ඝෝෂාවකි. දැන් කවුරුත් කිලෝ මීටරයක් තරම් දුර දුවන්ට ඇත. ඒ සීමාවේ කැලෑ ඉඩම් කට්ටියකි. වේගයෙන් දිවූ ඔහු කැලෑවට පැන ගත්තේය.

"දැන් මොකද කරන්නේ" කෙනෙක් අසයි.

"අපි හැම පැත්තෙන්ම වටලමු. ඔය කට්ටිය ඔය පැත්තෙන් යන්ඩ. අපි මේ පැත්තෙන් යමු හරිද"

දැන් කවුරුත් කැලය පිරති.

"සද්ද නැතුව යමු. ඕක මේ ළඟම හැංගිලා ඇති" කෙනෙක් පවසයි. හැමෝම ඔහු සොයති.

"කවුරු කවුරුත් කල්පනාවෙන්. ඕක ළඟ ආයුධ එහෙම ඇද්ද දන්නේ නෑ" ඒ ඇසූ සමහරු මග හරින්ට සූදානම් වෙති.

"මේ පිස්සු නැතුව යමල්ල. ආයුධ තියෙනව නම් ඕක ඔහොම අත පය කඩාගෙන දුවයිද?" රොමයියා අසද්දී කවුරුත් සිනාසුනහ. ටික වේලාවකින් කැලයේ අනිත් පැත්තෙන් ඝෝෂාවක් ඇසෙන්ට විය.

"හරි හරි හොරා ඇල්ලුවා. හැමෝම පාර අයිනට වරෙල්ලා"

අපි හැමෝම ඒ දෙසට දිව්වෙමු. එවිට අපට දැක ගත හැකි වූයේ කටු ඉපල් ආදියට සීරී සුළු තුවාල සහිතව අල්ලාගෙන සිටි ඔහුය. පෙනුමෙන් ඔහු එඩිතර පාටය. කිසිම බියක් සැකක් ඔහු කෙරෙන් නොපෙනේ.

"මූ නම් හොරෙක්ම තමයි"

"හොරෙක් නෙමෙයි මූ මහ මදාවියෙක්. පේන්නේ නැද්ද හැටි"

"කතා කරපන් මිනිහෝ. උඹ කොහේ ඉඳලද එන්නේ"

"පේනවද ගල් ඉබ්බා වාගේ ඉන්න හැටි"

"කතා කරන්ඩ බැරිද මිනිහෝ උඹට"

"ලොක කට්ටයෙක්. දෙන්ඩ හිතෙනවා හොම්බ සමතලා වෙන්ඩ"

"ගහන්ඩ එපා අපි මූව පොලිසියට ගෙනියමු. එහෙදි අපූරුවට කතා කරවයි"

මේ විදියට හැමෝම නොයෙක් දේවල් පැවසුවත් ඔහුගේ මුහුණේ කිසිම වෙනසක් නොවීය.

"බලාපල්ලකෝ බයක් හැකක් නැතුව මහ රජ්ජුරුවෝ වාගේ බලා ඉන්න හැටි"

"ඕකා ත්‍රස්තවාදියෙක්ද කොහෙද. සිංහල දන්නේ නැතුව ඇති" කෙනෙක් රහසින් කියයි.

දැන් අට දෙනෙකු පමණ ඔහු අල්ලාගෙනය. ඒ හැම දෙනාවම අඹරවමින් මිදී යාමට උත්සාහ දරණ ඔහුගේ හැසිරීම පුදුමාකාරය.

"ඕක නං එසේ මෙසේඑකෙක් නොවෙයි. හොර නායකයෙක්"

"හරි හරි අපි දැන් කොහොම හරි මූව පොලිසියට ඇදගෙන යමු. මෙතන ඉඳල හැතැප්මක්වත් නෑ නෙවැ"

හැමෝම ඊට එකඟ වූහ. දැන් ඔහුව අල්ලාගෙන සිටින අපි මහත් වෑයමෙන් ඔහුව තල්ලු කරගෙන වාගේ ගමන් කරමු. වරෙක ඔහු කුඩා ළමයකු මෙන් බිම ඉඳ ගැනීමට තැත් කරයි. එවිට අපි ඔහුව දැතින් අල්ලා ඔසවමින් ගෙන ගියෙමු. පිටුපසින් එන අය කියන නොයෙක් වදන් ඇසෙන විට අපේ වෙහෙසද මග හැරේ.

"ඕකගෙ අත් දෙක කැඩෙයි බං"

"ඒකට කමක් නෑ. අත් රිදෙනව නම් අඩු තරමින් මූ කතා කරන්නෙවත් නැතෑ"

"ඕක තමයි පහුගිය ටිකේම මැගි අක්කලාගේ කුකුල් කොටුවේ කුකුල්ලු ගෙනියන්ඩ ඇත්තේ"

"ඔව් ඔව් ඇත්ත තමයි"

"ඇයි පහුගිය දවස්වල අපි හෝදල වනල තිබුණු රෙදිත් නැති උනානේ. අනුමානයක් නෑ ඕකම තමයි ගෙනියන්ඩ ඇත්තේ"

"ජෙමයියගේ අමුඩ ලේන්සුව ගෙනිච්චෙත් ඕකද කියල අහපල්ල"

හැමෝම සිනසෙති.

"උඹල ඔය කියන එකක්වත් ඇහෙන්නේ නෑ වගේ මූ ඉන්නේ. හරිම ගල්කාසයෙක්"

"දැන් නම් අපට මූව ඇදගෙන යන්ඩත් බැරි තරම් අමාරුයි. මූට තියෙන හයිය. මොනවද යකෝ උඹ කන්නෙ"

මොනවා ඇසුවත් කිව්වත් ඔහුගෙන් කිසිම උත්තරයක් නැත. ඈතින් යම්කිසි වාහනයක් එන ශබ්දය ඇසේ. අපි හැරී බැලුවෙමු. ජීප් රියක්. ආ! පොලිසිය වෙන්ඩ ඇති. සෙනග දුටු වාහනය නතර විය. එයින් බැස්සේ පොලිස් රාළහාමිලා දෙදෙනෙකි.

"රාළහාමි මේ හොරෙක්. අපි අල්ලගෙන යන්නේ පොලිසියට"

"දානවා ජීප් එකට"

ඔහුව ජීප් රියට දමමින් නිමලුත් මමත් ඔහු සමග රියට නැග්ගෙමු.

"කොහෙන්ද තමුසෙල මූව අල්ල ගත්තේ"

"මේ මිනිහ අපේ ගේ දිහා හොරෙන් බලන් ඉඳල මං දැකල කතා කරන කොටම දුවන්ඩ පටන් ගත්තා. ඉතින් අපි කෑ ගහල අහල පහල අයත් එක්ක එකතු වෙලා පස්සෙන් දුවල තමයි අල්ල ගත්තේ. හැබැයි රාළහාමි මිනිහ අහන කිසිම දේකට උත්තර දෙන්නේ නැහැ"

"හැබැද. ඒක අපි පොලිසියෙදි බලා ගම්මුකෝ"

ජීප් රිය පොලිසියට ළඟා විය. රාළහාමිලා ඔහු අල්වා කූඩුව තුළට තල්ලු කළේය. ඉන්පසු රාළහාමි කෙනෙක් ඔහුට කථා කළේය.

"මොකද තමුසේ ගෙවල් ළඟට වෙලා බලන් ඉන්නේ කවුරු එනකන්ද?"

ඔහු සුපුරුදු ඉරියව්වෙන්ම බලා හිඳී.

"මොකද ගල් ගිලල වගේ. කතා කරන්නෙම නැද්ද"

ඔහුගෙන් පිළිතුරක් නැත.

“හොඳයි ඔහොම ඉන්නවකෝ. සාජන් මහත්තය ආවම අපි තමුසේව කතා කරවන්නම්” යයි පැවැසූ ඒ රාළහාමි අපටද නැවතී සිටින ලෙස කීවේය.

අපි පොලිසියේ මිදුලට වී සිටියෙමු. සිදුවන්නේ කුමක්දැයි දැන ගන්නා තුරු අපට ඉවසීමක් නැත. එවිටම ජීප් රියක් පැමිණියේය. එයින් බැස්සේ සාජන් මහත්තයා විය හැක. අපි විමසිලිමත් වීමු. එවිට අර රාළහාමිලා ඒ මහතාට ඔහුව පෙන්වමින් විස්තර කියන අතර අප දෙසද අවධානය යොමු කරවීය. සාජන් මහතා අප දෙසද බලමින් කුඩුවේ සිටින සොරා දෙසද තියුණු බැල්මක් හෙලීය. එවිටම හදිසියේ පැමිණි මෝටර් රථයක් මිදුලේ නතර විය. එයින් බැස ආවේ මැදිවියේ කාන්තාවක් හා තරුණයෙකි. ඒ දෙදෙනාගේම මුහුණු මේ සොරාගේ මුහුණට සමාන වුවත් ඒ දෙදෙනාගේ මුහුණු වලින් පිලිබිඹු වූයේ වැදගත් පවුලක අයගේ ප්‍රතිරූපයන්ය. හදිසි ගමනින් පොලිසියේ පඩිපෙල නැගුණු කාන්තාව තම අත වූ ලියවිලි වගයක් සාජන් මහතා අත තබමින් “අනේ සර් මේ ලියවිලි කියවල බලන්ඩ. අර ගෙනත් ඉන්නේ මගේ පුතා” යනුවෙන් හැඬුම් බර වචන වලින් පැවැසුවාය. එම ලියවිලි කියවන අතර ඒ මහතාගේ මුහුණ වෙනස් වූයේ වැහි වලාකුලකට වැසී යන හිරු මඬල පරිද්දෙනි. ඒ ස්ත්‍රිය දෙසත් රාළහාමිලා දෙසත් හොරා දෙසත් පිළිවෙලින් බැලූ සාජන් මහතා “මෙයාව යන්න හරින්න” යයි රාළහාමි කෙනෙකුට නියම කළේය. කුඩුවේ දොර ඇරුණි. කුඩා ළමයෙකු අම්මා සමඟ සිනාසෙන අයුරින් බොළඳ සිනහවක් අම්මා දෙස හෙලූ ඔහු අනතුරුව වේවැල් පහර කෑ කුඩා ළදරුවෙකු සේ ලාබාල කටහඬින් කෑ ගසා හඬමින් අම්මාගේ අතේ එල්ලුනේය. කඳුළු බේරෙන දෑසින් සාජන් මහතා දෙස බැලූ ඒ කාන්තාව කෘතඥ පූර්වකව දොහොත් එක් කර වැඳ ඒ අයගෙන් සමුගෙන අප හොරා යයි හැඳින්වූ පුතාවද තුරුළු කරගෙන මිදුලට බැස්සේය.

අපි ඇය සමඟ සිටි තරුණයාගෙන් විස්තර ඇසුවෙමු.

“මේ මගෙ අයියා. මෙයාගේ මොලේ හොඳ මදි. අංගොඩ ඉස්පිරිතාලේ මානසික රෝග විශේෂඥ දොස්තර මහත්තයෙකුගෙන් අපි මෙයාට බෙහෙත් ගන්නව. අර පෙන්වපු ලියවිලි ඒ දොස්තර මහත්තයා මූා ගැනත් මෙයාට දෙන බෙහෙත් වර්ග ගැනත් සඳහන් කරල තියෙන ලියවිලි වගයක්. ඉතින් අපි ඊයෙ ඉඳලාම ඔය ලියවිලිත් අතේ තියාගෙන හැම තැනම ගියා. මේ කිට්ටුවට එනකොට ආරංචි උනා අපි කියන හැඩහුරුකම් තියෙන කෙනෙක්ව මිනිස්සු අල්ලගෙන පොලිසියට ගෙනිච්ච කියල. අපි ඇඟේ ලේ වතුර වෙලා මේ දුවගෙන ආවෙ. අපරාදේ බැරි වලාවත් ගුටි කෑව නම් එහෙම මොලේ අමාරුව හොඳටම වැඩි වෙනව. මෙයා මෙහෙම ලොකුවට හිටියට හිත පුංචි ළමයෙකුගේ වාගේ” යයි පැවසූ ඔහුගේද ඇස්වල කඳුළු පිරී තිබුණි.

“එහෙනම් අපි ගිහිං එන්නම්” කියමින් ඉතා සුහද ලෙස සිනාසී ඔවුන් රථයට ගොඩ වූයේ අප විසින් හොරා ලෙස හංවඩු ගසනු ලැබූ ඔවුන්ගේ දයාබර මානසික රෝගියාවද සෙනෙහසින් වැළඳගෙනය. ඔහුට වද දිදී පොලිසියට ඇදගෙන

ආවේ අප බව ඒ අයට දැන ගන්නට නොලැබීම ගැන අපි සතුටු වූයෙමු. නිමලුත් මමත් හෙමින් සීරුවේ පාරට බැස්සෙමු.

“තව ටිකෙන් පොලිසියෙන් ගුටි කන්ඩ වෙන්නේ අපටයි නේද නිමල්”

“ඔව් මමත් කල්පනා කළේ ඒකයි”

# කොහේ ගියාදෝ

නින්දෙන් අවදි වූ මා සුපුරුදු පරිදි කුස්සියට ගියේ අම්මාගෙන් ලැබෙන කෝපි කෝප්පය බීමටය. එහෙත් තවම වතුර ලිපේය. අම්මා හිරමනය උඩ වාඩි වී දෑතින් මුහුණ වසාගෙන හඬමින් සිට මා දෙස බැලුවාය. අම්මාගේ ඇස් රතු වෙලාය. ඉදිමිලාය.

"ඇයි අම්මේ කෝපි නැද්ද?"

"තියෙනව පුතේ. මම කෝපි හදනකම් මගේ පුතා දුවලා ගිහින් ලොකු මාමාට එන්ඩ කියන්ඩ"

එවිට අම්මා ගැන මට ඇතිවූ දුකත් මේ අනපේක්ෂිත සිද්ධියත් නිසා මගේ ධාවන වේගයද වැඩි විය. නිමේෂයකින් ලොකු මාමලාගේ ගෙදර මිදුලේ නතර වූ මම හති දමමින් "ලොකු මාමේ, ලොකු මාමේ" කීවෙමි.

"මොකද දරුවෝ මොකද?"

"ලොකු මාමෙ ඉක්මනට අම්ම එන්ඩ කිව්ව"

එවිට බැරෑරුම් ගතියක් මුහුණට ආරූඪ කර ගත් ලොකු මාමා කිසිත් නොදොඩා සරම සකස් කර අඩිමින්ම අපේ ගෙදරට පිය මැන්නේය.

"මොකද නංගියේ"

"අනේ අයියේ … ආ … නේ … අයි … යේ"

"ඉතින් නාඩ ඉඳින්. ඉස්සෙල්ල වෙච්ච දේ කියල පස්සේ අඩපන්. කෝ දයාපාල?"

"ඒක තමයි අයියේ මං එන්ඩ කිව්වේ. ඊයේ හවස ඉඳල ගෙදර නෑ. රෑ එලි වෙනතුරුත් ආවේ නෑ. අනේ අයියේ දයාපාලව හොයපල්ල"

"උඹ එහෙම දයාපාලට හිත රිදෙන්ඩ මුකුත් කිව්වද?"

අම්මා කතා නැත.

"අනුමානයක් නෑ උඹ මොනවා හරි කියල තියෙනෙව. ඒකට කමක් නෑ. උඹ අඩන්නේ නැතුව ඉඳින්. මමයි මල්ලිල තුන්දෙනයි ගිහින් දයාපාලව හොයන්නම්කො" පැවැසූ ලොකු මාමා පිටවී ගියේය.

අම්මා මදක් සැනසුනාය. මාමලා හතර දෙනා හතර අතේ ඇවිදිමින් සෙවූ නමුත් රෑ වන විට හතර දෙනාම ආවේ ගොලුවන් සේය. අම්මා හඬා වැටෙන විට මට අසා සිටීමට බැරි නිසා මමත් ඇඬුවෙමි. මල්ලිලාට නම් කිසිම හැඟීමක් නැත. ඒ අය නිකම්ම බලා සිටිති. මෙසේ දින ගණන් සති ගණන් එකම ආකාරයෙන් ගෙවී ගියත් තාත්තා ගැන කිසිම ආරංචියක් නැත. ගෙදර ලිප්වල කැම ඉදෙන්නේද නැත. එහෙත් තුන් වේලම අපට කෑම ලැබේ. මාමලා හතර දෙනාගේ ගෙවල් වලින් අපට උවමනා ප්‍රමාණයටත් වඩා කෑම ලැබේ. අම්මා දැන් අඬලාම ලෙඩ වෙලා වගේය. මාමලා නැන්දලා නිතරම පැමිණ අම්මාගේ සිත සනසති.

අම්මලාගේ පවුලේ මාමලා හතර දෙනාටම ඉන්නා එකම නංගි අපේ අම්මාය. ඒ නිසා මාමලා අපේ අම්මාට ඉතාම ආදරේය. ඒ හතර දෙනාටම හේන් කුඹුරු වලින් හොඳ ආදායම් ලැබෙන නිසා අපව නඩත්තු කිරීම ඒ අයට සුළු දෙයකි.

"කණගාටු වෙන්ඩ එපා නංගියේ. අපි කවුරුත් නංගිව තනි කරන්නේ නැහැ" දිනක් ලොකු නැන්දා අම්මාට කීවේ අපට දවල් කෑම ගෙනා බත් පෙට්ටිය බිම තබමින්ය.

"අනේ අක්කේ අයියලාට මෙහෙම හැමදාම මගේ පවුලේ බර කර ගහන්ඩ පුළුවන්ද? මේ මනුස්සය මෙහෙම අපිව දාලා ගියේ ඇයි?"

"දාලා ගියා කියල හිතන්ට බෑ නංගියේ. දයාපාල මලයාට මුකුත් කරදරයක්වත් උනාද කවුද දන්නේ"

"අනේ දෙවියනේ එහෙම දෙයක් වෙන්නේ කොහොමද? ඒ අහිංසකය කාටවත් වරදක් කරන කෙනෙක්යැ" කියමින් අම්මා නැවත හඬන්ට වූ විට නැන්දා ඇයව සැනසුවාය.

දිනක් ලොකු මාමාත් පොඩි මාමාත් කළ කථාවක් මට මෙවිට මතක් විය.

"දයාපාල මලය යන්ඩ ඇත්තේ අපේ නංගිගේ කටේ වැරුද්ද හින්දම වෙන්ඩ ඇති. ඇයි ඉතින් හැම වෙලේම අහසින් වැටුණු එකා කාත් කවුරුත් නැති එකා කියල අපහාස කරනවනේ"

මමද අම්මා තාත්තාට බනින හැටි අසා ඇත්තෙමි. ඒත් තාත්තා ඒ කිසිවක්

ගණන් ගත්තේ නැත. ඒවා ඇහෙන්නේ නැති විධියට තාත්තා තමාගේ වැඩවල යෙදෙයි. ඒ දිනවල තාත්තාට නිතරම බැණ වැදුණු අම්මා දැන් මෙච්චර කණගාටු වන්නේ ඇයි කියා මට තේරුම් ගත නොහැක.

ක්‍රමයෙන් කාලය ගෙවී මාස අවුරුදු බවට පත්වී දැන් අවුරුදුද කීපයක් ගත වී ඇත. එහෙත් තාත්තා ගැන කිසිම ආරංචියක් නැත. මාමලාගේ උදව්වෙන් අපේ හේන් කුඹුරුවලද ඵලදාව හොඳය. මමත් දැන් තරුණ වයසට පත්ව සිටිමි. දෙවුපෙල සමත්වූ පසු පාසැල් ගමන නතර කළ මම මාමලා සමඟ අපේ ඉඩම් වල ඵලදාව වැඩි කර ගැනීමට වෙහෙසුනෙමි. මල්ලිලා තුන්දෙනාත් දැන් ලොකුය. ඒ අයට තාත්තා ගැන මතකයක් නැත. මාමලාගේ සහයෝගය නිසාම මටද දැන් ගොවිතැන ගැන හොඳ අවබෝධයක් ඇත. අපේ අස්වැන්නද සරුසාරය. මාමලාගේත් අපේත් වී මිලට ගන්නා මුදලාලි මාමලා සමඟ ඉතාම හිතවත්ය. ඔහුගේ වී මෝලේ ගණන් හිලව් වැඩ වලට මාව හවුල් කර ගැනීමට කැමති බව ඔහු අපේ ලොකු මාමාට දන්වා ඇත. මා දෙවුපෙළ සමත් නිසාත් මෙවැනි රැකියාවකට මා සුදුසු බව මාමාගේ අදහස විය. දැන් ලොකු මල්ලීත් ගොවිතැනට යොමු වී ඇති නිසාත් මා වෙනුවෙන් සෑහෙන වැටුපක් ගෙවීමට මුදලාලි කැමති නිසාත් මාමලාත් අම්මත් මමත් ඊට එකඟ වූයෙමු. එහෙත් නිවාඩු ලැබෙන හැම විටම මම ගොවිතැන් වැඩ කළෙමි. පාසැල ඇරී ගෙදර එන මල්ලිලාද ගොවිතැන් වැඩ වලට උදව් දුන්හ.

දැන් අපට කිසිම අග හිඟයක් නැත. එහෙත් අම්මාගේ දුක නම් තවම එලෙසමය. ගමේ ගැහැණුන් කියන කට කථා නිසා අම්මා වැලපෙන අයුරු දැකීමෙන් දිනක් මගේ හදවත කම්පා විය. අනුන්ගේ ඕපාදූප හොයන ලූසි අක්කා අපේ තාත්තා ඈත පලාතක වෙනත් ගැහැණියක සමඟ ජීවත් වන බව අම්මාට පවසා ඇත. එදා අම්මා විලාප කියමින් ඇඬුවේ ඒ නිසාය. මට ඒ දුක දරා ගත නොහැකිව මම පුංචි මාමා හමුවී අම්මා අඬමින් සිටින බවත් එයට හේතුවත් කීවෙමි. අපට කරදරයක් වුවහොත් ඉස්සෙල්ලාම ඉදිරියට පනින්නේ පුංචි මාමාය. මගේ වචන අසා කෝපාවිෂ්ඨ වූ පුංචි මාමා ලූසි අක්කා හමුවීමට ගියේය.

"ලූසි අක්කේ මෙහාට වරෙන්"

"ඇයි පුතේ මේ තකහනියක්"

"හැබෑද උඹ අපේ මස්සිනා ගැන නරක ආරංචියක් නංගිට කිව්ව කියන්නේ"

"මොන බොරුද පුතේ මං මුකුත් කිව්වේ නෑ"

"එහෙනම් නංගි අඬනව කියන්නේ උඹ මොනවද කිව්ව කියල"

"අනේ නෑ පුතේ ඕක කාගෙද බොරුවක්"

“මේ ලූසි අක්කේ උඹ ගැන මං හොඳට දන්නව. උඹට මං මේ පළමුවෙනි වතාවටයි කියන්නෙ. කට පරිස්සම් කරගෙන නොහිටියොත් මං නරක මිනිහ කියන්ඩ එපා. උඹේ මිනිහගෙත් ඇටකටු කඩනව මම”

එවිටම ගෙතුලින් එළියට ආ සේදිරිස් තම බිරිඳගේ හැටි හොඳින් දන්නා නිසා මාමාට මෙසේ කීවේය.

“අනේ පුතේ උඹ කෑ නොගහ පලයන් ඔය ගෑණු කතා වලට කලබල නොවී. ආයෙත් එහෙම මේ ගෑණි මොනව හරි කියල තිබුණොත් මම මේකිගේ කට තලනවා”

“එහෙනම් මං යනවා ගෙදර” කියූ පුංචි මාමා “වරෙන් පුතේ යන්ඩ” කියා මා සමඟ අපේ ගෙදර ආවේය.

තවත් වසර කීපයක් ගතවන විට මම මුදලාලිගේ මෝලේ කළමණාකරු බවට පත්වූයෙමි. බාල මල්ලිලා දෙන්නා ඉගෙනීමට සමත් හෙයින් ලොකු මල්ලිත් මමත් ඔවුන්ගේ ඉගෙනීමට බාධා නොවන පරිදි ගොවිතැන් වැඩ කළෙමු. තුන්වැන්නා උසස් පෙළ සමත්වී විශ්ව විද්‍යාලයට ඇතුළු වූ අතර බාල මල්ලිට ගුරු පත්වීමක් ලැබී ගමේ පාසැලටම පත්විය.

දැන් අම්මා දරුවන් දෙස බලා සතුටින් ජීවත් වුවත් ඇගේ සිත තුළ අළු යට රැදී ගිනි පුපුරු මෙන් තාත්තා ගැන දුක සැඟවී ඇත. මෝලේ මහත්මයා මා ගැන තබා ඇති විශ්වාසය අප්‍රමාණය. මා කළමණාකරු වශයෙන් සේවය කළත් බොහෝ විට මුළු පාලනයම මට භාරදී ඇත්තා සේය. වැඩ කරන කම්කරුවන්ද මට ඉතාම හිතවත්ය.

සෑම මාසයකටම වරක් අපේ ගමට මදක් ඈතින් පිහිටි ගල් ගුහාවල වාසය කරන ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාට දානයක් පිරිනැමීම අපේ මුදලාලිගේ සිරිතය. බොහෝ අවස්ථාවල දානය ගෙන යන වෑන් රථයෙහි මමද ඔහු සමඟ යමි. සමහර දිනවල මුදලාලි නොගොස් මට යාමට නියම කරයි. එවිට මම සේවකයන් දෙදෙනෙකු සමඟ ගොස් දානය පිළිගන්වා උන්වහන්සේලාට වැඳ පුදා ආපසු එමි. දිනක් එසේ දානය රැගෙන ගිය අවස්ථාවකදී මා සමඟ ගිය සේවකයන් දෙදෙනා වනයේ ඇවිද බෙහෙත් ජාති වගයක් සොයාගෙන එන තුරු මම ගම්වැසියන් සමඟ කථා කරමින් පැල්පත් පසු කරමින් ඇවිද්දෙමි. ඒ අවස්ථාවේදී මම මේ ආරණ්‍යවාසී තාපසවරුන් ගැන එක් අයෙකුගෙන් විස්තර ඇසුවෙමි.

“ආ ලොකු උන්නැහේ මේ හාමුදුරුවරු පන්සල් වල ඉන්නේ නැතුව මේ කැළේ ගල් ගුහාවල දුක් විඳින්නේ ඇයි”

“මොනව කියනවද මහත්තයා මේ අය කැමති නැහැ එහෙම පන්සල් වලට වෙලා ඉන්න. මේ අය කැමති මේ වගේ දුක් විඳගෙන සිල් රකින්න. දානයක්

ලැබුනොත් වලඳිනව නැත්නම් නිරාහාරව භාවනා කරනව. ඔය මොනවා හරි ගඩා ගෙඩි ජාතියක් කාල ඒත් මැත්නම් තේ කෝපි ටිකක් බීල බොහොම සිල්වත් විධියට ජීවත් වෙනවා"

"ඔය ඔක්කොම මේ පලාතේ අයද"

"නෑ මහත්තය කොහෙන් කොහෙන් හරි ආව අය. හැබැයි නියම විධියට සසර කලකිරිල හිත එකඟ කරගෙන ආව අය. එහෙම නැතුව පන්සල්වල ඉන්න සමහර අය වාගේ අම්මල තාත්තලගේ බල කිරීමට මහණ වූ අය නෙවෙයි"

"ඔව් ඔව් සමහරු මහණ වෙන්නේ මව්පියන්ගේ උවමනාවටනේ. කුඩා කාලේදීම ඔහේ මහණ කරනව"

"මේක ඇතුළේ ඉන්නව මහත්තයා හරිම සිල්වත් ඒ වගේම හරිම පින්වත් හාමුදුරු කෙනෙක්. එයා ගිහි ජීවිතේ ඉන්න කාලේ ළඟින්ම ආශ්‍රය කරපු යාළුවෙක් ඉඳහිට එයාව බලන්ඩ එනවා. එයා තමයි මට ඔය හාමුදුරුවන් ගැන කිව්වේ. එයා හාමුදුරුවන් ගැන මට විස්තර කිව්වෙත් හාමුදුරුවන්ට තියෙන ලැදිකමටයි. මට කිව්ව ඒ අයට පුළුවන් හැටියට උදව් කරන්ඩ කියල. නැත්නම් එයා ඔය විස්තර මට කියන්නෙත් නැහැ"

"කොහේ හාමුදුරු කෙනෙක්ද එයා"

"ඒක නම් මට කිව්වේ නෑ මහත්තය"

"ඉතින් ලොකු උන්නැහැ කියන්ඩකො ඒ හාමුදුරුවන්ගේ විස්තරේ"

"මෙහෙම ඉඳගම්මුකෝ. මහත්තය හැම මාසෙම මෙහෙම දානේ ගෙනෙන නිසා මට මහත්තයව විශ්වාසයි. නැත්නම් මේ කතාව කියන්නේ නෑ. ඒ හින්දා මහත්තයත් මේ කතාව කාටවත් කියන්නේ නෑ නොවැ"

"අපොයි නෑ"

"මේ හාමුදුරුවන්ගේ හොඳ කම වෙන්වන්ඩයි මං මේ කථාව කියන්නේ"

"හොඳයි බය නැතුව කියන්ඩ. අපි ඒ අයට තව තවත් උදව් කරන්නම්"

"ඔය ගුහාව ළඟට ගිය වෙලාවක බලන්ඩ මහත්තයා රතුම රතු උස මහත ලස්සන හාමුදුරු නමක් ඉන්නව. දැක්කම ඇති පිං අත් වෙනව. ඒ තරම්ම පිං පාටයි. හැම වෙලාවේම මුව පැටියෙකුත් එක්කයි ඉන්නේ"

"ඉතින් ඉතින්"

"ඉතින් මං කිව්වේ අර යාලුවෙක් ඉඳහිට එනව කියල. ඒ යාලුවට ඔක්කොම

විස්තරේ කියල තමයි මහණ වෙන්ඩ ඇවිත් තියෙන්නේ. එයාගේ මාර්ගයෙන් ගෙදර තොරතුරුත් හොයා බලනවා. යාලුවත් මේ රහස රැකගෙන තමයි ඉන්නේ"

"කෝ ඉතින් ලොකු උන්නැහැ කිව්වයැ තාම කතාව"

"ඒ හාමුදුරුවො කලින් විවාහ වෙච්ච කෙනෙක්"

මගේ සිත තුළට ඇහිල්ලකින් අනින්නාක් මෙන් දැනුණි. එහෙත් මම මුහුණෙන් වෙනසක් නොපෙන්වා කථාවට හවුල් වූයෙමි.

"ඇයි ඉතින් මහණ වෙලා තියෙන්නේ නෝනගේ වරදක් නිසාද?"

"වරදක්ම නිසාත් නෙමෙයි මහත්තය. නෝන ගැන හිත කලකිරිල"

"මට තේරුනේ නෑ ඒ කතාව"

"ඉන්ඩකො මම තේරුම් කරලා දෙන තුරු. නෝනට දරුවන් හතර දෙනෙක්ම ලැබෙන තුරු පවුලේ යුතුකම් හරියට කරගෙන හොඳට ජීවත් වෙලා තියෙනවා. ඒ උනත් නෝන නිතරම එයාව බාල්දු වන විධියට අපහාස කරල කතා කරනවලු. 'අහසින් වැටුණු එකා, අම්මෙක් අප්පෙක් නැති කාලකන්නියා' ඔය විධියට නිතර නිතර අපහාස කරනකොට එයාට දරාගන්ඩ බැරි වේදනාවක් ඇති උනාලු. හැමදාම මේ විධියට නින්දා විඳ විඳ ඉන්නවට වඩා පුළුවන් තරම් එයාගෙන් ඈත් වෙන්ඩ ඕනැ කියල හිතුනලු. නෝන මේ විධියට අපහාස කරනකොට කවදා හරි දරුවොත් ඒ විධියට පුරුදු වේවි කියලත් හිතිලා තියෙනවා. කොහොම උනත් ගිහි ගෙය අතහැරල යන බව නම් නෝනට කියලා නෑ"

"හරි පුදුම මනුස්සයෙක්නේ. එයාට තිබුණනේ නෝනගෙන් දික්කසාද වෙලා වෙන කසාදයක් කරගන්ඩ" මා එසේ කීවේ සිතට එකඟව නොව නිකම්ම කථා නොකර අසා සිටින විට මගේ සිත තුළ ඇති කැලඹීම ඔහුට දැනේවි කියා සිතුන නිසාය.

"ඔන්න ඉතින් මහත්තය කිය'පු හරුපේ. ඇයි මහත්තයෝ සසර කලකිරුනට පස්සේ ආයෙත් බඳින්ඩ හිතෙනවද. අනිත් එක දරුවන්ව දාල එන එකත් එයාට හරිම වේදනාවක් වෙලා තියෙනවා. ඒ උනත් නිතර බැණුම් අහමින් ගෙවන ජීවිතයට වඩා දරු දුක විඳගෙන මහණ වෙනව කියන තීරණයට බැස්සලු"

"ඉතින් දරුවෝ ජීවත් වෙන්නේ කොහොමද කියල හිතල නැද්ද?"

"නැතුව. එයා දන්නවලු නෝනට ඉන්න සහෝදරයෝ හතර දෙනා තමන්ගේ එකම නංගිට නොසලකා නොඉන්න බව. දරුවන් ගැනත් නිතරම තොරතුරු අහනවලු අර යාලුවාගෙන්"

“මොනවද ඉතින් එයා දරුවෝ ගැන දැනගෙන තියෙන්නේ”

“ඔක්කොම දෙවල් දන්නවලු. ලොකු පුතා මොකක්දෝ හොඳ රස්සාවක් කරනවලු. දෙවෙනි පුතා ගොවිතැන් කරල හොඳට දියුණු වෙලා ඉන්නවලු. තුන්වෙනි පුතා ඔන්න ඔය විස්ස විජ්ජාලෙද මොකක්ද එකක ලොකු විභාගයක් පාස් කරලලු. බාල පුතා ඉස්කෝලේ මහත්තේක්ලු. ඔය විස්තර අහල බොහොම සන්තෝසෙන් ‘සාදු සාදු සාදු’ කියල පිං දුන්නලු. දැන් හරිම සන්තෝසෙන් හිත එකඟ කරගෙන හොඳින් භාවනා කරමින් නිසංසල ජීවිතයක් ගත කරනවලු”

“ඔය විධියට ගිහි ගෙය අතහැරල එන්ඩ තරම්ම එයාට නෝනගෙන් හිරිහැර වෙලා තියෙනවද?”

“වෙන්ඩ ඇති මහත්තයෝ. ඔය හාමුදුරුවෝ කුඩා කාලෙම එයාගේ අම්ම දාලා ගිහින් පස්සේ එක එක නෑදෑයන් ළඟ ජීවත් වෙවී ඉඳල පස්සේ ඔය පිටිසර පලාතකට වෙලා තනිවම ගොවිතැන් කරගෙන ජීවත් උනාලු. ඒ කාලේ තමයි ඔය බැඳපු එක්කෙනාගේ දෙමව්පියෝ එක්ක සම්බන්ධකම් ඇතිවෙලා තියෙන්නේ. ඔහොම ඉන්න අතරේ ඔය නෝන එක්ක යාලුවෙලා තියෙනව. ඉතින් මේ මනුස්සය බොහොම ගුණ යහපත්කම් ඇති කෙනෙක් හින්දත් හොඳට දියුණු වෙලා ඉන්න හින්දත් මව්පියෝ විරුද්ධ වෙලා නෑ. කාලයක් ගියාට පස්සේ තමයි නෝන ඔය කුලමල කිය කිය බණින්ඩ පටන් අරන් තියෙන්නේ. ඉතිං සසර කලකිරුනා”

මට සියල්ල වැටහුණි. ඔහුගේ අතීතයද දැන ගතිමි. නමුත් ඔහු අනාථයෙකු ලෙස මම නොසළකමි. මට පෙනෙනුයේ ඔහු ඉතා උතුම් මිනිසකු ලෙසය. මේ දැනගත් කරුණු වලින් මටද මහත් සතුටක් දැනුනි. මම ඒ බව මුහුණින් නොපෙන්වා ඒ ගැමියා සමඟ වෙනත් දේවල්ද කථා කරමින් වෑන් රථය අසලට ආවෙමි. අපේ සේවකයෝද පැමිණ සිටියහ. මම ඔහුගෙන් සමු ගනිමින් “එහෙනම් ලොකු උන්නැහැ අපි ගිහින් එන්නම්කෝ. අපි තව තවත් ඒ හාමුදුරුවරුන්ට උදව් කරන්නම්කෝ” කීවෙමි.

“හොඳයි මහත්තයා” කිවූ ඔහු අප පිටත් වනතුරු බලා සිටියේය.

මගේ මොළය තුළ මුහුදු රැල්ල ගසන්නාක් මෙන් හැඟීම් එක උඩ එක පෙරලෙයි. අපේ ජීවිත කොතරම් පුදුම සහගතද? අපි අවාසනාවන්තයෝ නොවෙමු. තාත්තා අප හැර ගියත් ඔහු උතුම් මිනිසෙකි. එහෙත් මේ රහස සැමදා රැක ගත යුතුය. කෙසේ වුවත් එතුමා ළඟට ගොස් හොඳින් දැක බලා ගැනීමේ ආශාවක් මා තුළ ඇති විය. ඊළඟ වතාවේදීද දානය රැගෙන යාමට මම භාර ගතිමි. සේවකයන් දෙදෙනා සමඟ ගුහාව අසළට ගිය මම අර ගැමියා කියූ හැඩරුව ඇති කෙනෙකු දැකීමේ අටියෙන් ගුහාව වටා නෙත් යොමු කළෙමි. එවිටම මුව පැටවෙකුද ලං කරගත් ඒ උතුමා සිනහ මුසු මුහුණින් මා දෙස බැලීය. කුඩා කාලයේ වුවත් යන්තමින් හෝ මගේ දෙනෙත තුළ ලියැවී තුබූ ඒ රුව මට අඳුනා ගැනීම අපහසු නොවීය. නමුත් එතුමාට මා හඳුනා ගත නොහැකි විය. මම

දනින් වැටී හිස දෙපා මුල තබා එතුමාට වැන්දෙමි. ඒ සමහම මගේ සිත තුළ වූ පැතුම වූයේ "මගේ තාත්තා බුදු වේවා!" යන්නය. "සුවපත් වේවා" කියා මගේ දෙවුරට අත තබා එතුමා මා නැගිටවන විට මගේ දෑසේ කඳුළු පිරී තිබුණේ ඇයි දැයි අනෙක් අය සිතන්නට ඇති. එදා එතැනින් පිට වී යන විට මා සිතා ගත්තේ මේ රහස කිසි දිනක අම්මාට නොකියන බවය. අපේ ජීවිත දෙස බලා සතුටින් ජීවත් වන අම්මාව ඔය තත්වයෙන්ම අපි තබා ගත යුත්තෙමු.

එහෙත් කවදා හෝ මට මෙන්ම මගේ මල්ලිලා තුන්දෙනාටත් පියාණන් දැක ගැනීමට අවස්ථාව සලසා දීමට මම අධිෂ්ඨාන කර ගතිමි.

# උමතුව

අයියාගේ මෝටර් රථය ගේට්ටුව ළඟට පැමිණ ඇත. එයින් බැස තාත්තා ගේට්ටුව අරියි. මෝටර් රථය පෝටිකෝව යට නැවතුණි. අයියා බැස පිටුපස දොර ඇරියේය. සීයාත් සමඟ ඉන් බිමට බැස්සේ සීයාගේම මුහුණුවර ඇති සීයා මහප්පාය. ඔහු අපේ සීයාගේ අයියා නිසා අපි ඔහුට සීයා මහප්පා යයි කියමු. ඔහු පෙනුමෙන් නම් සීයාට වඩා තරුණ පාටය. ඔහු සීයා තරම් මහළු වී නැත. පළමුවෙන්ම ඔහු වටපිට බැලුවේය.

"යමු අයියේ ගෙට" සීයා කියයි.

"කෝ මලෙය අපේ ගේ" සීයා මහප්පා අසයි.

"ඇයි අයියෙ මේක තමයි ගේ. පරණ ගේ කඩල මේ පුතා හදපු අළුත් ගේ නොවැ" කියා සීයා අපේ තාත්තාව පෙන්වයි.

"හිතා ගන්ඩවත් බෑ ගේ තිබුණෙ කොයි පැත්තටද කියල"

"පරණ ගේත් මේ පැත්තට නේ අයියේ හරවල තිබුණෙ. අර ගේට්ටුව ඉස්සරහ තියෙන්නේ"

"හැබෑටම ඉස්සර තිබුණු ඉදිකඩුල්ල කෝ?"

"ඒක අරං දාලා ඔය ගේට්ටුව දැම්ම මහප්පේ" තාත්තා කියයි.

"අපොයි ඒ ඉදිකඩුල්ල තිබුණ නම් ඔයිට වඩා හොඳයි. මේකත් හරියට අර ඉස්පිරිතාලෙ ගේට්ටුව වගෙයි"

"ඉතින් එන්ඩකො මහප්පේ ඇතුළට. ඇඳුම් මාරු කරල එහෙම මහන්සි ඇරගන්ඩ එපායැ"

"එන්ඩ අයියෙ මේ කාමරේට. මේ මගෙ කාමරේම අයියටත් ඇඳක් ලෑස්ති කෙරුව" කියමින් සීයා ඔහුගේ සූට්කේසයත් රැගෙන කාමරයට ඇතුළු විය.

පසුව සුදු බැනියමක් හා සරමක් ඇඳගත් සීයා මහප්පා අපේ සීයා සමඟ මුහුණ සෝදාගෙන විත් සාලයේ වාඩි විය. අම්මා ගෙනත් දුන් සිසිල් බීම පානය කරන අතර සීයා අපව පෙන්වමින් කථාව පටන් ගත්තේය.

"මේ පුතාගෙ ළමයි. අර ඉන්නෙ පුතාගෙ නෝන" කියමින් සීයා අපව හඳුන්වා දුන්නේය. සීයා මහප්පාද පිළිවෙළින් අප දෙස බලා සිනාසුනේය.

"ඔව් ඉතින් මං දැකල තිබුණෙ නෑ නොවැ. මං මෙහෙ ඉන්න කාලෙ මේ කවුරුත් හිටියෙ නෑ නොවැ"

සීයාගේ මුහුණේත් සීයා මහප්පාගේ මුහුණේත් අමුතුම ප්‍රීතියක් දක්නට ඇත. අපි සැම දෙනාම මේසයට වාඩිවී දවල් ආහාරය ගතිමු. සීයා මහප්පා ඉතාම ප්‍රිය කරන මුව මස්ද එදා කෑම වේලට අඩංගු විය. තාත්තාත් සීයාත් දෙදෙනාම පෙරැත්ත කරමින් කෑම බෙදති. කෑමෙන් පසු ලොකු කෝලිකුට්ටු ඇවරියක් අම්මා මේසය මත තැබුවාය. එයින් ගෙඩියක් කඩාගත් සීයා මහප්පා මෙසේ ඇසීය.

"මලෙය ඉස්සර තුබුණු රතු කෙහෙල් පඳුර දැන් නැද්ද?"

"ඒව කොහෙන්ද අයියෙ මෙච්චර කල්. දැන් ඒව තිබුණු තැනක්වත් නෑ"

පසුව සීයාත් සීයා මහප්පාත් තාත්තාත් මිදුලට බැස ගේ වටේ ඇවිදිමින් සතුටු සාමිච්චියේ යෙදී සිටිනු දුටු අපිද එතැනට එකතු වූයෙමු.

"මෙහෙනං කොළඹ වාගෙ රස්නෙ නැහැ ගස්වල හෙවන තියෙනවනේ. එහේ ඉතින් කාමර ඇතුලෙම ඉඳල දැන් මට එපා වෙලා"

"ඔව් අයියෙ දැන් ඉතින් අයියට ගමට වෙලා නිවී සැනසිල්ලෙ ඉන්ඩ බැරියැ. අපි යමු අර ගහ යටට"

අපි හැම දෙනාම අඹ ගස් සෙවනේ වාඩි වූයෙමු. සීයා මහප්පා වටපිට බලමින් සතුටින් පසුවෙයි. ඔහු නොයෙක් දේ අසයි.

"ඈ මලෙය මේ පොඩි පැටව් දෙන්න ගමේ ඉස්කෝලෙටද යන්නේ"

"නෑ අයියේ ඒ ගොල්ලො ලොකු පුතාගේ කාර් එකේ කොළඹ ඉස්කෝලෙකට යනව"

"මොනව ඔච්චර දුර"

"ඔව් ඉතින් කාර් එකේනේ යන්නේ"

"කෝ ඉස්සර තිබුණු රේස් කරත්තේ"

“ඒව කොහෙන්ද අයියෙ දැන්”

“ඇයි උඹල ඒව වික්කද?”

“නෑ ඒව පරණ වෙලා කැඩිල බිඳිල ගිහිල්ල. ඔය ඉතුරු බිතුරු කෑලි සේරම අර මඩුවෙ දාල තියෙනව”

“මොනව ඇයි එහෙම කෙරුවේ? ඒව හදාගන්ඩ තිබුනනේ”

“ඒව පරණ වැඩියි අයියේ. මෙච්චර කල් ඒව පාවිච්චි කරන්ඩ බැහැ”

“එතකොට අඹරා කරත්තේ”

“ඒකත් එහෙමමයි. ඉතුරු කෑලි මඩුවෙ ඇති”

“එතකොට මලෙය හඳයයි රත්තයි. උඹල උන් දෙන්නව වික්කද?”

“නෑ නෑ අයියේ. ඒ හරක් දෙන්නම වයසට ගිහිල්ල මැරුණ. හඳයව පන්සල් වත්තේ දිගෙලි කරල උන්න. රත්ත අපේ වතුපිටි වලම ඔහේ ඉඳල අං හැලිල වයසට මැරුණ”

දැන් සීයා මහප්පාගේ කල්පනාව වෙනස් වේගෙන එන පාටය. අවුරුදු පනහකට පමණ පෙර සිදුවූ දේවල් තවමත් එම තත්වයෙන්ම පැවතිය යුතු බවය ඔහුගේ අදහස.

“යමු බලන්ඩ පරණ මඩුවෙ තියෙන්නේ මොනවද කියල” කියමින් ඔහු අපව කැඳවාගෙන පරණ මඩුව ලඟට ගියේය.

“අපොයි අපොයි කරත්තවල රෝද ටිකත් කැඩිල. සමහර ඒවයේ ගරාදිත් කැඩිල” එසේ කී සීයා මහප්පා නැවතත් “මොනව අර පරණ කච්චිචි වියං ඇඳන් රවුම් මේස සේරම කඩල බිඳල දාල නේද” කියමින් කෑගසන්නට විය. අපේ සීයා නිහඬය. ඔහු තාත්තා දෙස බැලීය.

“මොනවද මහප්පේ ඕව ගැන ඔය තරම් බලන්නේ”

“බලන්නේ? බලන්නේද උඹලගෙ කෙරුවාවල්වල අපූරුව බලන්නේ”

“ඇයි මහප්පෙ මෙච්චර කල් යද්දි ඕව පරණ වෙනව නේන්නම්. දැන් කොයිම ගෙදරකවත් ඔය වාගෙ පරණ බඩු නෑ”

එවර “අයි අයියෝ” කියමින් සීයා මහප්පා නලලට අත ගසා “ඇයි බොලව් මේ ගෙදර තුබුණු ගිරංපෝං එකේ නලාව නේද? කෝ මේකෙ කතා පෙට්ටිය” කියමින් මල බැඳුනු ග්‍රැමපෝන් නලාව උස්සාගෙන එලියට ආවේය. මටත්

නංගිටත් සිනහ පහල විය. ඒ දුටු සීයා මහප්පා අප දෙස රවා බැලීය.

"ඔය මලකඩ බඩු අතගාන්ඩ එපා අයියේ. අපි යමු ගෙදර" යයි සීයා පැවසූ විට තවත් කෝප වූ සීයා මහප්පා "මලකඩ බඩු? කාගෙ වැරැද්දෙන්ද ඕව මලකඩ කෑවේ. මං මේක හදාගන්ඩ ඕනෑ" කියා නලාව ඔසවා එහි ඉතුරු කෑලි ටිකත් ඇහිඳ ගත්තේය.

"හොඳයි මහප්පෙ අපි හදමුකො ඕක" කිවූ අපේ තාත්තා ඒවා අතට ගෙන සීයා මහප්පාවත් කැඳවාගෙන ගෙට ආවේය. කාටත් දැන් සිනා පහළ වීමට ආසන්නය. ඒත් කවුරුන් වුවත් සිනාසීමට බය බව පෙනේ. ඒවාත් සමග සීයා මහප්පාව පිටුපස ආලින්දයට කැඳවාගෙන ආ තාත්තාත් සීයාත් "අපි මේක පොල්තෙල් ගාල මදිමු නේද?" කියමින් බොරු වැඩක් කරන්නට අර අඳින බව මට වැටහුණි. ඉන්පසු සීයා මහප්පා තරමක් සන්සුන් විය.

"එහෙනම් අපි මේක හදමු" කියමින් අයියාද එතැන වාඩිවිය.

"කෝ මේකෙ තැටි" සීයා මහප්පා අසයි.

"මොනවද තැටි කියන්නේ" නංගි නොදන්නා කමට ඇසුවාය.

"තැටි කියන්නෙ? ඇයි උඹල ඒව දැකලවත් නැද්ද? මේ ගෙදර මහ එවුන් ඒව ගිලලද?" නැවතත් සීයා මහප්පාට තරහ ගියේය.

"ඒව ගුණපාල ගිල්ලද දන්නේ නෑ නේද අයියේ" කියා නංගි මා දෙස බැලුවේ ඇත්තටම ඒවා ගිලින්ට පුළුවන් ජාතියක් යයි සිතා නොදන්නා කමටමය. ඒ ඇසූ සීයා මහප්පාට හොඳටම තරහ ගියේය.

"උඹල මාව සෙල්ලමට ගන්ඩ හදනවාද?" කියා සැරවූ විට බියවූ නංගි අම්මා ළඟට දිව්වාය.

"සීයා මහප්පේ මං ඒව අරං තියලයි තියෙන්නේ. නංගි පොඩි එකානේ ඒව මොනවද කියල දැකලවත් නෑ. ඒකයි එහෙම කියන්ඩ ඇත්තේ" කියා අයියා කිව්වේ සීයා මහප්පාව සැනසීමට මිස තැටි තිබෙනවාට නොවේ. ටික වේලාවකින් අයියාත් තාත්තාත් සීයාත් ඔහු සමග නොයෙක් අන්දමේ කථා කරමින් ඔහුගේ කෝපය තුනී කර දැමීමට සමත් වූහ. දැන් ඔහුගේ මුහුනේ අමුතු ප්‍රබෝධයක් පෙනේ.

අම්මා සවස තේ සූදානම් කිරීම සඳහා හීටරය ගසා වතුර භාජනය රත් කරමින් සිටියාය. සීයා මහප්පා සුරුට්ටුවක් රැගෙන් කුස්සියට එබී බලා "ළමයො මට ගිනි පෙනෙල්ලක් දියං මේක පත්තු කර ගන්ඩ" කීය. එවිටම එතැනට ගිය තාත්තා සාක්කුවෙන් ලයිටරය ගෙන දල්වා "මෙන්න මේකෙන් පත්තු කර ගන්ඩ" කියා ළං කළේය. එක වරම පස්සට අඩිය තැබූ සීයා මහප්පා "මොකද්ද බං මේ" කියා

බයෙන් වගේ සුරුට්ටුව පත්තු කර ගත්තේය. පසුව කුස්සිය තුළට දෙනෙත් යැවූ ඔහු “කෝ දර ලිප” කියා ඇසීය. අපේ ගෙදර දර ලිප් නැත. ලිප් දෙකක් සහිත ගෑස් ලිප පෙන්වූ තාත්තා “මේ ලිප් තමයි මහප්පෙ අපි පාවිච්චි කරන්නේ” කියා පැවසීය.

“ඉතින් ඕකට කොහොමද බං දර දමන්නේ”

“දර ඕන නෑ මහප්පේ. මේක ගෑස් ලිපක්” කිවූ තාත්තා එය අවුලන සැටි පෙන්වීය.

“කොහොමද බං ඔය ඇබිත්තකට නැති ගිනි දලුවෙන් බත් උයන්නෙ”

“මේක මෙහෙම පෙනුනට දර ලිපකට වඩා රස්නෙයි මහප්පේ”

“අනේ මන්ද උඹලගේ මැජික්” යයි පැවසූ ඔහු එවර දුටුවේ හීටරයයි.

“මොකද්ද බං ඔය බිත්තියේ ගහල තියෙන එක”

“ආ ඕකෙන් තමයි මහප්පේ වතුර උණු කරන්නේ” යයි පැවසූ තාත්තා එය ක්‍රියා විරහිත කර වතුරෙන් උඩට උස්සා පෙන්වීය.

“අපෝයි මට නං ඔය යකඩ කම්බි තම්බපු වතුර වලින් නම් තේ හදන්න එපා”

“හා හොඳයි මහප්පේ” කියමින් අම්මා දෙස බැලූ තාත්තා මෙසේ පැවසීය.

“සීතා ඔය වෙනම දර ලිපක් හදල වතුර උණු කරල මහප්පට තේ හදා දෙන්න” තාත්තා එසේ කීවේ බොරුවට බව අම්මාටත් මටත් වැටහුණි.

සවස තේ පානයෙන් පසු සීයා මහප්පා සමග තාත්තාත් සීයාත් කථා කරමින් සිටියහ. ඒ අතර අයියා අම්මා සමග මොනවාදෝ කථා කරනු මම දුටුවෙමි. මමත් ඒ දෙසට ගියෙමි.

“අපේ ගෙදර අයටත් පිස්සුද මන්ද උන්දැව එක්ක ආවේ” අම්මා එසේ අයියා සමග කියනවා මට ඇසුණි. මා පැමිණි නිසා අම්මා කථාව නතර කළාය. අයියාත් සීයලා සිටින තැනට ගියේය. මමත් ගියෙමි.

“අයියේ යමුද වෙල් යාය පැත්තේ” සීයා මහප්පාගෙන් සීයා අසයි.

“යං මලෙය ඒක හොඳයි. මටත් දැන් ඒ පැත්ත බලන්ඩ ආසයි”

හැම දෙනාම නියර දිගේ පේලියට යන අතර පිටුපසින්ම ගියේ මාය. ඒ නිසා ඉදිරියෙන් යන අය කියන සමහර දේවල් මට නොඇසේ. සීයා මහප්පා අසන ප්‍රශ්න වලට කවුරු හෝ උත්තර දෙති. වෙල් යාය පසු කළ අපි කමතේ වාඩි

වූයෙමු. ඊට එහායින් තිබුණේ රොමානිස්ලා හිටපු ඉඩම් කැල්ලය. සීයා මහප්පා කල්පනාකාරී ලෙස ඒ පැත්ත බලා සිටිනු දුටු තාත්තා අපේ සියා දෙස බලා ඇසින් යම්කිසි ඇහවීමක් කළේය. ඒ ඉඟිය තේරුම් ගත් ඔහු සීයා මහප්පාගේ අවධානය වෙන අතකට යොමු කරවීම සඳහා මෙසේ කීය.

“අයියේ අයියට මතකද මේ වෙල ඉස්මත්තේ ඉස්සර තිබුණු කැළේ? අපි ගියේ හාවෝ වෙඩි තියන්ඩ”

ඒ කාලේ සීයලාගේ තාත්තා ගම්මුළාදෑනියාය. ඔහු තරමක් නපුරු ගති ඇත්තෙකි. අර පෙනෙන ඉඩම් කැල්ලේ රොමානිස් නම් මිනිසෙක් ඔහුගේ පවුල සමග පදිංචිව සිටියේලු. ඔහු සීයලාගේ කුඹුරුවල වැඩපල කළ අතර ඔහුගේ බිරිඳ අපේ ගෙදර වැඩපල කළේලු. ඔවුන්ට සිරිමලී නම් ලස්සන දුවක් සිටියාලු. ඒ කාලේ අපේ සීයා මහප්පා සිරිමලී සමග සම්බන්ධකමක් පැවැත්වූ නිසා සීයා මහප්පාගේ වැඩිහිටියෝ රොමානිස්ලාව ගමෙන් එලවා දැම්මාලු. සීයා මහප්පාටද වැඩිහිටියන්ගෙන් බොහෝ හිරිහැර සිදු වූයේලු. එයින් ඇතිවූ මානසික පීඩනය නිසා ඔහු උමතු රෝගියෙකු වී ඇත. වයස විසි අටක කාලයේ සිට උමතු රෝහලේ අවුරුදු පනහක් පමණ ගත කළත් ඔහුගේ රෝගය නිට්ටාවට සුව නොවීය. දැන් ඔහුගේ වයස අවුරුදු හැත්තෑ අටකි. ටික වේලාවක් ඈත බලා සිටි සීයා මහප්පාට නැවත අතීතය සිහි වී මෙසේ පැවසීය.

“මලෙය මම මේ කල්පනා කළේ අර ඉඩම් කැල්ලේ හිටපු රොමානිසාල ගැන. අපේ අප්පච්චිල උන්ව එලව ගත්තනේ”

“ඒකෙන් උන්ට පාඩුවක් උනේ නෑ අයියේ. උන්ට එහෙ ඉඩම් එහෙම හම්බ වෙලා ගොවිතැන් බත් කරගෙන ජයට ඉන්නවලු”

“ඒත් අපේ අප්පච්චිල මහ අමනුස්සයො. අර සිරිමලී කෙලීටත් බැනල එලව ගත්තනේ. හැබැටම මලෙය සිරිමලී ගැන නැද්ද ආරංචියක් එහෙම”

“ඇයි අයියේ ඒකිත් දැන් අපි වාගේම නාකි ඇතිනේ. ඒකි බැඳල දැන් දරු මුනුබුරොත් නැතෑ”

“මොනව ඒකි බඳින්ට ඇද්ද” සීයා මහප්පා ප්‍රශ්න කළේ පුදුමයෙනි. හැමදෙනාම පුදුමයෙන් මුහුණට මුහුණ බලා ගත්හ.

“නෑ නෑ මලෙය ඒකි බඳින්ඩ නැතුව ඇති” කිවූ සීයා මහප්පාගේ මුහුණද වෙනස් විය. තත්වය තේරුම් ගත් අපේ තාත්තා “දැන් ඉතින් ඉරත් බහින්ට ලඟයිනේ. ගෙදර යමු නේද” ඇසුවේය. එවිට හැම දෙනාම නියර දිගේ ගෙදර පැත්තට ගමන් ගත්හ. හැම දෙනාම ගොළුවන් සේ යති. මම අයියාගේ අතින් අල්ලා ගත් විට අයියා මා දෙස බලා ඇස් දෙකෙන් සීයා මහප්පාව පෙන්වා සිනාසුනේය. මම අයියාගේ උරපත්තේ එල්ලී කණට කර මෙසේ කීවෙමි. “උන්ද නාකි වුනාට මනමාලකමනං එහෙමමයි” එවිට යන්තමින් සිනාසුනු අයියා මගේ

කණ මිරිකුවේය.

ගෙදර එන විට අඳුරද වැටුණි. රූපවාහිනිය ක්‍රියාත්මක කරවූ අයියා ඒ දෙස බලා සිටී. සීයා මහප්පාද ඒ දෙස බලා "ඔන්න ඔය වාගේ විගඩමක් ඉස්පිරිතාලෙත් තිබුණ" යයි පැවසීය. ක්‍රමයෙන් රෑ බෝවිය. සීයා මහප්පා වරින් වර රූපවාහිනිය දෙස බලමින් "නාඩගං, කෝලං" යන වචන කටින් පිට කරමින් නුරුස්සන ගතියෙන් ඒ දෙස බලයි. රෑ කෑම මේසයේදී දවල් තරම් සතුටක් සීයා මහප්පා තුළ නොවීය.

තාත්තලා කොතරම් කථා කළත් සීයා මහප්පා නිහඬය. සින්දු කියමින් නටන කාන්තාවක රූපවාහිනියෙන් දුටු සීයා මහප්පා ටික වේලාවක් ඈය දෙස බලා සිට "චහ් අරකිත් හරියට සිරිමලී වගේමයි" කීය. හැමදෙනාටම සිනහ පහළ වූ නමුත් අම්මාගේ මුහුණේ බියපත් බවක් පෙනුනි. "මට නිදාගන්ඩ ඕනෑ මලෙය" යි සීයා මහප්පා හදිසියේම පැවසූ විට "හා යමු අයියේ. අද ලැස්ති කරලයි තියෙන්නේ" කියමින් සීයා ඔහු කැටුව කාමරයට ගියේය. රෑ බෝවූ පසු අපිත් නිදාගතිමු. දැන් හැමෝම තද නින්දේය. වේලාව රාත්‍රී දෙකයි තිහට පමණ ඇත. සීයාගේ කාමරය තුළ කලබලයකි.

"ලමයිනේ මෙහෙ වරෙල්ලා" ඒ සීයගේ හඬය. තාත්තාත් අයියාත් එතැනට දුවනු දුටු මමත් දිව්වෙමි. සීයලා දෙදෙනා අතර පොරයකි. සීයා මහප්පා අපේ සීයාට පහර පිට පහර දෙන අතර ඔහු පවසන වචන ඇසේ.

"යකෝ උඹ කසාද බැඳල උඹටත් දරුවො ඉන්නව. උඹේ පුතාටත් දරුවෝ ඉන්නවා. දැන් සිරිමලීත් බැඳල ඒකිටත් දරු මුනුබුරන් ඇති. මං විතරක් නිකම්ම නාකි උනා"

අයියාත් තාත්තාත් බොහෝ අමාරුවෙන් සීයාව බේරා ගත්හ. සීයා මහප්පා හැමටම බැන වදී. ගහන්ට සැරසෙයි. සීයාගේ තොල් පැලී ලේ ගලයි.

"අනේ මහප්පේ කලබල නොකර ඉන්ඩකෝ. අර බලන්ඩ තාත්තට තුවාලත් වෙලා ලේ ගලනව" යයි කීවේ අපේ තාත්තාය.

"ඔව් තොටත් අමාරුයි නේද? ඒ තොගේ තාත්ත හින්ද. මට තාත්තා කියන්ඩ කවුරුත් නෑ" යනුවෙන් කෑ ගසන සීයා මහප්පාගේ මුහුණේ ඇත්තේ රෞද්‍ර පෙනුමකි.

"සීයා මහප්පටත් අපි පෙලවහක් කරල දෙන්නම්කෝ"

එසේ කීවේ අයියාය. ඒ වචන කටින් පිට වෙනවාත් සමගම 'චටාස්' යන හඬින් අතුල් පහරක් අයියාට වැදුනේ සීයා මහප්පාගෙන්ය. ඒ පහරින් කරකැවී ගිය අයියා දැතින්ම කම්මුල බදාගෙන වේදනාවෙන් වුවත් සිනහසෙමින් එළියට දිව්වේය. අම්මාගේ පොරෝනය තුළට රිංගාගෙන සිටින නංගී දැස් ලොකු

කරගෙන බලා හිදියි. ඈ හොඳටම බය වෙලාය. ගෙදර වැඩ කරන ගුණපාලද වහාම එතැනට දුව ආවේය. තාත්තා ඔහු අමතයි.

"ගුණපාල දුවපන් ඉක්මණට. ගජබා මහත්තයලගේ ගෙදරට ගිහින් මේ විස්තර ඔක්කොම කියල මම මහත්තයට එන්ඩ කිව්ව කියාපන්"

ගජබා මහත්තයා කීවේ අපේ බාප්පාටය. නැවතත් සීයා මහප්පාගේ ගෝරනාඩුව කාමරය තුළින් ඇසේ.

"හුහ් තොගෙ පුතා කියන්නේ මට පෙලවහක් කර දෙනව කියල. කාවද බොල මං පෙලවහට ගන්නේ. ගන්ඩ හිතාගෙන හිටපු එකම ගෑණි තමයි බොලව් සිරිමලී. දැන් ඒකිත් බැඳල"

සීයා මහප්පා එසේ කෑ ගහන අතර ගජබා බාප්පාද පැමිණියේය. ඔහුව දුටු ගමන් සීය මහප්පාගේ කෝපය උත්සන්න විය.

"ආ තෝත් ආවද? යකුනේ තොපි ඔක්කොම එකතු වෙලා මාව කැවා. අපේ අප්පච්චි එක්ක එකතු වෙලා තොපේ සනුහරේම මාව කැව. අර අහිංසකයින්ව ගමෙන් එලව ගත්ත. ඒ මදිවට තවත් එනව කාලකණ්නි"

ගජබා බාප්පා සන්සුන් ලෙස තාත්තා සමග කථා කරයි.

"ආයෙත් ලෙඩේ වැඩිවෙලා නේද අයියේ"

"ඔව් මල්ලි. ගෙදර ගෙනාවොත් ලෙඩේ වැඩි වෙනවාමයි. දැන් ඉතින් එලි වෙනතුරු කොහොම හරි තියා ගන්ඩ එපායැ"

"කාමරේට දාලා දොර වහමු නේද"

"ඔව් ඒක හොඳයි" කවුරුත් එය අනුමත කළහ. දොර වසා යතුර දැමූ පසු සීයා මහප්පා නැවතත් කෑගසන්ට විය.

"ඔව් දොර වහපියව්. මට තොපිව පේන්ඩ බැහැ. වහපියව් කාලකණ්නි යක්කු"

"අනේ සිරිමලී උඹ කොහෙද ඉන්නේ? ඇයි උඹ මට නොකියාම බැන්දේ. ඒත් ඉතින් උඹ වැරදිකාරියක් නෙවෙයි. ඒක මුංගෙ වැරැද්ද" මෙසේ කියමින් ඔහු කෑගසන අතර කාමරය තුළ නොයෙකුත් ශබ්ද ඇසේ. 'ටකස්, බකස්, දඩාං, බඩාං' යනුවෙන් පුටු මේස හා වෙනත් නොයෙකුත් දේවල් පෙරලන හඬවල් එක දිගටම ඇසේ.

"ඔහේ ඕනැ දෙයක් කරපුදෙන්" ඒ තාත්තාගේ හඬය.

අම්මා අයියාගේ ඉදිමී ඇති මුහුණ දෙස බලා අතගායි. ඇගේ දෑසේ කඳුළු පිරුණි.

"මොනව කරන්ඩද අම්මේ සීය මහප්ප හිතල කරපු දෙයක්යැ" අයියා කියයි. තාත්තාත් අයියාගේ මුහුණ දෑතින් අල්ලාගෙන දුක්මුසු ස්වරයෙන් මෙසේ කියයි.

"බොහොම තදට වැදිල තියෙනව පාර. මොනව කරන්ඩද පුතේ. අපි උදෙන්ම සීය මහප්පව ආයේ අරගෙන යමු"

"හොඳයි තාත්තේ"

දැන් ගෙදර සැමදෙනාම අවදිව සිටිති. අම්මා සැමට කෝපි ගෙනාවාය. දැන් පාන්දර යාමයට ලං වී ඇත. කාමරය තුළින් අමුතු ශබ්දයක් ඇසේ. 'වස් වපස්' යනුවෙන් ඇසෙන්නේ හරියටම බිත්තියට මැටි ගසන්නාක් වැනි ශබ්දයකි. අයියා පුටුවකට නැග ග්‍රිල් එක තුලින් කාමරය තුළ බැලීය. එකවරම බිමට පැන්න අයියා සිනහව නවත්වා ගත නොහැකිව මිදුලට දිව්වේය.

"මොකද පුතේ"

"කියල වැඩක් නෑ. කියල වැඩක් නෑ"

"ඇයි පුතේ මොකද. සීය මහප්ප මොනව කරනවද"

"කරන්ඩ ඕනැ දේ කරල ඒවයින් තමයි ඔය බිත්තිවලට වස් පස් ගගා ගහන්නේ"

"ඔහෙ පලයං" යයි පැවසූ සීයා ඉදිමී රතුවී තිබෙන තොල් පෙති සොලවා අමාරුවෙන් සිනාසුනේය. විකෘති වූ තොල් වලින් සිනාසෙන විට සීයාගේ කට මට පෙනුනේ හොරු කඩාපු ලාච්චුවක් වගේය.

අයියා නැවතත් පුටුවට නැග බලා බකස් ගා සිනාසී මෙසේ කීය.

"ඒ පාර ඇඳේ ෂීට් වලින් අත් පිහනව"

හැම දෙනාම බක බක ගා සිනාසුනහ.

"හින වෙයව් හිනා වෙයව් යක්කු" සීය මහප්පා සැමටම බැන වදී.

ටික වේලාවක් ගත විය. කාමරය තුළ ඇත්තේ නිහඬතාවයකි. නැවතත් පුටුවට නැග බැලූ අයියා සීයා මහප්පාට නින්ද ගොස් ඇති බව පැවසීය. නමුත් ගෙදර සැමදෙනාම අවදිව කථා කරමින් සිටියහ. අම්මාට තුරුළු වී පුටුවේ නිදා වැටෙන නංගී තවමත් බිය වූ ගමන්ය.

"අම්මේ අර සීය මහප්ප ආයෙත් ඇහැරෙයිද?"

"නෑ දුව"

"ආයෙත් අයියට ගහයිද"

"නෑ නෑ ආයෙත් මුකුත් කරන්නේ නෑ"

"වහ කෑවොත් මැරෙනව නේද අම්මේ"

"ඔව් දුවේ. මොකද දුව එහෙම ඇහැව්වේ"

"ඉතින් සීය මහප්පටත් බැරියැ වහ කන්ඩ"

"එහෙම කියන්ඩ එපා දුවේ. සීය මහප්පට බේත් දීල සනීප කර ගන්ඩ ඕනෑ"

"සීය මහප්ප මැරෙන්නෙම නැද්ද"

අම්මා නංගීගේ කට අතින් වැසුවාය. නංගි දෙස බලා සිටින කාගේත් මුහුණුවල ආදරය මුසු සිනහවක් පහල වී ඇත. කුකුලා අවසන් වරට හැඩලීය. එලිය වැටීගෙන එයි. ගජබා බාප්පා යන්ට නැගිට මෙසේ කීවේය.

"මම දැන් ඉතින් යන්නම් අයියේ. ආයෙත් මාව දැක්කොත් එයාට කේන්තිය වැඩි වෙයි"

ටික වේලාවකින් කාමරය තුළ ඇවිදින ශබ්දයක් ඇසී සීයා දොර හරින්නට සූදානම් විය.

"අනේ සීයේ ආයෙත් ගහයි. දොර අරින්ඩ එපා" මම කීවෙමි.

"ගැහැව්වත් මක් කරන්ඩද? දැන් ඉතින් ආයේ එක්ක යන්ඩත් එපායැ" යි පැවසූ සීය දොර හැරියේය. නංගි කුස්සිය දෙසට දිව්වාය. අපි හොරෙන් එබී බැලුවෙමු. සීයා මහප්පා මලපහ කර ඒවා ගාගත් ඇඳුම් පිටින්ම ඇඳ උඩ වාඩිවී සිටී. කාමරයේ ගඳ ඉවසන්නට බැරිය.

"අයියේ යමුද අපි මූණ කට හෝදගන්ඩ" සීයා ඔහුගෙන් අසයි. ඔහු සීයාගේ වචනයට එකඟ වී පොඩි ළමයකු සේ සීයා සමග නාන කාමරයට ගියේය. තාත්තාත් සීයාත් එකතු වී සීයා මහප්පාව හොඳ හැටි නාවා පිරිසිදු ඇඳුම් අන්දවා ගෙට කැඳවාගෙන එන අතර ගුණපාල කාමරය සෝදා පිරිසිදු කළේය.

කෝපි කෝප්පයක් පිළිගැන්වූ පසු සීයා මහප්පාට උණු ආප්ප ලුණුමිරිස් සමග කන්නට දුන්නේය. ගෙනත් තබන ආප්ප සේරම සීයා මහප්පා ගිල දැමුවේය. දැන් ඔහු නිහඬය. ගෙදර සැම දෙනාම උදය ආහාර ගෙන අවසන් වූ පසු සීයා මහප්පා

නැවත කැගසන්ට විය.

"කෝ බොලව් අර ගජබා කියන එකා. ඕකා මොනවට ආවද මාව බලන්ඩ"

කිසිවෙක් ඊට උත්තර නොදුන්හ.

"තාත්තේ ආයෙත් පටන් ගන්නයි හදන්නේ. ඉක්මනට ගෙනියමු" අපේ තාත්තා සීයාට කියයි.

"ඔව් ඔව් මම මොකක් හරි බොරුවක් කියල යන්ඩ ලෑස්ති කර ගන්නම්" යයි කිවූ සීයා සීයා මහප්පා ලඟට ගොස් මෙසේ කියනවා ඇසුණි.

"අයියේ අපි යමුද නංගිලගේ ගෙදර ගිහිං එන්ඩ"

"ආ ... නංගි කිව්වේ ... බිසෝමැණිකද? ඕකිද, ඕකිත් ඉස්සර අප්පච්චිට කේලම් කිය කිය මට බැන්නෙව්ව. අරුංව එලව ගන්ඩ ඕකිත් කොච්චර නැටුවද. කමක් නෑ යංකො ඕකිට දෙකක් තුනක් කියල එන්ඩත් එක්ක. යං මලෙය"

"ඔව් ඔව් එහෙනං ලෑස්ති වෙමු නේද අයියේ" යයි පැවසූ සීයා අයියාත් තාත්තාත් සමග ගමනට සූදානම් විය. ඒ අතර සීයා මහප්පාට හොරෙන් ඔහුගේ සූට්කේස් එකද අයියා විසින් මෝටර් රථයේ ඩිකියට දමන ලදී.

සීයා මහප්පාද හොඳට ඇඳ පැළඳ ගෙන මෝටර් රථයට ගොස් වාඩි වූයේ නැවතත් මේ යන්නේ මානසික රෝහලට බව නොදැනය.

# කවුද ඒ

දැනට වසර හතලිහකට පමණ පෙර එය කාන්තා ගුරු අභ්‍යාස විද්‍යාලයකි. ඒ කාලයේ ගුරු අභ්‍යාස විද්‍යාල වලට තෝරා ගනු ලැබුවේ ප්‍රවේශ පරීක්ෂණයකින් සමත්වූ පසු ලකුණු අනු පිළිවෙලින් සම්මුඛ පරීක්ෂණයකටද කැඳවනු ලැබීමෙනි. එම සම්මුඛ පරීක්ෂණයෙන් සියළු සුදුසුකම් පරීක්ෂා කරන ලදී. කියවීම, කථාව පෞරුෂය, බුද්ධිය, නැටුම් ගැයුම් හෝ වෙනත් දක්ෂතා පිළිබඳව ඇති සියළු හැකියාවන් විනිශ්චය මණ්ඩලය ඉදිරියේ පෙන්විය යුතු විය. මෙසේ තෝරා බේරා ගරා ගත් සිසු සිසුවියන් විදුහලට ඇතුළත් කර ගත් පසු පුහුණු කාල සීමාව පසු වන තුරු අනිවාර්යයෙන්ම නේවාසිකාගාරයේ නතර විය යුතුය. අභ්‍යාස විද්‍යාලයට යාබද නිවසක පදිංචි සිසුන් පවා නේවාසිකාගාරයේ පදිංචි විය යුතුමය. තරමක් දැඩි නීති රීති යටතේ පාලනය වූ ඒ කාලයේ විනය ගරුක වීම ඉතාම අවශ්‍ය දෙයක් විය. පෙම් සබඳතා හා නොයෙකුත් දඩබ්බරකම් ආදියට විනයානුකූල දඬුවම් විඳීමට සිදු විය. නුවුමනා විහිලු තහලු වලට පවා එහි තත්වය අනුව දඬුවම් ලැබුණි.

දිනක් අපි රාත්‍රි අටට පමණ නියමිත ශාලාවේ පාඩම් කරමින් සිටියෙමු. පාඩම් කරන වේලාවල්වල කථා කිරීම තහනම්ය. මට දෙපසින් වාඩිවී සිටින රමණී සහ ලලනි රහසින් මොනවාදෝ කියති.

“කතා නොකර පාඩම් කරපල්ල බං” මම පැවසීමි. ලලනි යමක් රහසින් කියා රහසින්ම සිනාසෙයි. ඉදිරි පෙළේ සිටින නිලිකා පිටුපසට හැරී අප දෙස බලා “මොනවද බං උඹල හිමිං හිමිං දොඩවන්නේ” යි අසයි. “හැරියං ඉස්සරහට. මොකටද උඹ පස්ස බලන්නෙ” ලලනි පවසයි. මේ කසුකුසුව දුටු බෝඩිමේ පාලකවරිය වන කථිකාචාරිණී සුගතදාස මහත්මිය ශාලාව ඉදිරියට පැමිණ බලා සිට මෙසේ අසයි.

“මොකද ඔය තුන් හතර දෙනා පාඩම් කරන්නේ නැද්ද. මට පේනව මොකක්ද කසු කුසුවක් තියෙනවා”

“නෑ මැඩම් මුකුත් නෑ”

"මුකුත් නැත්නම් ඇයි හීනා වෙන්නේ. නිකං හීනා වෙන්නේ පිස්සොනේ. ඔය ළමයින්ට එහෙම මුකුත් නැහැනේ" යයි පවසමින් ඇය ශාලාව වටේ හෙමින් හෙමින් ඇවිදින්නීය.

ඔරලෝසුවේ නවයයි තිහ හඟවන හඬ ඇසෙනවාත් සමඟම හැමෝම නැගිට පොත්පත් අස් කර පුටු පිළිවෙලට තබා නිහඬව නිදා ගැනීමට යාමට සූදානම් වෙති. පොත්පත් තබන හා පුටුවල ශබ්දය හැර වෙන ඇත්තේ හැමෝම පියවර තබන හඬ පමණි. හැම දෙනාම ඉක්මණින් පඩි පෙළ නගිමින් නිදන ශාලාවට යති. හැමදාම හැම දෙනාටම පළමුව දුව ගොස් ඇඳ මත පෙරලෙන්නේ ජයන්ති හා ප්‍රියන්තිය. එදාත් ඒ දෙදෙනා හැමටම පළමු ශාලාවට දිවූ නමුත් ඒ පයින්ම ආපසු හැරී දුව ආවේ මහ හඬින් කෑගසමිනි. කලබල වූ සමහරු සිදුවූයේ කුමක්ද කියාවත් නොදැන නිකම්ම කෑගසන්ට වූහ.

"මොකද මේ. කරුණා කරල නිශ්ශබ්ද වෙන්න. නිශ්ශබ්ද වෙන්නකො. මොකද වෙලා තියෙන්නෙ" ඒ ශිෂ්‍යා නායිකාවගේ හඬය.

පඩිපෙළ නැගුණු අය බිමට දුවගෙන එති. මිසිස් සුගතදාසද කලබලයෙන් පැමිණ ප්‍රශ්න කරයි.

"මොකද ළමයි කෑගහන්නේ. කියන්ඩ මොකද උනේ කියල"

"අනේ මැඩම් ... කවුද ... මිනිහෙක් ... කවුද ... මිනිහෙක්"

"මොනව මිනිහෙක්?"

"ඔව් මැඩම් කවුද මිනිහෙක් ඇතුළෙ ඇඳක් උඩ නිදි"

එසේ පැවසූයේ කලින්ම නිදා ගැනීමට දිවූ ජයන්ති සහ ප්‍රියන්තිය. ඔවුන්ගේ ඇඳුම් ඩහදියෙන් තෙත් වී ඇත. බියපත් මුහුණින් තවමත් පසු වන ප්‍රියන්ති නැවතත් මෙසේ කීය.

"අනේ මැඩම් කවුද කලු මහත මිනිහෙක්"

"ඔය ඇත්තමද?"

"අනේ ඔව් මැඩම්"

"යමු බලන්ඩ" කියූ මැඩම් ශිෂ්‍යා නායිකාව සමග යන විට තවත් කීප දෙනෙක් ඔවුන් පසුපස ගියහ. අපිත් පිටුපසින් ගියෙමු. ඒ අය ශාලාව ඇතුළට නොගොස් ඈත සිට ජනේලයකින් බැලූහ. වහාම ආපසු හැරුණු මැඩම් කලබල වී සිටින ළමයින් දෙස බලා මෙසේ කීවාය.

"හැමෝම බහිනව පහලට. කිසිම කෙනෙක් මං කියන තුරු උඩට යන්ඩ එපා"

ඒ ඇසූ අපි මැඩම් සමග පහලට ආවෙමු. නැවතත් මැඩම් අප අමතා මෙසේ ඇසුවාය.

“දැන් හැම දෙනාම මං අහන දේට උත්තර දෙන්න. ඇත්තම කියන්ඩ. ඔයාලගේ කවුරු හරි එහෙම බෝඩිමට ආවද? ඒ ඉන්න කෙනා කවුරු හරි අඳුනනවද?”

“නෑ මැඩම්” හැමෝම පිළිතුරු දුන්හ. ලලනි මගේ අත කෙනිත්තුවාය. ඈ මගේ කණට කර මෙසේ කීවාය.

“වැඩේ දිග් ගැහෙන්ඩයි යන්නේ. මොකද කරන්නේ”

‘ටිකක් ඉම්මුකො තවම මුකුත් උනේ නැහැනේ”

මේ අතර කෙල්ලන්ගේ කියවිල්ල එකම කරච්චලයකි.

“උඹ දැක්කද”

“නෑ බං. කවුද දැක්කේ”

“අරුං දෙන්න කෑගහනකොට අපිත් බැලුව. අපිත් දැක්ක”

“ඒ මිනිහ ඉරි ෂර්ට් එකක් ඇඳල කොල පාට ඉරි තියෙන පිජාම සරමක් ඇඳල කොණ්ඩෙ ක්‍රේල්”

“කලුම කලුයි යකෙක් වගේ”

මේ විධියට එකිනෙකා කියන ඒවා අසා මා ළඟ සිටින රමණි සහ ලලනි මගේ කැලි කැඩෙන තරමට තදින් කොනිත්තති. මට දැන් සිතට බයකුත් දැනේ. මම දෙදෙනාටම වැලමිටෙන් අනිමින් ගොලුවත රක්කෙමි. ටිකකින් අප ඉදිරියට ආ මැඩම් මෙසේ පැවසුවාය.

“ළමයි කිසි දේකට බය වෙන්ඩ එපා. මම ප්‍රින්සිපල්ට කෝල් එකක් දුන්න. දැන්මම එනව කිව්ව.”

අපි තිදෙනා වෙව්ලා ගියෙමු.

“අපි ඇත්ත කියමුද” ලලනි ඇසුවාය.

මට කිසිවක් සිතා ගැනීමට වේලාවක් නොවීය. නේවාසිකාගාරය කිට්ටුව පදිංචිව සිටි විදුහල්පතිතුමාගේ මෝටර් රථය ගේට්ටුවෙන් ඇතුළු වනු පෙනුණි. ඒ සමගම අවට ගෙවල්වල කීප දෙනෙක්ද මේ කලබලය ඇසී ගේට්ටුව අසල සිට මෝටර් රථය පිටුපසින් නේවාසිකාගාරය දෙසට එති. අපට හීං දාඩිය දැමීය.

කිසිවක් කියා ගත නොහැකිව අප බියෙන් ගොලු වී සිටින අතර විදුහල්පතිතුමා "මොකද මැඩම් වෙලා තියෙන්නේ" කියමින් තමා කැටුව ආ කීප දෙනෙකු හා මැඩම්ද සමග පඩි පෙල නැගීමට පටන් ගත්තේය.

"බලාගෙන ඉඳල වැඩක් නෑ. ඇත්ත කියමු" යයි රමණී මා හට කොඳුරා කීවාය.

"ඔව් බං. ඇත්ත කියමු" මමත් කීවෙමි.

ලලනිත් වෙව්ලමින් අප දෙදෙනා දෙස බලයි. නමුත් අප තුළ ඇති යම්කිසි බලවේගයකින් අපව නිහඩ කරවයි. ඒ අතර විදුහල්පති, මැඩම් හා ශිෂ්‍ය නායිකාව සමග අපිත් පඩි පෙල නගින්ට ගියෙමු. අපට අවශ්‍ය වූයේ ඇත්ත කීමටය. අප දුටු විට මැඩම් "ලමයි නවතින්ඩ. එන්ඩ එපා. අපි ගිහිං එනතුරු ඔයාල ඉන්ඩ" යයි පැවසුවාය. මම ඉතා අමාරුවෙන් කට ඇරියෙමි.

"අනේ මැඩම්"

"මොකද"

අනිත් දෙදෙනා වෙව්ලති. මට වචන පැටලේ. එවිට ආපසු හැරී බැලූ විදුහල්පතිතුමා මෙසේ ප්‍රශ්න කළේය.

"මොකද මැඩම් ඔය ලමයි කියන්නේ"

"අනේ සර් . . ." මට කිව හැකි වූයේ එපමණය.

දැන් මැඩම්ට හොඳටම තරහ ගොස්ය. ඈ අපට සැර විය.

"මොකද ලමයිනේ. අනේ මැඩම් අනේ සර් කිය කියා කෙඳිරි නොගා කියන කෙහෙල්මලක් කියනව"

"සර් ඒ ඉන්නේ" මම මවා ගත් ධෛර්යයකින් යුතුව කථාව පටන් ගතිමි. එවිට කෝපය මුහුණට ආරූඪ කර ගත් විදුහල්පතිතුමා "ඔව් ඒ ඉන්නේ කවුද? මා එක්ක සෙල්ලම් කරන්ඩද හදන්නේ. කවුරු උනත් යං මැඩම් අපි මිනිහව බලන්ඩ" කීය. සැම දෙනාම පඩි පෙල නැග ඒ දෙස බැලූහ.

"සර් ඒ ඉන්නේ මිනිහෙක් නෙමේ"

"එහෙනම් හොල්මනක්ද" කියා සර් රවා බලන විට මැඩම්ගේ මුහුණේද කෝපය එළියට පැන්නේය"

"ඇත්ත තමයි මැඩම්. ඒ ඉන්නේ මිනිහෙක් නෙමේ" ලලනිද අමාරුවෙන් පැවසුවාය.

“එහෙනම් අර නිදා ඉන්නෙ යකෙක්ද?” යනුවෙන් ප්‍රශ්න කළ මැඩම් අප දෙස රවා බලමින් විදුහල්පති සමග එතැනට ගියාය.

අපට කිසිවක් කර කියා ගත නොහැක. එවිටම විදුහල්පතිගේ ගැඹුරු කටහඬ ඔහු වෙත එල්ල විය.

“කවුද ඔය. නැගිටිනව ඉක්මණට”

විදුහල්පතිගේ කටහඬ හඳුනා ගත් ඒ මිනිහා ඉද්ද ගැසුවාක් මෙන් නැගිට සිටියේය. වහාම බොරු කොණ්ඩයත් සරමත් ෂර්ට් එකත් ගලවා අතට ගත් විට සුපුරුදු ගවුමෙන්ම සිටි විනීතා කාටත් අඳුනා ගත හැකි විය.

“සමාවෙන්න සර්” යනුවෙන් විනීතා ඉතාම විනීත ලෙස කියා සිටියාය. එවිට සියළුම සිසුවියන් මහා හඬින් කෑ ගසා සිනාසුනු නමුත් අපට සිනහ පහල නොවීය. මැඩම්ගේ හා විදුහල්පතිගේ කෝපාවිෂ්ඨ මුහුණු අප කෙරෙහි එල්ල වී ඇත.

“අපූරුයි නේද නටාපු නාඩගම. අර ගේට්ටුව ගාව මිනිස්සුත් රැස් වෙලා. අපි මොනවද ඒ ගොල්ලන්ට කියන්නේ” කියමින් විදුහල්පතිතුමා විනීතා දෙස බලා තර්ජනය කළේය.

“සමාවෙන්න සර්. එයා නෙමෙයි වැරදිකාරයා අපි තුන්දෙනා” යි මම අමාරුවෙන් කියා ගතිමි.

“මොනව. එහෙනම් කලින් මට කියන්ඩ තිබුණේ නැද්ද සර්ට කෝල් එක දෙන්ඩ ඉස්සෙල්ල” මැඩම් මට කඩා පැන්නාය.

“අපි දන්නෙ නෑ මැඩම් සර්ට කෝල් එකක් දෙන බව”

එවිට අප දෙස රවා බැලූ විදුහල්පති නැවතත් කථා කළේ කෝපයෙනි.

“මොකක්ද මේ නටාපු නාඩගමේ තේරුම?”

“සර් අපි කලින් නිදා ගන්ඩ දුවගෙන එන අයට විහිලුවක් කරන්ඩ හිතාගෙන මෙයාව අන්දල තිබ්බ”

රමණී එසේ කියන අතර විදුහල්පතිතුමා දෙතොල තද කරගෙන අසා සිටියේ තරහවටද සිනහව නවත්වා ගැනීමටද කියා තේරුම් ගැනීම අපහසු විය.

“කොහෙන්ද මේ සරොම් කමිස?” මැඩම් තරහවෙන් ඇසුවාය.

“විවිධ ප්‍රසංගයට ගෙනාපුව”

අපි හතර දෙනාම හොර පූසියන් සේ බිම බලා සිටියෙමු. ළමයින් අතරේ නොයෙකුත් සිනා හඬවල් ඇසේ.

“හා හා නවත්ත ගන්නව කටවල් ටික” විදුහල්පති කෝපයෙන් කෑගැසීය.

“මේක සෙල්ලමක් කියලද හිතන්නේ? හෙට අනිද්ද වෙන කොට හැම තැනම පැතිරෙයි මේ ආරංචිය. මේක ඇතුලේ රෑ මිනිහෙක් හිටිය කියල. අපූරුයි ගුරුවරියන් වෙන්ඩ පුහුණුව ලබන ලමයි කරන විකාර” කියා පැවසූ ඔහු “මම යනව මැඩම් අර බලන් ඉන්න මිනිස්සුන්ට මොනව හරි කියල ඒ අයව පිටත් කරල අරින්න” කිය යන්ට ගියේය.

මැඩම්ද විදුහල්පති සමගම පහලට බැස්සේය. රැස්ව සිටි මිනිසුන් සමග මැඩම් හා සර් කථා කරනු අපි දුටුවෙමු. ටික වේලාවකින් මහා සිනහ හඬක් නැගූ මිනිස්සු ගේට්ටුවෙන් පිට වූහ.

දැන් ඉතින් අපේ ඉරණම විසඳෙන මොහොත ළඟය. අපි හතර දෙනා හඬන්ටත් බැරි සිනහ වෙන්ටත් බැරි තත්වයක් අතර හිර වී සිටියෙමු. අනිත් අය හැකි තරම් සිනාසෙති. කියවති.

“යකෝ මුං හතර දෙනාට ප්‍රමෝෂන් එකක් දෙන්ට එපායැ”

“අපොයි උන්ට හෙට ප්‍රමෝෂන් හම්බු වෙයි”

“මේකි හරියටම මිනිහෙක් වගේමයි. කලුවට මහතට අර ඇඳුම් ඇඳපුවාම මේකි නම් නියම මිනිහ”

“ඇත්තමයි අපි දෙන්න නම් හොඳටම බය උනා මොකාද මේ කලු තඩිය කියල” ඒ කීවේ ප්‍රියන්තිය.

“මෙච්චර දේවල් සිද්ද වෙනතුරු උඹ කොහොමද බං ඔහොම හෙල්ලෙන්නෙවත් නැතුව හිටියේ”

“මට ටිකක් නින්ද ගියා බං”

“ඇයි බොල මේකිව තියන්ඩ වටිනවයැ”

“ඒ උනත් මුං මට කියල තිබුනේ හෙල්ලෙනේ නැතුව ඉන්ඩ කියලනේ. ඉතින් ඔහේ උන්නා. නින්ද ගියා”

මෙසේ එකිනෙකා එකිනෙක දේවල් කියමින් විනෝද වන අතර මැඩම් පෙරලා පැමිණියාය.

“හැම දෙනාම නිශ්ශබ්ද වෙනව. නටාපු තොවිලේ මදිවට තව හිනා වෙන්ඩත්

පටන් ගත්ත. දැන් හැම දෙනාම නිදා ගන්නවා ශබ්ද නොකර. හෙට උදේට බලා ගම්මු ඉතුරු හරිය" යයි පැවසූ ඇ ලයිට් නිවා දමන ලෙස නියෝග කරමින් ඇගේ කාමරයට ගියාය.

විදුලි බුබුළු නැතත් පාරේ ලොකු විදුලි පහන් වලින් වැටෙන ආලෝකය නිසා අපේ නිදන ශාලාවට මඳ එළියක් වැටේ. සිනහ නොවී නිහඬ වන ලෙස නියෝග කළත් සිනහව නවත්වා ගැනීම නියෝග කරන තරම් පහසු නැත. මඳ ආලෝකයෙන් කවුරු කවුරුත් විනෝද වෙන සැටි හොඳින් පෙනේ. සමහරු උඩ පනිති. සමහරු නැමෙමින් දිග හැරෙමින් සිනහව සමග සටන් කරති. සමහරු බඩවල් අල්ලාගෙන සිනාසෙති. සමහරු අල්ලපු ඇඳේ සිටින මිතුරියන්ග් කොණ්ඩා වලින් අදිති. කකුල් වලින් අදිති. තව සමහරු උඩරට නැට්ටුවන් සේ රඟපාති. 'කිචිස් බිචිස්' යනුවෙන් සමහරුන්ගේ කටින් ශබ්ද පිට වනුයේ සිනහව නවත්වා ගැනීමට දරණ ප්‍රයත්නයක් වශයෙනි. සමහරු කොට්ටා වලට ගසති. තව සමහරු කොට්ටා උඩ දමා අල්ලති. සිනහව තද කර ගැනීමට බැරි අය කොට්ටා මුහුණට තද කර ගෙන සිටිති. මැඩම්ගේ කාමරයේ දොර බාගෙට වැසී තිබෙනු මඳ එළියෙන් පෙනේ. ඇයද සිසුවියන්ගේ මේ රැඟුම් නරඹන බව දැනී සමහරු ආතුරයන් සේ ඇඳන්වල වැතිරෙති. ටික වේලාවකින් මැඩම්ගේ කාමරයේ දොර වැසෙන හඬ ඇසුණි.

නින්දත් නොනින්දත් අතර පහන් විය. පුරුදු පරිදි අපි දේශන වලට සහභාගී වීමට යාමට සූදානම් වෙමින් සිටියෙමු. ශිෂ්‍ය නායිකාව හදිසියේ දුව ආවාය.

"විනීතා, රමණී, ලලනී, සුජාතා හතර දෙනාට මැඩම් එන්ඩලු"

අපි ඉක්මන් ගමනින් ඇගේ කාර්යාලයට ගියෙමු.

"අද ඉඳල සතියක් ඔයාලාට පංති තහනම් කරන්ඩ කියල ප්‍රින්සිපල් කිව්ව"

අපි මැඩම්ගේ මුහුණ දෙස බලා සිටියෙමු. ඇයද අප දෙස බලා සිටින්නීය. ඇය පසුව මෙසේ කීවාය.

"ඊයේ රෑ පාඩම් කරන වෙලාවෙ ඔයාල කසු කුසු ගගා හිටියේ ඔය හපන්කම කරල ඇවිත් නේද? හා දැන් යන්ඩ පුළුවන්"

අපි කාමරයෙන් පිට වූයෙමු.

"යන්ඩ පුළුවන්" මැඩම්ගේ වචන එම ස්වරයෙන්ම පැවසූ රමණී නැවතත් මෙසේ කීවාය.

"එයා කිව්වත් නැතත් අපට යන්ඩ පුළුවන් තමයි. මොකද අපේ කකුල් කැඩිලයැ. නේද බං" ඇය මා දෙස බලා සිනාසුනාය.

"ඔව් බං" යනුවෙන් මමද පැවසීමි.

අපි බෝඩිමට ගොස් ඇඳුම් මාරු කර අනිත් ළමයින් දේශන වලට සහභාගි වීමට යන සැටි බලා සිටියෙමු.

# අම්බර සීයා

'අම්බර' යන වචනය බොහෝ දෙනෙක් අසා නැතුවාට සැකයක් නැත. ඒවා ගැන අසා ඇත්තේ ටික දෙනෙකු විය හැක. අම්බර යනු ඉතා වටිනා දෙයක්ලු. ඒවා ඇත්තේ මුහුදු වෙරළේලු. ඒවා ලැබෙන්නේ වාසනාව තිබෙන අයට පමණක්ලු. සමහර අය ඒවා හමු වී ලොකු පොහොසතුන් වීලු. හරියට ලොතරැයි දිනුමක් ලැබුණා හා සමානලු. මේ අම්බර නම් වටිනා දෙය ලැබී පොහොසතුන් බවට පත් වූ අය ගැන කියන කථා කටකථාවල පමණක් අපි අසා ඇත්තෙමු.

නමුත් අපේ මේ කථාවේ සිටින අම්බර සීයා එවැනි පොහොසතෙකු නොවේ. ඔහු හිඟන්නෙකි. කුඩා ළමයින්ගේ ගජ මිතුරෙකි. ඔහු ඇති තැන ළමයින් කථා කරන්නේ සුදු සීයා කියාය. නැති තැන පමණක් අම්බර සීයා නමින් හඳුන්වනු ලැබේ. ඒ නම කියා කථා කළහොත් ඔහු ඉතාම දරුණු ලෙස බැණ වදී. දිනක් පාසැල හැරී ගෙදර යන අතර ලොකු ළමයි කට්ටියක් කිසිවක් නොදත් කුඩා ළමයකුට ඔහුව පෙන්වා "අම්බර සීයේ" කියා කෑගසන්ට උගන්වා පැන දිවූහ. එයින් කෝපාවිශ්ඨ වූ අම්බර සීයා අර කුඩා ළමයා අල්වාගෙන හොඳටම පහර ගසද්දී ඒ දුටු වැඩිහිටියන් විසින් ළමයාව බේරාගෙන ඇත. එවිටද අර පැන දිවූ ලොකු ළමයින් ඈත සිට "අම්බර සීයේ හූ ... හූ ..." කියා කෑගසන්ට වූයෙන් තවත් කෝපාවිශ්ඨ වූ අම්බර සීයා තමාගේ කඩමාලු පොදියත් එතනම දමා ඒ කොල්ලන් පසුපස දිව්වේලු. වේගයෙන් දිවූ ලොකු ළමයින් මඩ වගුරු සහිත අගලකින් එගොඩට පැන දිවූ අතර සීයාද මඩ වලෙන් එගොඩට පනින්ට ගොස් මඩේ එරී ඇත. ඒ අවස්ථාවේදී කොල්ලන් එගොඩ සිට නැවතත හූ කියන්ට වූයෙන් සීයා වරක් මඩේ ගිලී ඔලුව උස්සා මඩ තැවරී වෙස් මුහුණක් සේ විරූපි වූ මුහුණින් යුතුව ඉතාම පහත් කැත වචන වලින් බනින්ට පටන් ගෙන ඇත. එවර එතැනට රැස් වූ වැඩිහිටියෝ කොල්ලන්ට බැණ වැදී පලවා හැර බොහෝ අමාරුවෙන් සීයාව ගොඩට ගත්හ. සීයා වටා ගෙතී ඇති මේ කථා ඇසුරෙන් කොලු ගැටව් නොයෙකුත් සරදම් වචන යොදාගෙන සීයාව දුටු තැන කෝප කරවති. මේ එවැනි වදන් වලින් සමහරකි.

"හලෝ අම්බර සීයේ"

"මඩ වලක් එහෙම දැක්කෙ නැද්ද සීයේ"

"සීයේ මඩ නාමුද"

මේ ආදි වචන වලින් කොයි එකක් වුවත් ඔහුගේ සවනට යොමු වුවහොත් ඔහුගේ කටින් පිට වන තිත්ත කුණු කතා ඉතාම පිළිකුල් සහගතය. ඒ නිසා සමහර දෙමව්පියෝ ලමයින්ට ඒවා කීමට ඉඩ නොදෙති. කුඩා ලමයිද සීයාට ඇති බය නිසා ඒ වචන නොකියති. සීයාව වඩාත් ප්‍රකෝප කරවන්නේ ලොකු ලමයින්ය.

කුඩා ලමයින්ට සීයා ආදරේය. බොහෝ කුඩා ලමයි සීයාටද ආදරය දක්වති. කුඩා ලමයින් ඔහු අමතනුයේ සුදු සීයා කියාය. පාසැල ඇරෙන වේලාවට ගේට්ටුව අසල තිබෙන කොට්ටන් ගහ යට හෙවනේ ඔහු වාඩි වී සිටිනුයේ කුඩා ලමයින් එන තුරුය. එකල අප ඉගෙනීම ලැබුවේ පස්වන ශ්‍රේණියේය. අපේ පංතියේ ලමයින් සමග සීයා ඉතාම කුලුපගය. පාසැල අවසන් වූ සැනින් අපි එතැනට දුව යමු. එවිට බුලත් කහට බැඳී ඇති දත් කැබලි ටික පෙනෙන සේ ඔහු අප සමග සිනාසෙයි. පසුව උරය කරේ එල්වාගෙන හැරමිටිය බිමට ඇන නැගිටියි.

"සුදු සීයේ මෙන්න සුදු සීයට බිස්කට්"

"පුංචි මහත්තයලට පිං සිද්ද වෙන්ඩ ඕනැ" පවසන ඔහු බිස්කට් සියල්ලම වෙන උරයක දමා ගනී. "පුංචි මහත්තයලට මමත් තැග්ගක් ගෙනාව"

"මොනවද සුදු සීයේ"

"වෙරළු"

"ඒ කොහෙන්ද සුදු සීයට වෙරළු"

"වලව්වේ හාමුලගේ ලන්දට ගිය වෙලාවේ වලව්වේ හාමු මට ඇහිඳ ගන්ඩ කිව්ව"

"ඉතින් සුදු සීයට මේව විකුණ ගන්ඩ තිබුණනේ"

"අනේ පුංචි මහත්තයො මට පුංචි මහත්තයලව මතක් උනා. මට හැමදාම විස්කෝත්තුත් දෙනවනේ"

"ඒ උනාට මොකද. අර වෙරළු අච්චාරු විකුණන අම්මට දුන්න නම් සීයට කීයක් හරි හොයා ගන්ඩ තිබුණා"

"අපොයි බැ. මං ගෙනාවෙ පුංචි මහත්තයලට දෙන්ඩමයි. ඕව ටික පුංචි මහත්තයල බෙදා ගන්ඩ"

මම ඒවා භාරගෙන බෙදුවෙමි. සුදු සීයාගේ හපුටු ජරා උරය තුළ තිබුණු නිසා ඒවා කැමට අප්‍රිය ගතියක් දැනුණි. ඒ නිසා මගේ කොටස මම අතේ තියා ගතිමි.

"ඇයි පුංචි මහත්තය කන්නේ නැද්ද" සීයා ඇසීය.

"මං ගෙදර ගිහින් බත් කාලම කන්නම්කො සීයේ" මා එසේ කීවේ බොරුවටය.

පන්සල ලඟින් යන විට පොඩි සාදු සැමදාම පාර අයිනට වඩියි. "ආ සුදු සීයේ" කියා පොඩි සාදුත් සීයාට කථා කරයි. එවිට සීයා "තෙරුවණ් සරණයි" කියා පොඩි සාදුට වදී.

ගෙදර ගිය පසු මම සුදු සීයා වෙරළු දුන් බව අම්මාට කීවෙමි. අම්මාගේ මුහුණේ ඇති වූයේ තරහවකි.

"ඉතින් උඹ කැවද?" අම්මා සැරෙන් ඇසුවාය.

"නෑ අම්මේ. අතේ තියාගෙන ඇවිල්ල ගේට්ටුව ලඟදි විසි කෙරුව"

"මොකටද අතටවත් ගත්තෙ. ඒ මිනිහගෙ කකුලෙ තියෙන තුවාලේ උඹ දැකලවත් නැද්ද?"

"එහෙම කියන්ඩ එපා අම්මේ. පව්"

"පව්" යනුවෙන් එයම ප්‍රතිරාවය කළ අම්මා මගේ අතට සබන් පෙට්ටිය දී ළිඳ ලඟට ගොස් හොඳට මුහුණ හා අත් සෝදාගෙන එන ලෙස අණ කළාය. ඉන්පසු මට බත් බෙදා දුන් අම්මා තාත්තා සමග සුදු සීයා ගැන කරන කථාවට මම සවන් දුනිමි.

"මේ ඇහුණද. අර හිඟන මිනිහට සමහරු අම්බර සීයා කියන්නේ ඇයි?"

"ඒක හරි ලස්සන කතාවක්නෙ. ඇයි මැණිකෙ ඒක අහල නැද්ද?"

"නෑ නේන්නම්"

"ඔය මිනිහ උන්දැගේ මායියත් එක්ක ඉස්සර ඉඳල තියෙන්නෙ මුහුද අයිනෙ හාමු මහත්තයට අයිති ඉඩමක"

"ඉතින්"

"ඉතින් ඒ කාලෙ මිනිහ හැමදාම පාන්දර නැගිටල වෙරළ දිගේ ඇවිදගෙන ගිහින් දර ලෑලි වාගෙ දේවල් ඇහිඳගෙන එනවලු. දවසක් මිනිහට අම්බර කියන ජාතිය හම්බවෙලා ඒවත් උස්සගෙන ගෙදර ආවලු. ඇවිත් මායියට කිව්වලු මට අම්බර වගයක් හම්බ උනා උඹ එහෙම කාටවත් කියන්ඩ එපා මං ටවුමට ගිහිං හොරෙන්ම විකුණගෙන එන්නම් කියල"

"ඒ කතාව ඇත්තද"

"ඉන්ඩකො මැණිකෙ කියනකම්"

"මිනිහ ඒව ඔතාගෙන ටවුමෙ සාප්පුවකට ගිහිං මුදලාලිගෙන් අහල තියෙනෙව අම්බර වගයක් ගෙනාව ගන්නවද කියල. මුදලාලි අරගෙන බලල නාහෙ අතින් අල්ලගෙන කිව්වලු පලයං මිනිහෝ මේ මොන ජරාවක්ද ඕව අම්බර නෙමේ වර්චස් ජාතියක් පලයං පලයං කියල එලව ගත්තලු"

ඒ වෙලාවෙ අම්ම බත් කකා උන්නේ. එක පාරටම අම්මට ආව හිනාව නවත්ත ගන්ඩ බැරුව කෑමත් ඉස්මොලේ ගිහින් තාත්තා ඉක්මනට නැගිටල පිටට තට්ටු කරල වතුර එක ලඟට දුන්න. මටත් මැරෙන්ඩ හිනා.

"ඉතින් ඒව අම්බර නෙමේලුද?" අම්ම ආයෙත් අහනව.

"නෑ මැණිකෙ. මොනවද ජරාවක්"

"ඉතින් ඔය කතාව ගමේ කොල්ලො දන්නෙ කොහොමද"

"මිනිහ කාටවත් කියන්ඩ එපා කිව්වට මායිය උන්ද ගිහින් එන්ඩත් ඉස්සෙල්ලම හැමෝටම කියල. ඊට පස්සේ මුදලාලි එලව ගත්තු හැටිත් හැමෝටම කියල. ඉතින් ගම පුරාම ඔක ආරංචි උනා. දැන් ඔය අම්බර සීය කිව්වට ඉස්සර කොල්ලො ඔයිට වැඩිය දේවල් කිව්ව. සමහරු නහය අල්ලගෙන හුහ් හුහ් වර්චස් කියල කියනව. සමහරු පලයං මිනිහො වර්චස් ගොඩත් අරං කියල කෑගහනව. ඉතින් ඒ කාලේ ඕව අහගෙන කෑගගහ බැණ බැණ ගෙදර ගිහින් මායියට අල්ලන් ගහනව"

"දැන් කෝ තාත්තේ ඒ මායිය"

"උන්ද ඒ කාලෙම නරක මැලේරියාවක් හැදිල මැරුණා. එයින් පස්සේ මුන්දෑ තනි උනා. ඊට පස්සේ ඉතින් ඔහේ ඇවිද ඇවිද හිහා කකා නාකි වෙන තුරුම ඇවිදින එක තමයි කෙරුවේ"

පසුදා මම පාසැල් ගියෙමි. එහෙත් තාත්තා අම්බර සීයා ගැන කිවූ කතාව කාටවත් නොකීවෙමි. ඒ සුදු සීයා ගැන මට ඇති වූ දුක නිසාය. එදා පාසැල ඇරී අපි පුරුදු පරිදි ගේට්ටුව දෙසට ආවෙමු. සුදු සීයා පෙනෙන්ට නැත. අපි හැම පැත්තම බැලුවෙමු.

"නිමල් අද සුදු සීයා කෝ බං"

"ඒක තමයි මමත් බැලුවේ"

"අනේ අද බිස්කට් දෙන්නේ කොහොමද?"

“යමුකො මගදි හම්බ උනොත් දෙමු”

පාරේ ටික දුරක් යන විට සෙනග පිරී සිටිනු දක්නට ලැබුනි. අපි ඉක්මනින් එතැනට දිව්වෙමු. කුමක් හෝ කලබලකාරී සිද්ධියක් සිදු වී අවසන් වී ඇති බව සෙනග අතරින් ඇසෙන වචන වලින් හැඟේ.

“නැහැදිච්ච කොල්ලො”

“නෑ ඕකුන්ගේ දෙමව්පියන්ගේ වැරැද්ද”

“ඔව්. අසරණයින්ට විහිලු කරන්ඩ එපා කියල දරුවන්ට කියා දෙන කෙනෙක් නැනේ. තවත් ඒවට රුකුල් දෙනව මිසක්”

“පව් දෙයියනේ අහිංසකය”

“ඔය ඉස්කෝලෙ ලඟට යන්ඩයි ගිහිං තියෙන්නේ. හැමදාම ලමයි විස්කෝතු දෙනවලුනේ”

අපට ඉවසුම් නැති විය. අපි ඒ අයගෙන් විස්තර ඇසුවෙමු. එතන සිටි අක්කා කෙනෙක් අපට විස්තරය කීවාය.

“අර අම්බර සීයා කියන්නේ”

“ඔව් ඔව් ඉතින්”

“මේ හරියෙදි පාරෙ අනිත් පැත්තෙන් ගිය ලොකු කොල්ලො දෙන්නෙක් උන්දැගෙන් ඇහැව්වලු බැග් උරේ මොනවද අම්බරද කියල”

“අනේ පව්”

“ඉතින් උන්දැට තරහ ගිහින් තිත්ත කතා වැලක් කියාගෙන උන්ට ගහන්ඩ පාරෙ අනිත් පැත්තට පනින කොටම කාර් එකක හැප්පුනා”

“අයියෝ! මැරුණද ඉතින්”

“නෑ. හොඳටම අමාරුයි. පස්සේ ඒ කාර් එකේ ආපු මහත්තය බැහැල මිනිස්සුන්වත් උදව් කරගෙන ඒ කාර් එකෙන්ම ඉස්පිරිතාලෙට ගෙනිච්ච”

“අයියෝ” අපි කම්පා වීමු.

“ඔය කාර් එකට අහු වෙලා පොඩි වෙලා තියෙන්නේ උන්දැගේ උරේ තිබුණු වෙරළු ගෙඩිත් එක්කම”

අපි මුහුණට මුහුණ බලා ගත්තෙමු. මට දැනුනේ උගුරේ වෙරළු ගෙඩියක් හිර

වෙනවා වගේය.

"අපි යමුද හැන්දෑවට ඉස්පිරිතාලෙ පැත්තේ" නිමල් ඇසීය.

"අපිට ගෙවල් වලින් නම් යන්න දෙන එකක් නැහැ" මම කීවෙමි.

"ඒකත් ඇත්ත. ඒක හින්ද අපි යමුද දැන්මම" සරත් යෝජනා කළේය.

"අන්න හොඳයි. වැඩිය දුරකුත් නැහැනේ"

අපි හැමදෙනාම ඒ අදහස අනුමත කළෙමු. අපි පයින්ම රෝහල ළඟට ගියෙමු. ගේට්ටුව වසා ඇත. මුරකරු අප දෙස බැලීය.

"අනේ අංකල් අර හිහන සීය කෙනෙක්ව ගෙනාවලු නේද කාර් එකක හැප්පිලා"

"ඔව් ඉතින්"

"අනේ අංකල් අපිට එයාව බලන්ඩ බැරිද"

"මේ වෙලාවේ යන්ඩ දෙන්ඩ බෑ. මටත් බැනුම් අහන්ඩ වෙයි"

"අනේ අංකල් ඒ සීයා අපිත් එක්ක හරි යාලුයි. අනේ පව් අංකල්"

අප එසේ කියන අතර සරත් රුපියල් දෙකේ කාසි දෙකක් ඔහු අත තැබීය.

"මෙච්චර ලමයි ගොඩකට යන්ඩ දෙන්ඩ බෑ. ඕනැනම් දෙන්නෙක් එන්ඩ" යයි කරුණා සහගත මුහුණින් පැවසූ ඔහු මාත් සරතුත් ඇතුළට වූ පසු ගේට්ටුව වැසීය. ඉන්පසු ඔහු අප දෙදෙනා කැඳවාගෙන ඇතුලට ගියේය. මා කිසි දිනක රෝහලක් ඇතුළට ගොස් නැත. ටිකෙන් ටික ඇතුළට යන විට දැනෙන බෙහෙත් ගඳ නිසා මට අපහසු ගතියක් දැනේ. ඉස්තෝප්පු වලින් හැරි හැරී ටික දුරක් යන විට මට බෙහෙත් ගඳ ඉවසීමට බැරි තරම් විය. වමනය දමයිදෝ කියා මට සැකයක්ද ඇති විය. මෙහි කොපමණ ලෙඩුන් සිටියත් වැඩි ශබ්දයක් නැත. ගොලුවන් සේ නිදා සිටින ඔවුන්ගෙන් ඉඳහිට කෙනෙක් කෙඳිරි ගාන හඬ පමණක් ඇසේ. සුදුම සුදු හැඳගත් නර්ස් නෝනලා දෙන්නෙක් ඉදිරියට එති. ඒ අක්කලා හරිම ලස්සනයි. එක්කෙනෙක් හරියටම සරත්ගේ අක්කා වගේය. අප ලං වන විට මුරකරු දෙස බැලූ එක් නෝනා කෙනෙක් මෙසේ ඇසුවාය.

"මොකද සිරිදාස මේ ලමයි දෙන්නෙකුත් එක්ක"

"මිසී මේ ගොල්ලන්ට බලන්ඩ ඕනැලු අර ඇක්සිඩන්ට් වෙලා ගෙනාපු හිහන මනුස්සයව. එයා මේ ගොල්ලන්ගේ යාලුවෙක්ලු"

මිසීලා දෙදෙනාම අප දෙස බලා සිනාසුනහ.

“ඔයාලා එක්ක ගොඩක් යාලුද ඒ සීයා” එක මිසී කෙනෙක් ඇසුවාය.

“ඔව් අපි එක්ක හරි යාලුයි. ඉස්කෝලෙ ඇරෙන කොටම ඒ සීයා එනව අපිව හම්බ වෙන්ඩ. අනේ එයාට හුහක් අමාරුද මිසී” මම ඇසුවෙමි.

“ඔයාලා යන්ඩ. දැන් වැඩක් නැහැ”

“ඇයි මිනිහ මැරුනද” කියා මුරකරු ඇසීය.

“ඔව් සිරිදාස. වාට්ටුවට ගන්න කොටම මැරුණා. ඔය ලමයි දෙන්නව ඉක්මනට අරින්ඩ. දැන් ඩොක්ට එන වෙලාව ලඟයි”

“අයියෝ සරත්” කියා මම සරත්ගේ අතින් අල්ලා ගතිමි.

“දැන් ඉතින් ආපහු යමු නේද” කියා මුරකරු ඇසීය. අපිත් ඔහු අනුගමනය කරමින් ආපසු හැරුනෙමු.

අපි පාරට ආවෙමු. සිදු වී ඇති දෙය මිතුරන්ට කීවෙමු. සැමදෙනාගේම ඇස් ලොකු විය. “අනේ සුදු සීය. පව් නේද” කෙනෙකු කියනු ඇසුණි. ඉන්පසු හැමෝම නිහඬ වූහ. අවමඟුල් පෙරහැරක ගමන් කරන්නාක් මෙන් අපි නිහඬව බිම බලාගෙන ආපසු ආවෙමු. පාරේ වාඩි වී හිඟමන් ඉල්ලමින් සිටි හිඟන්නෙකුට අපි සුදු සීයාට දීමට ගෙනා බිස්කට් ටික දුන්නෙමු.

# A note from the publisher

I want to express my special thanks to the following people for placing their wonderful software on public domain for free use. Without them, I wouldn't have been able to produce this electronic version of the book.

Prasad Dharmasena (samanala transliteration scheme)
Yannis Haralambous (Sinhala METAFONT fonts and indica preprocessor)
Donald Knuth (TEX)
Leslie Lamport (LATEX)
Hàn Thế Thành (pdfTEX)

If you would like to comment on this book, please write to vsaparam@hotmail.com.

Vasantha Saparamadu